ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපළ මාර්ගෝපදේශ මාලාව | අංක : 4









# නිර්මාණශීලී ඔබට ප්‍රතිරූපන ආරක්ෂණය

## සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා කාර්මික සැලසුම් ආරක්ෂණය පිළිබඳ හැඳින්වීමක්

WIPO
WORLD
INTELLECTUAL PROPERTY
ORGANIZATION

# හැඳින්වීම

මෙම ග්‍රන්ථය ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල සඳහා වන මාර්ගෝපදේශ ග්‍රන්ථ පෙළක හතරවැන්නයි. මෙය ව්‍යාපාරයන්හි කළමණාකරුවන්ට සහ ව්‍යවසායකයන්ට ප්‍රතිරූපන අයිතිය සහ ඊට සම්බන්ධිත හිමිකම (Related rights) පිළබඳ හැඳින්වීමක් සපයයි. මෙම ග්‍රන්ථය මගින් ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීති ව්‍යාපාරයන්හි විවිධ පාර්ශවයන්ට බලපාන අයුරු ලිහිල් බසින් පැහැදිලි කරනු ලබයි.

බොහෝ විට ව්‍යාපාර ආයතන ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් මත පදනම් වූ මුද්‍රණ කටයුතු, ප්‍රකාශන කටයුතු, සංගීතය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ (චිත්‍රපට සහ රූපවාහිනි) වෙළඳ ප්‍රචාරන කටයුතු, දෘශ්‍ය සහ ඉදිරිපත් කිරීම් (Performance) සැළසුම් සහ විලාසිතා සහ ගුවන් විරුලි විකාශන ආදි කටයුතු වල යෙදේ. පසුගිය දශක දෙක මුළුල්ලේ මෘදුකාංග, බහුවිධ මාධ්‍ය සහ සංඛ්‍යාංක අන්තර්ගතයන් මත රඳා පවතින සියලු කර්මාන්තයන් අන්තර්ජාලයේ පැවතියත් නැතත් ඵලදායී ලෙස ප්‍රතිරූපන අයිතිය සුරැකීම පිළිබඳ විශ්වාසය තබා ඇත්තේ විශේෂයෙන්ම ඩිජිටල් අලෙවිකරණයේ සහ විනෝදාශ්වාදය සපයන ආයතනවල ඇතිවේමින් පවතින විප්ලවීය වෙනස නිසාය. මෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ව්‍යාපාර හිමිකරුවන් සහ සේවකයින් ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් මගින් ආරක්‍ෂා කල දෑ නිපදවීමට සහ භාවිතා කිරීමට පෙළඹී සිටිති.

මෙම මාර්ගෝපදේශ ග්‍රන්ථය මගින් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපර වලට පහත කරුණු සඳහා අත්වැලක් සපයයි.

– එම ව්‍යාපාරයන් සතු හිමිකම් මොනවාද යන්න සහ ඔවුන්ගේ නිර්මාණයන් ආරක්‍ෂා කරන්නේ කෙසේ දැයි වටහා ගැනීමට
– ඔවුන්ගේ ප්‍රතිරූපන අයිතිය සහ / හෝ සම්බන්ධිත හිමිකම්වලින් උපරිම ප්‍රයෝජන ලැබීමට
– අන්‍යයන්ගේ ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් උල්ලංඝනයෙන් වැලකීමට

දේශීය ආයතන සහ දේශීය පාර්ශවයන්ගේ සහයෝගයෙන් මෙම ග්‍රන්ථයේ දේශියත්වයට අනුකූලව සැකසූ පිටපත් සම්පාදනය කර ගත හැකි අතර එසේ අවශ්‍ය ආකාරයට ග්‍රන්ථය සම්පාදනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය නොමිලේ අප වෙතින් ලබා ගත හැකිය.

## ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල මාර්ගෝපදේශ මාලාව

1. "ඔබටත් ලකුණක්" - වෙළඳ ලකුණු ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා වෙළඳ ලකුණු පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 900 වැනි ප්‍රකාශනය)

2. "හොඳ පෙනුමක්" - කාර්මික සැලසුම් ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා කාර්මික සැලසුම් පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 498 වැනි ප්‍රකාශනය)

3. "සුරක්ෂිත අනාගතයක්" - පේටන්ට් ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා පේ්‍රටනට් බලපත්‍ර පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 917 වැනි ප්‍රකාශනය)

4. "නිර්මාණශීලී ඔබට ප්‍රතිරූපන ආරක්ෂණය": සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා ප්‍රතිරූපන අයිතිය පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 918 වැනි ප්‍රකාශනය)

ඉහත සියුළු ප්‍රකාශන පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැක:
*www.wipo.int/ebookshop*

**වියාචනය:** මෙම පොතෙහි අඩංගු තොරතුරු වෘත්තිය නීති උපදෙස් සඳහා ආදේශකයක් නොවන බව සැලකිය යුතුය. මෙහි අඩංගු වන්නේ විෂයය පිළිබඳ මූලික තොරතුරු පමණි.

මෙම ප්‍රකාශනය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානයේ (WIPO) පූර්ව අනුමැතිය සහිතව පරිවර්තනය කර ප්‍රතිසම්පාදනය කරන ලදි. මෙහි මුල් ඉංග්‍රීසි අනුවාදයේ ප්‍රතිරූපන අයිතිය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) සතු වන අතර එම ප්‍රකාශනය www.wipo.int/sme/en/documents/guides/ වෙබ් අඩවියෙහි දක්වා ඇත. පරිවර්තනය කරන ලද පොතෙහි අඩංගු තොරතුරු වල නිවරැදි භාවය පිළිබඳව පූර්ණ වගකීම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය (Project SMED) සතු වන අතර ඒ පිළිබඳව බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානයේ වගකීමක් නොමැති බව සැලකිය යුතුය.

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය (ප්‍රතිරූපන අයිතිය 2010) ඉංග්‍රීසි අනුවාදයේ ප්‍රතිරූපන අයිතිය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) (ප්‍රතිරූපන අයිතිය 2006)
මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ විද්‍යුත් මඟින් හෝ යාන්ත්‍රික මාර්ගයකින් හෝ වෙනත් කිසිම අයුරකින් ප්‍රතිසම්පාදනය කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ බෙදා හැරීම හිමි සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතියේ (Project SMED) පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය.

# පටුන

පිටුව


1. ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් යනු කුමක්ද? 3

2. ආරක්‍ෂිත කාල සීමාව සහ විෂය පථය 8

3. නවමු නිර්මාණ ආරක්පා කිරීම 24

4. ප්‍රතිරූපන අයිතියේ හිමිකාරීත්වය 31

5. ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් වල ප්‍රතිලාභ 35

6. වෙනත් පාර්ශව වලට හිමි නිර්මාණ භාවිතා කිරීම 44

7. ප්‍රතිරූපන අයිතිය බල ගැන්වීම 52


www.wipo.int/sme/

# 1. ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් යනු කුමක්ද?

## ප්‍රතිරූපන අයිතිය (Copy Right) යනු කුමක්ද?

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින් ග්‍රන්ථ කතුවරුන්ට, රචකයින්ට, පරිගණක ප්‍රකමන නිර්මාණ ශිල්පීන්ට, වෙබ් අඩවි නිර්මාණකරුවන්ට සහ වෙනත් නිර්මාණ කරුවන්ට ඔවුන්ගේ නිර්මාණ ලෙස සාමාන්‍යයෙන් හඳුන්වන සාහිත්‍ය, චිත්‍ර, නාට්‍යමය සහ වෙනත් ආකාරවල නිර්මාණ කෘති සඳහා නීතිමය ආරක්ෂාවක් සපයනු ලැබේ.

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින්, පොත්, සඟරා, පුවත්පත්, සංගිත නිර්මාණ, චිත්‍ර, ඡායාරූප, මූර්ති, ගෘහ නිර්මාණ, චිත්‍රපටි, පරිගණක වැඩසටහන්, වීඩියෝ ක්‍රීඩා සහ දත්ත සමුදායන් වැනි විශාල පරාසයක නිර්මාණ වල මුල් කෘතීන්ට ආරක්ෂාව සපයයි.

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින් යම් නිර්මාණයක නිර්මාපකයාට ඔහුගේ නිර්මාණ සඳහා සීමාසහිත වූ නමුත් දීර්ඝ කාලයක් සඳහා **විවිධාකාරවූත් පරමවූත්** හිමිකම් ගොන්නක් සපයනු ලබයි. මෙම හිමිකම් මගින් කතෘ වෙත තම නිර්මාණයේ **ආර්ථකමය භාවිතා පාලනය** සඳහා ක්‍රම ගණනාවක් සපයනු ලබන අතර කෘතිය සඳහා වන ගෙවීම් ලැබීමට ඉඩ සලසයි. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින් කිසියම් නිර්මාපකයකුගේ කීර්තිමත් නාමය සුරකින අන්දමේ **සදාචාරමය හිමිකම්ද** සුරැකේ.





නඩත්තු අත්පොත් හා ඉදිරිපත් කිරීම් ප්‍රතිපාදන අයිතිය යටතේ ආරක්පා කළ හැකිය.

### ප්‍රතිරූපන අයිතිය සහ ව්‍යාපාර

බොහෝ සමාගම් වල ඔවුන්ගේ ව්‍යාපාර වල සමහර අංශ ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂා කොට ඇත. උදා :- පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග, වෙඩ් අඩවිවල අන්තර්ගතය, නිප්පාදනය පිළිබඳ නාමාවලි, පුවත් ලිපි, උපදෙස් පත්‍රිකා හෝ පාරිභෝගික ද්‍රව්‍ය යන්ත්‍ර, සූත්‍ර ක්‍රියාකරවීම, සම්බන්ද අත්පොත් විවිධාකාර උපකරණ සම්බන්ධයෙන් වූ භාවිතා, අථත්වැඩියා සහ නඩත්තු පිළිබඳ අත්පොත්, විවිධ නිප්පාදන සඳහා වූ විස්තර පත්‍රකා වල අක්පර, චිත්‍ර, ලේබල හෝ ඇසුරුම්, පුවත්පත් වල දැන්වීම්, දැන්වීම් පුවරු, වෙබ් අඩිවි වල ඇති අලෙවිකරණ හා වෙළඳ ප්‍රචාරක පත්‍රිකා ආදිය දැක්විය හැකිය. බොහෝ රට වල ප්‍රතිරූපන අයිතිය මගින් නිප්පාදන සඳහා වූ දළ සටහන් චිත්‍ර හෝ සැළසුම් ආදිය ආරක්ෂා කරයි.

## සම්බන්ධිත හිමිකම් (Related Rights) යනු කුමක්ද ?

ගීත, නර්තන ආදිය ඉදිරිපත් කරන්නන්, ශබ්ද වාහිනී නිපදවන්නන් සහ ගුවන් විදුලි වැඩසටහන් ප්‍රචාරය කරන්නන් වැනි පුද්ගලයන් සඳහා වූ හිමිකම් සම්බන්ධිත හිමිකම් ලෙස හැඳින්වේ.

එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වැනි සමහර රටවල මෙම හිමිකම් ද ප්‍රතිරූපන අයිතිය යටතේම නීති ගත කොට ඇත. ජර්මනිය සහ ප්‍රංශය වැනි අනෙකුත් රටවල් මෙම හිමිකම් "Neighbouring rights" නම් වූ වෙනත් ප්‍රභේදයක් යටතේ ආරක්ෂා කර ඇත.

සම්බන්ධිත හිමිකම් කොටස් තුනකට බෙදේ.

- ගීත, නර්තන ආදිය ඉදිරිපත් කරන්නන් සඳහා ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් සඳහා වූ හිමිකම් (උදා:- නළුවන් සහ සංගීතඥයින්) මෙයට පැරණි නාට්‍යමය හෝ සංගීතමය කෘතියක සජීවී ඉදිරිපත් කිරීමක් හෝ පැරණි සාහිත්‍යමය කෘතියක සජීවී කියවීමක් වැනි දේ අයත් වේ. මෙම ඉදිරිපත් කිරීම් පූර්ව වශයෙන් කිනම් හෝ මාධ්‍යයක සටහන් කර තැබීම, පොදු ජන ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තැබීම හෝ ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්‍ෂා කර තිබීම අවශ්‍ය නොවේ. තවද මෙම ඉදිරිපත් කිරීම් නවතම නිර්මාණයක් හෝ පැරණි නිර්මාණයක් මත පදනම්ව සකසා ගත් ඒවා හෝ විය හැකිය.
- ශබ්ද වාහිනී තැටි නිෂ්පාදකයන්ට ඔවුන්ගේ පටිගත කිරීම් සඳහා වූ හිමිකම් (උදා :- සංයුක්ත ගීත තැටි)
- ගුවන්විදුලි සම්ප්‍රේෂණ ආයතන සඳහා ඔවුන්ගේ රේඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් සම්ප්‍රේෂණය සඳහාද සමහර රටවල කේබල් පද්ධතියක් මගින් නිර්මාණ සම්ප්‍රේෂණය සඳහාද වන හිමිකම්.

ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් විවිධ අංශයන්හි හිමිකම් වලට අයිතිය දරන්නන්ගේ කෘතීන් සඳහා ආරක්‍ෂාව සපයයි. ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් ප්‍රදානය කරනු ලබන්නේ ප්‍රතිරූපන අයිතිය මගින් සුරක්‍ෂිත හෝ සුරක්‍ෂිත නොවන මෙම නිර්මාණ ජනතාව අතරට ගෙනයාමට, සන්නිවේදනයට සහ ඉදිරිපත් කිරීමට වැදගත් කාර්යයක් ඉටු කරන විවිධ අංශවලට අයත් පුද්ගලයින්ට සහ ව්‍යාපාර වලටය.

**උදාහරණය :**

ගීතයක් සලකා බැලූ විට ප්‍රතිරූපන අයිතිය මගින් සංගීත නිර්මාපකයාගේ සංගීත නිර්මාණය සහ පද රචකයාගේ පද මාලාව සුරක්‍ෂිත අතර සම්බන්ධිත හිමිකම් පහත ඒවා සඳහා යෙදේ.

- ගීතය ඉදිරිපත්කරන ගායකයන් ගේ සහ වාදකයන්ගේ ඉදිරිපත් කිරීම්.
- ගීත සහිතව තැටිගත කරන්නන්
- නිෂ්පාදකයාගේ ආදළ ගීතය අඩංගු වැඩසටහන නිෂ්පාදනය කරන සහ විකාශය කරන ආයතනය මගින් ප්‍රචාරය කරන වැඩසටහන.









## ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් ඔබේ ව්‍යාපාරයට අදාල වන්නේ කෙසේද?

ප්‍රතිරූපන අයිතිය මගින් කිසියම් සේවාවක් හෝ නිෂ්පාදනයක ඇති සාහිත්‍යමය, සෞන්දර්යාත්මක, නාට්‍යමය හෝ වෙනත් ආකාරයක නිර්මාණාත්මක අංග සුරකින අතර එමගින් ප්‍රතිරූපන අයිතිය දරන්නාට එම මුල් නිර්මාණ අන්‍යයන් විසින් භාවිතා කිරීම වළක්වාලීමට හැකියාව ලබා දෙයි. ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් මගින් ව්‍යාපාරයට වාසි රැසක් හිමිකර ගත හැකිය.

- **මුල් නිර්මාණ වාණිජමය ලෙස උපයෝජනය පාලනය කිරීම:** පොත්, සංගීත නිර්මාණ, චිත්‍රපට, පරිගණක ප්‍රකමන, දත්ත සමුදායන්හි මුල් පිටපත්, වෙළඳ දැන්වීම්, වෙබ් අඩවි වල අඩංගු දෑ, වීඩියෝ ක්‍රීඩා, පටිගත කල ශබ්ද, රේඩියෝ, රූපවාහිනී වැඩසටහන් හෝ වෙනත් ඕනෑම නිර්මාණාත්මක කාර්යයන් මෙයට අයත් වේ. ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් මගින් ආරක්පිත නිර්මාණ නීතිමය හිමිකරුගේ පූර්ව අවසරයකින් තොරව පිටපත් කිරීම සහ වාණිජමය උපයෝජනය කල නොහැකිය. ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් මගින් ආරක්පිත නිර්මාණ සඳහා පවතින විශේපිත බව වෙළඳපලෙහි නිසි තරගකාරිත්වයක් පවත්වා ගැනීමට ව්‍යාපාරයනට ඉවහල් වේ.

- **අදායම් ඉපයීම** :දේපලක හිමිකරුවෙකු මෙන්ම ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් දරන්නෙකුට එම හිමිකම භාවිතා කිරීමට, විකිණීමට හෝ තෑගි දීමටත් උරුමයක් ලෙස පවරා දීමටත් හැකිය. ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් වාණිජමය වශයෙන් යොදා ගත හැකි ආකාර කිහිපයක් ඇත. එනම් ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් මගින් ආරක්පිත නිර්මාණවල පිටපත් සාදා අලෙවි කිරීම (උදා:- ඡායාරූපයක පිටපත්). ඔබගේ ප්‍රතිරූපන අයිතිය වෙනත් පුද්ගලයෙකුට හෝ සමාගමකට විකිණීම, දෙපාර්ශ්වය එකග වූ කරුණු මත මුදලින් ගෙවීමක් මත ප්‍රතිරූපන අයිතිය වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භාවිතා කිරීමට අවසර දීම යනුවෙනි. මෙය බලපත්‍රයක් ලබා දීම මගින් කරුනු ලබයි.

(පිටුව 36 බලන්න)

- **අරමුදල් සම්පාදනය කර ගැනීම:** ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් වත්කම් ලෙස අයත් ආයතන වලට එම හිමිකම් භාවිතා කොට මූල්‍යමය ආයතන වලින් ණය මුදල් ලබාගත හැකිය. එහිදී එම හිමිකම ආයෝජකයන් සහ ණය දෙන්නන් ඔවුන්ගේ මුදල් සඳහා ආරක්පණයක් ලෙස සලකනු ලබයි.

- **හිමිකම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව පියවර ගැනීම:** ප්‍රතිරූපන අයිතිය මගින් හිමිකම් දරන්නාගේ සුවිශේප අයිතිවාසිකම් උල්ලංඝනය කරන ඕනෑම අයෙක්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ඉඩ සලසා දෙයි. මෙහිදී මූල්‍යමය සහන ලබාගැනීම කෘතීන් අපහරණය වැළැක්වීම හා නෛතික කටයුතු සඳහා වැය වූ මුදල් ආපසු අයකර ගැනීම ආදිය කල හැකිය. සමහර රටවල ප්‍රතිරූපන අයිතිය අභිප්‍රායිකව උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අපරාධ නීතියට අදාල දඬුවම් ලබාදීම කරනු ලබයි.

- **අන්‍යයන්ට අයත් නිර්මාණ භාවිතා කිරීම:** වෙනත් අයට අයත් ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් මගින් ආරක්පිත

නිර්මාණ වාණිජමය අරමුණු සඳහා භාවිතා කිරීම නිසා ඔබගේ ව්‍යාපාරයේ අගය සහ කාර්යක්ෂමතාවය ද එහි වෙළඳ අගයද වැඩි විය හැක. උදාහරණ වශයෙන් අවන්හලක, බීම හලක, සිල්ලර කඩයක හෝ ගුවන් යානයක සංගීත නිර්මාණයක් වාදනය කිරීම මගින් එම ආයතනයට පැමිණෙන පාරිභෝගිකයාට අමතර තෘප්තිමත් භාවයක් අත්කර දේ. බොහෝ රට වල මෙවැනි ආකාරයේ සංගීත නිර්මාණ භාවිතා කිරීම සඳහා එහි ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් දරන්නන්ගෙන් බලපත්‍රයක් මගින් නිශ්චිත කාර්යය සඳහා එම සංගීතය භාවිතා කිරීමට පූර්ව අවසරයක් ලබා ගත යුතුය. ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මගින් කුමන අවස්ථාවක කෙසේ අවසර ලබාගැනීම කල යුතුද යන්න පිළිබඳව ඔබ දැනුවත් වේ.

අධික ලෙස කාලය වැය වන ආරවුල් සහ අධික වියදම් දැරීමට සිදුවන නෛතික ක්‍රියා මාර්ග ආදියෙන් වැලකීමට ගත හැකි හොඳම ක්‍රියාමාර්ගය වන්නේ නිශ්චිත කාර්යයක් සඳහා නිර්මාණයක් භාවිතය සඳහා ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් දරන්නන්ගෙන් බලපත්‍රයක් ලබා ගැනීමයි.



බොහොමයක් ව්‍යාපාර අත්පත්‍රිකා හා වෙළඳ දැන්වීම් පවා ප්‍රතිරූපන ආරක්ෂණය මගින් ආවරණය කිරීම පිළිබඳව විශ්වාස කරති.

## ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් ලබාගන්නේ කෙසේද?

ප්‍රායෝගික වශයෙන් ලොව පුරා සියළු රටවල් සතුව ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් සඳහා වන දේශීය නීති එකක් හෝ කිහිපයක් පවතී. විවිධ රටවල මෙම නීති අතර වැදගත් වෙනස්කම් රාශියක් පවතින නිසා මෙම ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් සම්බන්ධ වන කිසියම් වූ ව්‍යාපාර තීරණ ගැනීමට පෙර අදාල දේශීය නීති උපදෙස් සලකා බැලීම හෝ ප්‍රවීන වෘත්තිකයෙකුගෙන් නීති උපදෙස් ලබාගැනීම හෝ අනිවාර්යයෙන් කළ යුතුය.

ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් ආරක්ෂාව පිළිබඳ විවිධ රටවල් අතර ඇති මට්ටම සැලකිය යුතු ප්‍රමාණයකට සමව තබා ගැනීම සඳහා උදව්වන වැදගත් අන්තර් ජාතික ගිවිසුම් කිහිපයකට රටවල් විශාල ප්‍රමාණයක් අත්සන් තබා ඇත. මෙමගින් එම රටවල් විශාල සංඛ්‍යාවන් තුල කිසිදු නියමයක් හෝ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා නොමැතිව ප්‍රතිරූපන අයිතිය ආරක්ෂාව පිළිබඳ කටයුතු කරගත හැකිව තිබේ. ප්‍රධාන අන්තර්ජාතික ගිවිසුම පිළිබඳව ලයිස්තුවක් ඇමුණුම් අංක (iii) ඇත.

## තවමු නිර්මාණ කෘති සුරැකීම සඳහා තවත් නීතිමය ක්‍රියා මාර්ග තිබේද?

නිර්මාණයේ ස්වභාවය අනුව ඔබගේ ව්‍යාපාර අයිතීන් ආරක්‍ෂා කිරීමට පහත දැක්වෙන බුද්ධිමය දේපළ හිමිකම් ආකාර වලින් එකක් හෝ කිහිපයක් භාවිතා කළ හැකිය.

- **වෙළඳ ලකුණු:-** වෙළඳ ලකුණක් මගින් කිසියම් සංකේතයකට (වචනයක්, ලාංඡනයක් හෝ වර්ණයක් හෝ මේවායේ සංකලනයක්) විශිෂ්ඨතාවයක් ලබා දේ. එමගින් එම නිෂ්පාදනය අනෙක් ඒවායෙන් වෙන්කර හඳුනාගැනීමට උපකාරී වේ.
- **කාර්මික සැලසුම්:-** කාර්මික සැලසුම් ආරක්‍ෂාව මගින් යම් නිෂ්පාදනයක අලංකාරවත් සහ සෞන්දර්යාත්මක ලක්‍ෂණ වලට විශිෂ්ඨතාවයක් ලබාගත හැකිය. සමහර රට වල මෙය සැලසුම් පිළිබඳ පේටන්ට් බලපත්‍ර ලෙස හඳුන්වයි. (Design Patents)
- **පේටන්ට් බලපත්‍රය:-** පේටන්ට් බලපත්‍රය මගින් නව නිපැයුම් එහි නවතාවය, නිපැයුම් පියවර සහ කර්මාන්තමය භාවිතා ආදී නිර්නායක වලට අදාලව ආරක්‍ෂා කරනු ලබයි.
- **රහස්‍ය ව්‍යාපාර තොරතුරු:-** වාණිජමය වටිනාකමක් ඇති රහස්‍ය ව්‍යාපාර තොරතුරු එහි අයිතිකරුවන් විසින් අදාල තොරතුරු වල පෞද්ගලික සහ රහසිගතභාවය සුරැකීමට පියවර ගන්නා තාක් කල වෙළඳ රහස් ලෙස රැකිය හැකිය.
- **අසාධාරණ තරගය පිළබඳ නීති:** ව්‍යාපාරික තරඟකරුවන්ගේ අයුතු ක්‍රියාකාරකම් වලට එරෙහිව පියවර ගැනීමට මෙමගින් ඉඩකඩ ලැබේ. යම් නිෂ්පාදනයක විවිධ අංග පිටපත් කිරීම හෝ අසාධාරණ භාවිතයන්ට එරෙහිව විවිධාකාරව බුද්ධිමය දේපළ පිළිබඳ හිමිකම් වලින් ලැබෙන ආරක්‍ෂාවට ඔබ්බෙන් වූ ආරක්‍ෂාවක් මෙම අසාධාරණ තරගය පිළිබඳ නීති මගින් ලැබේ. එසේ වුවද සාමාන්‍යයෙන් අසාධාරණ තරගයට එරෙහිව විවිධ විශේෂිත වර්ග වල බුද්ධිමය දේපළ හිමිකම් වලින් ලැබෙන ආරක්‍ෂාව රටක සාමාන්‍ය නීතිය මගින් ලැබෙන ආරක්‍ෂාවට වඩා ශක්තිමත්ය.



*සමහරවිට නිරමාණශීලී කෘති සුරැකීමට බුද්ධිමය දේපළ හිමිකම් වර්ග කිහිපයක් සමකාලිකව හෝ අනුක්‍රමිකව භාවිතා කෙරේ. උදාහරණ ලෙස ප්‍රතිරූපන අයිතිය මෙන්ම වෙළඳ ලකුණ නීතිය මගින්ද මිකී මවුස් ආරක්ෂිතය. ©Disney Enterprises, Inc. වෝල්ට් ඩිස්නි සමාගමේ අනුමැතිය සහිතව භාවිතා කරන ලදි.*

# 2. ආරක්ෂිත කාල සීමාව සහ විෂය පථය

## ප්‍රතිරූපන අයිතිය මගින් සුරකිනු ලබන්නේ කුමන වර්ගයේ හෝ කුමන ආකරයේ නිර්මාණද ?

බොහෝ රටවල ප්‍රතිරූපන අයිතිය පිළිබඳව ඉතිහාසය එය විසින් ආරක්ෂා කරනු ලබන නිර්මාණ වර්ග වල පරාසය ක්‍රමයෙන් පුළුල්වීමෙන් ඇති වුවකි. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ දේශීය නීති සාමාන්‍යයෙන් එයින් ආවරණය කෙරෙන නිර්මාණ වල දීර්ඝ ලයිස්තු ඉදිරිපත් නොකරන නමුදු පුළුල් සහ ඉතා නිර්මාණශීලි ක්ෂේත්‍ර ගණනාවක් ඉදිරිපත් කරයි. බොහෝ රටවල් මගින් ආරක්ෂාව ලබාදෙන නිර්මාණ ක්ෂේත්‍ර සහ වර්ග වලට පහත ඒවා අඩංගු වේ.

- සාහිත්‍යමය නිර්මාණ: (උදා:- පොත්, සඟරා, පුවත්පත්, තාක්ෂණික ලිපි ලේඛණ, උපදෙස් අත්පොත්, නාමාවලි, සාහිත්‍ය නිර්මාණ සංග්‍රහ)
- සංගීත නිර්මාණ/ රචනා, නිර්මාණ සංග්‍රහ
- නාට්‍යමය නිර්මාණ (මෙයට නාට්‍ය පමණක් නොව තවත් බොහෝ දේ උදා. ලෙස වීඩියෝ පටයක සටහන් වූ අලෙවි පුහුණු වැඩසටහනක් වැනි දෙයක් වුවද අදාළ වේ)
- සෞන්දර්යාත්මක නිර්මාන (කාටුන්, චිත්‍ර, මූර්ති සහ පිගණක නිර්මාණ ආදිය)
- ඡායාරූපමය නිර්මාණ (මුද්‍රිත සහ ඩිජියල් ආකාර දෙකම)
- පරිගණක ප්‍රකමන සහ මෘදුකාංග
- සමහර වර්ගවල දත්ත සමුදාය (වැඩි විස්තර සඳහා පිටු අංක 11 බලන්න)
- සිතියම්, ගෝලාකාර පෘථිවි සිතියම්, කටු සටහන්, රූප සටහන්, සැලසුම් සහ තාක්ෂණික චිත්‍ර සටහන්
- වෙළඳ දැන්වීම්, වාණිජමය මුද්‍රිත සහ ලේබල්
- සිනමා නිර්මාන :- චලන චිත්‍ර, රූපවාහිනී වැඩසටහන්, වෙබ් අඩවි වල විකාශනය වල වැඩසටහන් ආදිය මෙයට අයත්ය.
- බහුවිධ මාධ්‍ය නිෂ්පාදන (වැඩි විස්තර සඳහා පිටු අංක 24 බලන්න)
- සමහර රටවල ප්‍රායෝගික චිත්‍ර නිර්මාණද සැලකේ (නිර්මාණශීලී ආභරණ, බිත්ති සැරසිලි සහ බුමුතුරුණු ආදිය)(වැඩි විස්තර සඳහා පිටු අංක 14 බලන්න)

ප්‍රතිරූපන අයිතිය මගින් මුද්‍රිත නිර්මාණ මෙන්ම ඉලෙක්ට්‍රොනික සහ ඩිජිටල් මාධ්‍යන්හි නිර්මාණය කර ගබඩා කොට ඇති නිර්මාණද ආරක්ෂා කෙරේ. ඩිජිටල් මාධ්‍යන්හි ඇති නිර්මාණ පරිගණකයකින් පමණක් බැලීමට හැකි වීම එහි ප්‍රතිරූපන අයිතියයේ ආරක්ෂාවට බලපෑමක් ඇති නොකරයි.



සිතියම



සංගීත හා වීඩියෝ

## පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග වල ආරක්ෂාව

සංඛ්‍යාංක ආකාරයෙන් සලකා බැලූ විට ඩිජිටල් මාධ්‍යයන් හි ඇති අක්ෂර, ශබ්ද, රූප, ඡායාරූප, සංගීතය, සජීවිකරණය, වීඩියෝ වැනි දෑ සහ මෘදුකාංග අතර ඇත්ත වශයෙන්ම වෙනසක් නැත. නමුත් එක් ප්‍රධාන වෙනසක් මගින් ඉහත සියල්ල පරිගණක ප්‍රකමනයන්ගෙන් වෙන් කොට දක්වයි. අක්පර, ශබ්ද, රූප අදිය සාමාන්‍යයෙන් **අක්‍රිය** ස්වභාවයක් දරණ අතර පරිගණක වැඩසටහන් අත්‍යවශ්‍යයෙන්ම **සක්‍රිය** ස්වරූපයක් දක්වයි. එම නිසා ප්‍රතිරූපන අයිතිය පිළිබඳව නීති මගින් පරිගණක වැඩසටහන් වලට ආරක්ෂාවක් සැපයීම පිළිබඳව මත බේදයක් පවතී.

ප්‍රායෝගික වශයෙන් පරිගණක වැඩසටහනක විවිධ අංශවල ආරක්ෂාව සඳහා බොහෝ මාර්ග ඇත.

- ප්‍රතිරූපන අයිතිය මගින් පරිගණක ප්‍රකමනයක නිර්මාපකයෙකුගේ මුල් ආකෘතිය "සාහිත්‍යමය නිර්මාණයක්" ලෙස සුරකී. ප්‍රභව කේතය (Source Code) එය නිපදවූ පරිගණක ඉංජිනේරුවන්ගේ අදහස් පිළිඹිබු කරන අතර සාමාන්‍ය ව්‍යවහාරික බසින් ලියා ඇති සාහිත්‍ය කෘතියක් ලෙස කියවිය හැකිය. සාමාන්‍ය ව්‍යවහාරික බසින් ඇති උපදෙස් (Source Code) පමණක් නොව ද්විගුණ යාන්ත්‍රික බසින් කෘතියේ ඇති උපදෙස් (Object Code) යන දෙකම සාහිත්‍ය ලෙස සලකා ප්‍රතිරූපන අයිතිය මගින් සුරක්ෂිත කොට ඇත. කෙසේ වෙතත් ප්‍රතාශන අයිතිය මගින් ආරක්පා කල ප්‍රභව කේතයන් (Source code) හි ආර්ථික වටිනාකම සම්පූර්ණයෙන්ම ලැබෙන්නේ එම මෘදුකාංගයේ අවසන් ක්‍රියාකාරිත්වයේදීය. මිළදී ගත හැකි මෘදුකාංගයක් ලෙස මහජනතාවට ලබා දෙන ප්‍රකමනය පරිගණකය ක්‍රියා කරවන ප්‍රභව කේතයයි. පැකේජ් ලෙස සැකසූ මෘදුකාංග පිළිබඳ වෙළඳපොළ පෙරටු වේලා ආවරණය (Lead Time Effect) දක්වයි. මෙයින් අදහස් වන්නේ තම කරගකරුවන්ට වඩා වැඩි වාසි සහගත තත්වයක් ලබා ගැනීමට නිෂ්පාදකයන් සතුව කාල පරාසයක් පවතින බවයි. ව්‍යුත්පන්න නිර්මාණ නිපදවීමට විශිෂ්ට හිමිකම සැපයීමෙන් නීතිමය ආරක්පාව ලබන කාලය ඇතුලත ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීති පෙරටු කාල ආවරණ කාලය තෙක් විහිදේ.
- සමහර රටවල පරිගණක වැඩසටහන් වල ක්‍රියාකාරි අංග පේටන්ට් බලපත්‍ර මගින් ආරක්පා කොට ඇති අතර අනෙකුත් රටවල සියළුම වර්ගවල මෘදුකාංග **පේටන්ට්** ආරක්පාවේ සීමාවෙන් පැහැදිලිවම ඉවත්කොට ඇත.
- පරිගණක වැඩසටහන් වල ප්‍රභව කේත ප්‍රතිරූපන අයිතියේ ආරක්පණයට අමතරව වෙළඳ රහසක් ලෙස තබා ගැනීම සාමාන්‍ය වාණිජමය ක්‍රියාමාර්ගයකි.
- සමහර රටවල දී පරිගණක තිරයේ සුරුවමක් වැනි පරිගණක වැඩසටහන් මගින් නිර්මාණය කල සමහර අංග **කාර්මික සැළසුම්** ලෙස ආරක්පා කර තිබිය හැකිය.
- **ගිවිසුම් නීතිය** මගින් පාලනය කෙරෙන ගිවිසුමක් නීතිමය ආරක්පාවේ කේන්ද්‍රය ලෙස පවතින අතර සමහර විට බුද්ධිමය දේපල හිමිකම් වෙනුවට ද යෙදේ. කොන්ත්‍රාත් / බලපත්‍ර ගිවිසුමක් මගින් කෙරෙන එවැනි අතිරේක ආරක්පාවක "සුපිරි ප්‍රතිරූපන අයිතිය" ලෙස හඳුන්වයි. එවැනි අතිරේක ආරක්පාවක් නිරන්තරයෙන් සෘණාත්මක අවධානයක් හිමිකර ගැනීම පුදුමයක් නොවන්නේ එය ප්‍රධාන ස්ථානයේ අවභාවිතයක් ලෙස සැලකිය හැකි නිසාය.

- මෑත අවුරුදු වලදී බොහෝ රටවල් විසින් මෘදුකාංග ද ඇතුළුව තොරතුරු තාක්ෂණයන්ට පිවිසීම පාලනය සඳහා අපරාධ නීතිය යොදා ගැනීම වැඩිවෙමින් පවතී.
- මෘදුකාංග වල ආරක්ෂාව සම්බන්ධයෙන් නීතිමය සුරක්ෂිතතාවයට ඔබ්බෙන් වූ නව මුහුණතක් තාක්ෂණය මගින් සපයයි. උදාහරණයක් ලෙස අගුළු දැමිය හැකි වැඩසටහන් සහ වචන කියවිය නොහැකි කේත බවට පත්කරන Encryption ක්‍රම භාවිතය දැක්විය හැකිය. මෙසේ තාක්ෂණය මගින් බුද්ධිමත් නිෂ්පාදකයින්ට තමාගේම වන අමතර නීතිමය ආරක්ෂාවක් නිර්මාණයට අවස්ථාව සලසයි.උදා: වීඩියෝ ක්‍රීඩාවක නිෂ්පාදකයෙකු එහි වස්තු කේත ( Object code) සුරැකීම සඳහා අගුළු දැමීමේ. තාක්ෂණය සහ/හෝ ප්‍රතිරූපන අයිතිය කෙරෙහි විශ්වාසය තබනු ඇත.

මේ සමගම සැලකිය යුතු වන්නේ මෘදුකාංග වල සමහර අංශ වලට සරල ලෙස ප්‍රතිරූපන අයිතිය ලබාගත නොහැකි වීමයි. ඉතා ඉහළ මට්ටමේ පෞද්ගලික හෝ සෞන්දර්යාත්මක අංග නොමැති නම ක්‍රියාකාරකම කරන විධි ක්‍රම (උදා - මෙනු විධාන) ආදියට සාමාන්‍යයෙන් ප්‍රතිරූපන අයිතිය ලබාගත නොහැකිය. ඒ ආකාරයෙන්ම සැබෑ ලෙසම විශිෂ්ට වූ අංග නොමැති නම. චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක් (Graphical user interface)



සඳහාද ප්‍රතිරූපන අයිතිය ලද නොහැකිය. ප්‍රතිරූපන අයිතිය මගින් පරිගණක මෘදුකාංගයක අර්ථාන්විත අංග වලට ලබා දෙන ආරක්ෂාව සඳහා

- ලියාපදිංචි වීම අවශ්‍ය නැත(පිටුව24 බලන්න);
- එම නිසා ලබා ගැනීම මිළ අධික නොවේ
- බොහෝ කාලයක් පවතී (පිටුව 23 බලන්න)
- සීමිත ආරක්ෂාවක් ලබාදේ . එනම් යම් මෘදුකාංගයක අඩංගු වූ අදහස්, පද්ධති සහ ක්‍රියාමාර්ග අදාල වැඩසටහනේ දී ප්‍රකාශිත වූ විශේෂ ආකාරය පමණක් ආවරණය කරන හෙයින්ය (පිටුව13 බලන්න);
- අදහසක්, පද්ධති හෝ ක්‍රියාමාර්ග එපරිද්දෙන්ම ආරක්ෂා කරනු නොලබයි. වෙනත් ලෙසකින් දක්වතොත් පරිශීලක අත්පොත්, අතුරු මුහුණත්, ක්‍රියාත්මක කළ හැකි ක්‍රමලේඛ, ප්‍රභව කේත සහ වස්තු කේත අනවසරයෙන් පිටපත් කිරීමට එරෙහිව ප්‍රතිරූපන අයිතිය ආරක්ෂාව සපයයි. නමුත් මෘදුකාංගයක් තුළ අඩංගු වන ක්‍රියාකාරකම්, අදහස්, ක්‍රියාමාර්ග, සැකසීම්, ඇල්ගොරිදම ක්‍රියාත්මක කරන විධි ආදිය ආරක්ෂා නොකරයි. මේවා සමහර විට පේටන්ට් බලපත්‍ර මගින් හෝ ක්‍රමලේඛ වෙළඳ රහසක් ලෙස තබා ගැනීමෙන් ආරක්ෂා කෙරේ.

යමෙක් නීතිමය හෝ තාක්ෂණික උපාය මාර්ග සැලකිල්ලට ගත්තත් නැතත් මෘදුකාංග නිෂ්පාදකයින් ව්‍යාපාර උපායන් හි මේවා

භාවිතා කරන්නේ නම් අද පවතින තත්වය මගින් ඔවුනට තම නිපැයුම් සඳහා පෙර නොවූ විරූ ආරක්පාවක් ලැබේ දී ඇත. නමුත් මීට සමගාමීව අභියෝගයක් ද මෙහි ඇත. එනම්. ඩිජිටල් නිර්මාණයක සර වසම පිටපතක් සෑදිය හැකි වීම සහ පුද්ගලික පරිගණකයක් හා අන්තර්ජාල සම්බන්ධයක් ඇතිනම් එම පිටපත් හුදෙක් ඇඟිලි තුඩක ක්‍රියාකරිතවය මගින් හෝ යතුරු ලියනය භාවිතයෙන් ලොව ඕ.නෑම තැනකට යැවිය හැකි වීමයි.

අද පවතින සංකීර්ණ පරිගණක වැඩසටහන් හේතුවෙන් බොහෝ ප්‍රතිරූපන අයිතිය කඩකිරීම් කිසිදු වෙනසක් රහිතව පරිගණක වැඩසටහන් පිටපත් කිරීම සහ අනවසර බෙදාහැරීම් වලින් සමන්විත බව සඳහන් කිරීම වැදගත්ය.

## දත්ත ගබඩාවන් හි ආරක්ෂාව

දත්ත ගබඩාවක් යනු විධිමත් ලෙස සංවිධානය කළ පහසුවෙන් ප්‍රවේශ වීම සහ විශ්ලේපණය කළ හැකි තොරතුරු එකතුවකි. එය මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයේ එකක් විය හැකිය. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය දත්ත ගබඩාවන් නීතිමය වශයෙන් ආරක්පා කරන ප්‍රාථමික විධි ක්‍රමය වේ. කෙසේ නමුදු ප්‍රතිරූපන අයිතිය මගින් සියළු දත්ත ගබඩා ආරක්පා කරනු නොලබන අතර ආරක්පාව ලැබෙන ඒවාට ද ලැබෙනුයේ සීමිත ආරක්පාවකි.

- සමහර රටවල (උදා - ඇමරිකා එක්සත් ජනපදය ) ප්‍රතිරූපන අයිතිය මගින් දත්ත සමුදායක් ආවරණය කරනු ලබන්නේ එම දත්ත සමුදාය ප්‍රමාණවත් ලෙස නවමු එකක් ලෙස පෙනෙන ආකාරයකින් සැකසී හෝ පිළියෙල වී තිබුණහොත් පමණි. කෙසේ වුවත් ඉතා දීර්ඝ ලෙස පිළියෙල කර ඇති දත්ත සමුදාය සහ මූලික නීති වලට (උදා - අකාරාදි පිළිවෙල එනම් දුරකතන නාමාවලියක වැනි) දත්ත පෙළ ගස්වා ඇති දත්ත සමුදාය සාමාන්‍යයෙන් එම රටවල ප්‍රතිරූපන අයිතිය මගින් සුරකිනු නොලැබේ. (නමුත් සමහර විට මේවා අසාධාරණ තරගය පිළිබඳ නීති මගින් සුරකිනු ලබනවා විය හැකිය.)
- අනෙකුත් රටවල වැඩි වශයෙන්ම යුරෝපයේ නවමු ඒවා නොවන දත්ත ගබඩාවන් දත්ත ගබඩා නීති නමින් හැඳින්වෙන Sui generis හිමිකම් මගින් ආරක්පා කරනු ලබයි . මෙය දත්ත ගබඩාවන් වෙත වඩා වැඩි ආරක්පාවක් සපයයි. මෙම හිමිකම් මගින් දත්ත සමුදාය සම්පාදකයන් වෙත ඔවුන්ගේ තරගකරුවන් දත්ත ගබඩාවන්ගේ ප්‍රමාණවත් කොටස් උපුටා ගැනීමෙන් හෝ නැවත භාවිතයෙන් දත්ත වල අඩංගු දේ ලබාගෙන හෝ ඉදිරිපත් කොට සැලකිය යුතු ආයෝජනයක් කළහොත් ඔවුනට විරුද්ධව නඩු මගට බැසීමේ හැකියාව ලබාදේ. දත්ත සමුදායක් සතුව එහි ව්‍යුහයේ ප්‍රමාණවත් මට්ටමක නවතාවයක් ඇතිනම් එයද ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්පා කරනු ලැබේ.

දත්ත සමුදායක් ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්පා කෙරෙන විට මෙම ආරක්පාව ලැබෙන්නේ එහි අඩංගු දෙයට නොව දත්ත සමුදාය තේරීමේ සහ ඉදිරිපත් කිරීමේ විධි ක්‍රමයට පමණි.

## ආරක්ෂණයක් සඳහා සුදුසුකම් ලැබීමට නිර්මාණයක් අනුකූල විය යුතු නිර්ණායක මොනවාද ?

ප්‍රතිරූපන අයිතිය මගින් ලැබෙන ආරක්පාව සඳහා සුදුසුකම් ලැබීමට යම් නිර්මාණයක් නවමු එකක් විය යුතුය. නවමු නිර්මාණයක් යනු එහි ප්‍රකාශනය කතෘගෙන් මූලින්ම හටගත් එකකි. එනම් ස්වාධීනව නිර්මාණය වූ අන් කෙනෙකුගෙන් හෝ පොදු ස්වාමීත්වයේ (Public domain) පවතින තොරතුරු වලින් පිටපත් කළ එකක් නොවිය යුතුය. ප්‍රතිරූපන අයිතයේ පිළිබඳ නීතිය යටතේ නවමුභාවය යන්නට නියම තේරුම රටින් රටට වෙනස් වේ. කෙසේ වෙතත් නවමුභාවය අදාල වන්නේ ප්‍රකාශනයේ ආකාරයට වන අතර යටි අරුතට නොවේ.

සමහර රටවලදී නිර්මාණය යම් ද්‍රව්‍යමය ආකාරයටකට තිර කර තිබිය යුතුය. තිර කිරීමට උදා: නිර්මාණය කඩදාසියක ලියා තිබීම , තැටියක ගබඩා කර තැබීම , කැන්වසයක් මත පින්තාරු කර තැබීම හෝ පටියක පටිගත කර තැබීම ආදිය ඇතුලත්ය. එම නිසා පටිගත නොකළ නර්තන නිර්මාණ, ක්පණික කථා හෝ ප්‍රස්ථාර හෝ පටිගත නොකළ සංගීත නිර්මාණයන් සඳහා ආරක්පාව නොලැබේ. තිර කිරීම පිළිබඳ අර්ථ දැක්වීම මගින් සාමාන්‍යයෙන් තිරයක් මත කෙටිකාලීනව ප්‍රක්ෂේපනය කරන දේවල් රූපවාහිනියක හෝ සමාන උපකරණයක ඉලෙක්ට්‍රෝනික ආකාරයෙන් පෙන්වන දේවල් හෝ පරිගණකයක මතකයේ ඉතා කෙටිලීනව සටහන් වූ දේවල් වැනි වහා ඇති වී නැතිවන ආකාරයේ දෑ ඉවත් කොට ඇත. නිර්මාණයක් තිර කිරීම කතෘ මගින් හෝ කතෘ විසින් බලය පැවරූ අධිකාරියක් මගින් කළ හැකිය. ශබ්ද හා රූප අඩංගු නිර්මාණයක් සම්ප්‍රේපනය තිර කිරීමක් ලෙස සලකනු ලබන්නේ සම්ප්‍රේපනයට සමාන්තරව එය තිර (Fix) කර තිබුණේ නම්ය. එවැනි නිර්මාණයක් ද්‍රව්‍යමය වස්තු ආකාර දෙකක තිර කර තිබීමට හැකිය. එනම් ශබ්ද වාහිනි තැටි සහ පිටපත්ය. පිටපත් භෞතික (මුද්‍රිත හෝ පරිගණක විපයක වැනි මුද්‍රිත නොවන මාධ්‍යක) හෝ සංඛ්‍යාංක (පරිගණක වැඩසටහන් සහ දත්ත සමුදාය සංග්‍රහක ) විය හැකිය.

ප්‍රතිරූපන අයිතිය මගින් ප්‍රකාශයට පත් කළ සහ නොකළ දෙවර්ගයේම නිර්මාණ ආරක්පා කරයි

වෙහෙස වී වැඩ කිරීම, කුසලතා, කාලය, දක්පතාවය තේරීම හෝ මානසික උත්සාහය නවමු කෘතියක් නිර්මාණය හා සම්බන්ධ වේ. එසේ වූවද යම් නිර්මාණයට එහි නිර්මාණශීලි අංග සැලකීමකින් තොරව ප්‍රතිරූපන අයිතිය ආරක්පාව භුක්ති විදිය හැකිය. තවද මේ සඳහා එයට කිසියම් සාහිත්‍යමය හෝ සෞන්දර්යාත්මක ගුණයක් තිබීම අවශ්‍ය නැත. ප්‍රතිරූපන අයිතිය උදාහරණයක් ලෙස භාණ්ඩ අසුරන ලේබල්, වට්ටෝරු, තනිකරම තාක්පණික මාර්ගෝපදේශ උපදෙස් අත්පොත් හෝ ඉංජිනේරුමය රූප සටහන් පමණක් නොව අවුරුදු **3** ක ළමයෙකුගේ චිත්‍ර සඳහා පවා යෙදේ.




*සැකිලි රූ සටහන්, ගෘහ නිර්මාණ හා ඉංජිනේරුමය කටයුතු වලට අදාල තාක්පණික රූප සටහන් යන්ත්‍ර, ඇගළුම් සෙල්ලම් බඩු ආදියට අදාල සටහන් ප්‍රතිරූපන අයිතිය ආරක්පණය යටතේ ආරක්පණය කෙරේ.*

www.wipo.int/sme/

## නිර්මාණයක කුමන පැති ප්‍රතිරූපන අයිතිය මගින් සුරකිනු නොලබයි ද ?

- **අදහස් හෝ සංකල්පඃ** ප්‍රතිරූපන අයිතිය ආරක්පාව සපයන්නේ යම් විශේපිත නිර්මාණයක ප්‍රකාශිත අදහස් සහ සංකල්ප ඉදිරිපත් කරන විලාශයටයි. නිර්මාණය තුළ කෙසේ ගැබ්වී හෝ විස්තර කෙරී තිබුණත් ඒ පිළිබඳ තැකීමකින් තොරව නිර්මාණයේ යටි අරුත සංකල්ප සොයාගැනීම ක්‍රියාකාරිත්වයේ ආකාර, මූලධර්ම, ක්‍රියාමාර්ග සැකසීම හෝ පද්ධති යන ඒවා ප්‍රතිරූපන අයිතිය මගින් සුරකිනු නොලබයි. යමක් කිරීමේ ක්‍රමය සංකල්පය හෝ ප්‍රතිරූපන අයිතිය යටතට නොවැටුනත් ක්‍රමය හෝ සංකල්පය විස්තර කෙරෙන හෝ පැහැදිලි කෙරෙන ලිඛිත උපදෙස් සහ ලුහුඩු සටහන් ප්‍රතිරූපන අයිතිය මගින් සුරැකේ.

**උදාහරණ** - ඔබගේ සමාගම සතුව බීර නිපදවීම සඳහා ක්‍රමවේදයක් විස්තර කෙරෙන උපදෙස් අත්පොතක් සඳහා ප්‍රතිරූපන අයිතිය ඇත. අත්පොත සඳහා ප්‍රතිරූපන අයිතිය, ඔබ අත්පොත ලියූ ආකාරය, ඔබ භාවිතා කළ වාක්‍ය ඛණ්ඩ සහ පැහැදිලි කිරීම් අන්‍යයන් විසින් පිටපත් කිරීම වැළැක්වීමට ඔබට ඉඩ කඩ සලසා දෙයි. කෙසේ වෙතත් එමගින් ඔබට තරගකරුවන් විසින් . a) අත්පොතේ සඳහන් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාමාර්ග සහ වෙළඳාම පිණිස භාණ්ඩ ඉදිරිපත් කිරීමේ ක්‍රම (Merchandising) භාවිතා කිරීම b) බීර නිපදවීම සම්බන්ධයෙන් වෙනත් අත්පොතක් ලිවීම යන ඒවා කිරීම වැළැක්වීමට අයිතියක් ලබා නොදෙයි.

- **දත්ත හෝ තොරතුරු** : ප්‍රතිරූපන අයිතිය විද්‍යාත්මක, ඓතිහාසික ජීවන චරිත, හෝ ප්‍රවෘත්ති ආශ්‍රිත දත්ත හෝ තොරතුරු ආරක්පා නොකළත් එම තොරතුරු ප්‍රකාශිත, තෝරාගත් හෝ පිළියෙල කරගත් ක්‍රමවේදය ආරක්පා කරයි. (11 පිටුව බලන්න)

**උදාහරණඃ** පුද්ගලයෙකුගේ ජීවිතය පිළිබඳ බොහෝ කරුණු ජීවන චරිතාපදානයක අඩංගුය. මින් පෙර දැන නොසිටි දේ සොයමින් ග්‍රන්ථයේ කතෘ සැලකිය යුතු කාලයක් වැය කර තිබිය හැකිය. එහෙත් මෙම කරුණු ප්‍රකාශයට පත් කර ඇති ආකාරය පිටපත් කරන්නේ නොමැති නම් එම කරුණු භාවිතා කිරීමේ නිදහස අන්‍යයන්ට ඇත. මීට සමාන ආකාරයෙන් යමෙකුට ආහාර වට්ටෝරුවක ඇති තොරතුරු භාවිතා කොට එම ආහාරය පිළියෙල කළ හැකි වුවත් අනවසරයෙන් එම වට්ටෝරුවේ පිටපත් සකස් කළ නොහැකිය.

- **පුද්ගල නාම, පදවි නාම, උද්යෝග වාක්‍ය සහ වෙනත් කෙටි වාක්‍ය ඛණ්ඩ** සාමාන්‍යයෙන් ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්පාව නොලබයි. නමුත් ඒවා ඉහළ නිර්මාණශීලී බවකින් යුක්ත නම් සමහර රටවල් වල ඒවා සඳහා ආරක්පාවට ඉඩ සළසයි. නිප්පාදනයක නම හෝ වෙළඳ ප්‍රචාරන වාක්‍ය ප්‍රතිරූපන අයිතිය මගින් සාමාන්‍යයෙන් ආරක්පා නොකරන නමුදු ඒවා වෙළඳ ලකුණු නීතිය මගින් හෝ අසාධරණ තරගය පිළිබඳ නීති මගින් සුරකියි. අනෙක් අතට අදාළ අවශ්‍යතා සපුරා ඇත්නම් කිසියම් ලාංඡනයක් ප්‍රතිරූපන අයිතිය මගින් මෙන්ම වෙළඳ ලකුණු පිළිබඳ නීති මගින් ද ආරක්පා කෙරේ.
- **ආණ්ඩුවේ රාජකාරිමය කෘති** වලට (ව්‍යවස්ථාවන්හි හෝ අධිකරණයේ මත ආදිය වැනි) ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ආරක්පාව සමහර රටවල දී නොමැත. (11 පිටුව බලන්න)

- **ව්‍යවහාරික කලාවට අදාල නිර්මාණ** .සමහර රටවල ව්‍යවහාරික කලාවට අදාල නිර්මාණ ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්පා නොකෙරේ. එවැනි රටවල එම නිර්මාණ වල අලංකාරවත් අංග කාර්මික සැලසුම් ලෙස කාර්මික සැලසුම් නීතිය යටතේ ආරක්පා කළ හැකිය. (පහත කොටුව බලන්න) කෙසේ වෙතත් එම භාණ්ඩයේ ¨උපයෝගිතා අංග වලින් වෙන් කොට හඳුනාගත් රූපමය චිත්‍ර හෝ මූර්තිමය ලක්පණ පමණක් ප්‍රතිරූපන අයිතියේ ආරක්පාව මගින් ආවරණය වනු ඇත.

## ප්‍රතිරූපන අයිතියේ ආරක්ෂාව මගින් ලබාදෙන හිමිකම් මොනවාද ?

ප්‍රතිරූපන අයිතිය හිමිකම් කට්ටල හෝ ගොනු දෙකක් ලබාදෙයි. ආර්ථික හිමිකම් කතෘගේ හෝ අයිතිකරුගේ වාණිජමය ලාභ ලෙස ලැබිය හැකි ආර්ථිකමය අයිතීන් සුරකියි. සදාචාරමය හිමිකම් මගින් නිර්මාණය මගින් ප්‍රකාශිත කතෘගේ නිර්මාණාත්මක අවංකභාවය සහ කීර්තිය සුරකියි.

## ආර්ථික හිමිකම් යනු මොනවාද ?

ආර්ථික හිමිකම් ප්‍රතිරූපන අයිතිය දරන්නාට /අයිතිකරුට නිර්මාණයේ නිශ්චිත භාවිතා බලගැන්වීම හෝ තහනම් කිරීම සඳහා වූ විශිප්ට හිමිකම් ලබාදේ . විශිප්ට යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රතිරූපන අයිතිය හිමිකරුගේ පූර්ව අවසරයකින් තොරව කිසිවෙකුට මෙම හිමිකම් පාවිච්චි කළ නොහැකි බවයි. මෙම හිමිකම් වල පරාසය, ඒවායේ සීමා සහ ඒවා මගින් ආවරණය නොකරන දේ සලකනු ලබන නිර්මාණයේ වර්ගය සහ මීට අදාල ප්‍රතිරූපන අයිතිය පිළිබඳ දේශීය නීතිය මත වෙනස් වේ. ආර්ථික හිමිකම් යනු සරල වශයෙන් - ¨පිටපත් කිරීම සඳහා වූ අයිතිය න් ඔබ්බට ගිය ඒවා වේ. මෙහිදී අවධාරණය සම්පූර්ණයෙන්ම පිටපත් කිරීම පිළිබඳ හිමිකම් වලට පමණක් අයධානය යොමුකර නොමැති අතර ප්‍රතිරූපන අයිතියේ මුල් හිමිකරුගේ නිර්මාණයෙන් අයථා වාසි ලබා ගැනීමට වලක්වාලීමට හැකි වෙනස් ආකාරයේ හිමිකම් කෙරෙහි ද අවධාරණය කර ඇත. සාමාන්‍යයෙන් ආර්ථික හිමිකම් වල පහත දැක්වෙන විශිප්ට හිමිකම් අඩංගුය.

### ව්‍යවහාරික කලාවට අදාල නිර්මාණ - ප්‍රතිරූපන අයිතිය සහ සැලසුම් හිමිකම් අතර අතිච්ඡේදනය

ව්‍යවහාරික කලාවට අදාල නිර්මාණ යනු එදිනෙදා භාවිතා වන නිප්පාදන යටතට ඇතුළත් කිරීමෙන් කාර්මික අරමුණු සඳහා භාවිතා කරන සෞන්දර්යාත්මක නිර්මාණ වේ. ආභරණ, ලාම්පු සහ ගෘහ භාණ්ඩ මේවාට උදාහරණ වේ ව්‍යවහාරික කලා නිර්මාණ වලට ද්විත්ව ස්වාභාවයක් ඇත. ඒවා සෞන්දර්යාත්මක නිර්මාණ ලෙස සැලකිය හැකිය. මේවායේ භාවිතා මෙන්ම උපයෝජන ද විශේපිත සංස්කෘතික වෙළඳ පොලවල් වල සිදු නොවුව ද බොහෝ විට සාමාන්‍ය නිප්පාදන සඳහා වන වෙළඳපොලේදී සිදුවේ. මෙය මෙම නිර්මාණ කාර්මික සැලසුම් ආරක්පාව සහ ප්‍රතිරූපන අයිතිය අතර සීමා රේඛාවක පිහිටුවයි. ව්‍යවහාරික කලා නිර්මාණ වලට දෙනු ලබන ආරක්පාව රටින් රටට විශාල වශයෙන් වෙනස් වෙයි . සමහර රටවල දෙයාකාරයක ආරක්පාවට එක්ව පැවතිය හැකි අතර සෑම රටකටම මෙය අදාල නොවන නිසා යම් විශේපිත රටක තත්වය පිළිබඳ සෑහීමකට පත් වීමට දේශීය බුද්ධිමය දේපල පිළිබඳ විශේපඥයකුගේ උපදෙස් පැතීම නුවණට හුරුය.

www.wipo.int/sme/

- **විවිධාකාරයේ නිර්මාණයන් හි පිටපත් ප්‍රතිනිෂ්පාදනය කිරීම:** උදාහරණ ලෙස සංයුක්ත තැටියක් පිටපත් කිරීම, පොතක ඡායාපිටපත් ගැනීම, පරිගණක වැඩසටහනක් බාගැනීම (Download) ඡායාරූපයක් ඩිජිටල්කරණය කොට දෘඪ තැටියක තැන්පත් කිරීම , ජේදයක් පරිලෝකනය (Scan) කිරීම කාටූන් චරිතයක් ටී ෂර්ටයක මුද්‍රණය කිරීම හෝ ගීතයක කොටසක් නව ගීතයකට ඇතුළත් කිරීම දැක්විය හැකිය. මෙය ප්‍රතිරූපන අයිතිය ලබාදෙන හිමිකම් අතරින් ඉතා වැදගත් එකකි.
- **නිර්මාණයක පිටපත් මහජනතාව අතර බෙදා හැරීම:** ප්‍රතිරූපන අයිතිය එහි හිමිකරුට අන්‍යයන් විසින් නිර්මාණයේ අනවසර පිටපත් විකිණීම කුලියට දීම හෝ එම පිටපත් සඳහා බලපත්‍ර ලබාදීම තහනම් කිරීමට ඉඩ සලසා දෙයි. නමුත් මෙයින් ආවරණය නොකරන වැදගත් කරුණක් ඇත. බොහෝ රටවල බෙදා හැරීම පිළිබඳ හිමිකම ප්‍රථම විකිණීමෙන් හෝ යම් පිටපතක අයිතිය පැවරූ පසු අවසන් වේ. කවද ප්‍රතිරූපන අයිතිය සතු අයෙකුට නිර්මාණයක එහි කාල නිශ්චය කොන්දේසි සහ තත්වයන් ඇතුළුව එහි "පළමු විකිණීම පමණක් පාලනය කළ හැකිය. නමුත් යම් පිටපතක් විකිණුනු පසු ප්‍රතිරූපන අයිතය හිමිකරුට එම පිටපත අදාල රටෙහි බල ප්‍රදේශ වල තවදුරටත් බෙදා හැරීම පිළිබඳ ක්‍රියා කළ නොහැකිය. ගැණුම්කරුට පිටපත නැවත විකිණීමට හෝ පවරා දීමට හැකිය. නමුත් නව පිටපත් සෑදීම හෝ නිර්මාණය මත පදනම් වූ ව්‍යුත්පන්න නිර්මාණ සෑදීම කළ නොහැකිය.
- **නිර්මාණයක පිටපත් කුලියට දීම.** මෙම හිමිකම සාමාන්‍යයෙන් යෙදෙන්නේ සිනමා නිර්මාණ, සංගීතමය නිර්මාණ හෝ පරිගණක වැඩටහන් වැනි විශේපිත වර්ගවල නිර්මාණ සඳහා පමණි. කෙසේ වෙතත් මෙම අයිතිය කාර්මික නිප්පාදනයක කොටසක් වන පරිගණක ප්‍රකමන වලට නොයෙදේ. උදාහරණයක් ලෙස කුලී කාරයක ජ්වලනය පාලනය කරන පරිගණක ප්‍රකමන දැක්විය හැකිය.
- **නිර්මාණයක පරිවර්තන හෝ උපයුක්ත සාදා ගැනීම.** මෙවැනි නිර්මාණ එනම් **ආරක්ෂිත නිර්මාණයක් මත පදනම් වූ නව නිර්මාණ** ව්‍යුත්පන්න නිර්මාණ ලෙස ද හඳුන්වයි. උදා: ඉංග්‍රීසියෙන් ඇති උපදෙස් අත් පොතක් වෙනත් භාෂාවන්ට පරිවර්තනය කිරීම , නවකථාවක් චිත්‍රපටයකට හැරවීම, පරිගණක වැඩසටහනක් වෙනස් පරිගණක භාෂාවකින් නැවත ලිවීම, වෙනස් සංගීත සංයෝජන සැකසීම හෝ කාටූන් රූපයක් ඇසුරෙන් සෙල්ලම් බඩුවක් සෑදීම දැක්විය හැකිය. කෙසේ වෙතත් බොහෝ රටවල විශිෂ්ට හිමිකම් වලින් ආවරණය නොවන වැදගත් කරුණු ව්‍යුත්පන්න නිර්මාණ කිරීම සඳහා ඇත. උදාහරණ ලෙස ඔබට පරිගණක වැඩසටහනක පිටපතක් නීත්‍යානුකූල ලෙස හිමි නම් එහි විධිමත් භාවිතය සඳහා පමණක් එය නවීකරණය හෝ සකසා ගැනීම කළ හැකිය.
- **,නිර්මාණයක් මහජනතාවට ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීම සහ සන්නිවේදනය කිරීම:** මෙයට නිර්මාණයක් ජනතාවට ඉදිරිපත් කිරීම කියවීම හෝ රේඩියෝව , කේබල් , චන්ද්‍රිකා, රූපවාහිනිය මගින් සම්ප්‍රේශනයට අදාල විශිෂ්ට හිමිකම් අයත් වේ. පවුලේ සම්පතමයන් සහ මිතුරන් ට වඩා පිරිසක් රැස්ව සිටින ස්ථානයක හෝ මහජනතාවට විවෘත ස්ථානයක නිර්මාණයක් ඉදිරිපත් කළ විට එය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළ නිර්මාණයක් බවට පත්වේ.

- **නිර්මාණයක් නැවත විකිණීක දී විකුණුම් මිලෙන් ප්‍රතිශතයක් හිමිවීම:** මෙය නැවත විකිණුම් නීතිය හෝ droit de suite ලෙස හඳුන්වයි. මෙම සමහර රටවල් වල පමණක් දැකිය හැකි අතර නිරන්තරයෙන් නිශ්චිත වර්ගවල නිර්මාණ වලට සීමා වේ (උදාහරණ - පින්තාරු, චිත්‍ර, මුද්‍රණ, කොලාජ් නිර්මාණ, මූර්ති, කැටයම්, විචිත්‍ර ගෙත්තම් වලින් සැකසූ තිර, මැටි භාණ්ඩ, වීදුරු භාණ්ඩ මුල් අත්පිටපත් ආදිය) යම් නියම කළ ආකාරයකට නැවත විකිණීම සිදුවුවහොත් නිර්මාණයක නැවත විකිණීමකදී ලැබෙන ලාභයෙන් කොටසක් මෙම නැවති විකිණීම පිළිබඳ නීති මගින් නිර්මාපකයාට ලබා දෙයි. සාමාන්‍යයෙන් මෙම කොටස මුළු විකුණුම් මිලෙන් 2 සිට 5 දක්වා විචලනය වේ.
- නිර්මාණ අන්තර්ජාල ගත කිරීම මගින් අවශ්‍ය ඕනෑම විටක මහජනතාවට එයට ප්‍රවේශ විය හැකි අතර එමගින් පුද්ගලයෙකුට ඔහු හෝ ඇය විසින් තොරාගන්නා ඕනෑම ස්ථානයක වේලාවක නිර්මාණයට ප්‍රවේශ විය හැකිය.

**ඉහත සඳහන් කළ ඕනෑම අවශ්‍යතාවයක් සඳහා ආරක්ෂිත නිර්මාණ භාවිතා කිරීමට බලාපොරොත්තු වන ඕනෑම පුද්ගලයෙකු හෝ සමාගමක් සාමාන්‍යයෙන් ප්‍රතිරූපත අයිතිය හිමිකරු / කරුවන් ගේ පූර්ව අවසරය ලබාගත යුතුය.** ප්‍රතිරූපත අයිතිය හිමිකරුගේ හිමිකම් විශිෂ්ට වූ එවා වුවද ඒවා කාලයෙන් සීමා වන අතර සමහර වැදගත් සීමා සහ හිමිකම් වලට අයත් නොවන දේ වලින් යුක්තය.

## සදාචාර හිමිකම් යනු මොනවාද ?

මේවා බුද්ධිමය නිර්මාණ, නිර්මාපකයාගේ ආත්මයේ හෝ ප්‍රාණයේ මූර්තියක් ලෙස සලකන ප්‍රංශයේ ›රදසඑ › 'මඑැමර සම්ප්‍රදාය මත පදනම් ව ඇත. ඇන්ග්ලෝ - සැක්සන් ව්‍යවහාර නීතිය ප්‍රතිරූපත අයිතිය සහ සම්බන්ධිත හිමිකම් සරල වශයෙන් දේපළ හිමිකම් ලෙස සලකන අතර ඕනෑම නිර්මාණයක් අශ්වයෙකු හෝ කාරයක් ආකාරයෙන් ම මිළදී ගැනීම විකිණීම හෝ කුළියට දීම කළ හැකි ලෙස සලකයි.

බොහෝ රටවල සදාචාර හිමිකම් පිළිගන්නා නමුත් මෙම හිමිකම් වල විෂය පථය පුළුල් ලෙස වෙනස් වන අතර සියාළුම රටවල් වලින් මේවාට ප්‍රතිරූපත අයිතිය ලබා දීම සිදුනොකරයි. අඩුම වශයෙන් බොහෝ රටවල් පහත දැක්වෙන සදාචාර හිමිකම් වර්ග දෙක පිළිගනී.

- නිර්මාණයේ කතෘ ලෙස නම් කරනු ලැබීමට ඇති හිමිකම (කතෘත්ව හිමිකම හෝ පිතෘත්ව හිමිකම) කතෘවරයෙකුගේ නිර්මාණයක් ප්‍රතිනිප්පාදනය කළ විට ප්‍රකාශනයට පත් කළ විට මහජනයාට ලබාගත හැකි බවට පත් කළ විට හෝ සන්නිවේදනය කළ විට හෝ මහජනයාට ප්‍රදර්ශනය කළ විට එසේ කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් හේතු සහගත ඕනෑම විටක නිර්මාණයේ හෝ නිර්මාණයට සම්බන්ධ ව කතෘ ගේ නම සඳහන් වීම ගැන සහතික විය යුතුය.
- නිර්මාණයේ සමස්තය සුරැකීමට ඇති

w w w . w i p o . i n t / s m e /

හිමිකම **කතෘගේ ගෞරවය හෝ කීර්තිනාමය** පළුදු කරන ආකාරයේ කිසිදු වෙනස්කමක් නිර්මාණය කිරීම මෙමගින් තහනම් කරයි.

නිර්මාපකයාට පෞද්ගලික වන නිසා ආර්ථික හිමිකම් මෙන් නොව සදාචාර හිමිකම් වෙනත් කෙනෙකුට **පැවරිය නොහැකිය.** (නමුත් මේවා නිර්මාපකයාගේ උරුමක්කරුවන්ට ලැබිය හැකිය ) නිර්මාණයක් සතු ආර්ථික හිමිකම් වෙනත් කෙනෙකුට විකුණූ පසුව පවා නිර්මාණයේ සදාචාරය හිමිකම් නිර්මාපකයා සතුවම පවතී . කෙසේ වෙතත් සමහර රටවල කතෘ ට හෝ නිර්මාපකයාට ඔහු/ ඇය ගේ සදාචාරමය හිමිකම් ලිඛිත ගිවිසුමක් මගින් අත්හල හැකි අතර මගින් ඔහු/ ඇය ගේ සමහර හෝ සියළු සදාචාරමය හිමිකම් යොදාගැනීමෙන් වැළකීමට ඔහු/ ඇය එකග වේ.

ගණනින් වැඩි වෙමින් පවතින නමුදු රටවල් සුළුසංඛ්‍යාවක් මෙම සදාචාරමය හිමිකම් ගීත නර්තන ආදිය ඉදිරිපත් කරන්නන් වෙත ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් සඳහා ලබාදී ඇත. ශබ්ද වාහිනී තැටිවල පටිගත හෝ සජීවී ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නන් ගේ සදාචාරමය හිමිකම් එම ඉදිරිපත් කිරීම් වල ආර්ථික හිමිකම් පැවරීමෙන් පසුව ද පවතින අතර ඒවායේ පහත කරුණු අඩංගු වේ.

- ඉදිරිපත් කිරීම (Performance) භාවිතා කරන ආකාරය මගින් අණ කිරීමකින් ඉවත් කොට නොමැති විටක ඉදිරිපත් කිරීමට අදාල ඉදිරිපත් කරන්නා (Performer) ලෙස හැඳින්වීමට ඇති අයිතිවාසිකම ඉල්ලා සිටීමේ හිමිකම්
- කීර්තියට හානිකර විය හැකි විකෘති කිරීම් කොටස් කපා දැමීම් හෝ වෙනත් ඕනෑම ආකාරයක වෙනස් කිරීමටකට එරෙහි වීමට ඇති හිමිකම්

## සම්බන්ධිත හිමිකම් මගින් ප්‍රදානය කෙරෙන හිමිකම් මොනවාද ?

**ඉදිරිපත් කරන්නන්** (Performers) ( උදා - නළුවන්, සංගීත ශිල්පීන්, නැටුම් ශිල්පීන් ) සතුව ඔවුන්ගේ සජීවී ඉදිරිපත් කිරීම් (Live Performance) හෝ ඒවායෙන් කිසියම් සැලකිය යුතු කොටසක් හෝ කිසියම් මාධ්‍යයක තිර කිරීම (පටිගත කිරීම) මහජනයාට සන්නිවේදනය කිරීම හෝ ගුවන් විදුලි ප්‍රචාරනය හෝ කේබල් මගින් සම්ප්‍රේෂණය කිරීම මෙන්ම ඔවුන්ගේ සජීවී ඉදිරිපත් කිරීම් වල පටිගත කිරීම නිෂ්පාදනය සඳහා අවසර දීමට හෝ තහනම් කිරීමට විශිෂ්ට හිමිකම් ඇත. යුරෝපීය එකමුතුවේ සාමාජික රටවල් වැනි සමහර රටවල් සජීවී ඉදිරිපත් කිරීම් ඇතුළත් වන ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ සහ ශබ්ද පටිගත කිරීම් කුලියට හෝ ණයට දීම සඳහා අවසර දීමට හෝ තහනම් කිරීමට ඉදිරිපත් කරන්නන් සඳහා විශිෂ්ට හිමිකම් සපයා ඇත.

බොහෝ රටවල ශබ්දවාහිනී තැටියක් ගුවන් විදුලි ප්‍රචාරනය හෝ මහජනයා වෙත සන්නිවේදනය සඳහා හෝ යොදා ගත් විට එහි නිෂ්පාදකයන්ට හෝ ඉදිරිපත් කරන්නන්ට හෝ එම පාර්ශව දෙකටම හෝ එක් සාධාරණ ගාස්තුවක් ගෙවිය යුතුව ඇත.

බොහොමයක් රටවලදී ඉදිරිපත් කරන්නන්ගේ හිමිකම් සමස්තයම හෝ කොටසක් වෙනත් කෙනෙකුට පැවරිය හැකිය. එවැනි පැවරීමකින් පසු පවා දේශීය නීතය මත රඳා පවතින අයුරින් ඔහු / ඇය සජීවී ඉදිරිපත් කිරීම් වල පටිගත කිරීම් සෑදීම , විකිණීම , බෙදාහැරීම සහ රට තුළට ආනයනය කිරීම තහනම් කිරීමට ඉදිරිපත් කරන්නෙකුට හැකිය.

**ශබ්දවාහිනී තැටි නිෂ්පාදකයින්** (තැටි නිපදවන්නන් සහ නිර්මාණ ශිල්පීන් ) සතුව ඔවුන්ගේ පටිගත කිරීම් වල ප්‍රතිනිෂ්පාදන භාවිතාවන් හෝ බෙදාහැරීම් වලට අවසර දීමට හෝ තහනම් කිරීමට විශිෂ්ට හිමිකම් ඇත. ඉතාමත් වැදගත් හිමිකම වනුයේ ශබ්ද වාහිනී තැටි නැවත නිෂ්පාදනය පාලනය කිරීමට ඇති හිමිකමයි. අනෙක් හිමිකම් අතර ශබ්දවාහිනී තැටි ගුවන් විදුලි ප්‍රචාරනයේදී සාධාරණ ගාස්තුවක් ලැබීම ජනතාව අතරින් තනි සාමාජිකයෙක් පටිගත කිරීම ඉල්ලන අවස්ථාවක ලබාදිය හැකිවීම පිළිබඳ හිමිකම හෝ ජනතාව වෙත සන්නිවේදනය කිරීමේ හිමිකම දැක්විය හැකිය. බොහෝ රටවල නිෂ්පාදකයන්ට ඔවුන්ගේ ශබ්දවාහිනී තැටි ආනයනය සහ බෙදාහැරීම ද තහනම් කළ හැකිය. සමහර රටවල ඔවුහු තමා හිමිකම දරණ ශබ්ද පටිගත කිරීම් මහජනයා ඉදිරියේ ඉදිරිපත් කිරීම හෝ සන්නිවේදනය වෙනුවෙන් ගාස්තුවෙන් හරි අඩක් සඳහා හිමිකම ලබති.

ගුවන් විදුලි ප්‍රචාරකයන් සංඥාව නැවත ප්‍රචාරනය කිරීම සංඥාව තිර කිරීම හෝ ප්‍රචාරකයන් ගේ අනුමැතිය රහිතව තිර කරන ලද්දක් පවා ප්‍රතිනිර්මාණය කිරීම ආදි ඔවුන්ගේ රූහැන් රහිත සන්නිවේදන සංඥව පිළිබඳ පරම හිමිකම් වලින් ප්‍රයෝජන ලබයි.

සමහර රටවල ගුවන් විදුලි ප්‍රචාරකයන් හට තනි තනි සේවාදායකයන් ඉල්ලා සිටි විට තිර කරන

## ශබ්ද තැටි නිෂ්පාදකයින් සතු හිමිකම්

බොහොමයක් රටවල ශබ්ද තැටි නිෂ්පාදකයින්ට තම පටිගත කිරීම් ගුවන් විදුලි ප්‍රචාරනය තහනම් කිරීමට නොහැකි නමුත් ගුවන් විදුලි ප්‍රචාරන ආයතන වලින් කතෘ භාගය ලබාගැනීමේ හිමිකම ඇත.

මෙම හිමිකම පිළිගන්නා රටවල දී ගුවන් විදුලි ප්‍රචාරන ආයතන මගින් මෙම ගෙවීම කළ යුත්තේ සංගීත නිර්මාණයක් ප්‍රචාරනය සඳහා එහි හිමිකම අයත් සංගීත රචකයාට සහ පටිගත කිරීම මිළදී ගැනීම සඳහා ශබ්ද පටිගත කළ සමාගමට පමණක් නොව පටිගත කිරීම ප්‍රචාරනය සඳහා හිමිකම වෙනුවෙන්ද ශබ්ද පටිගත කළ සමාගමට ගෙවීම කළ යුතුය.

රටක් රෝම සම්මුතියට WTO (TRIPS ගිවිසුමට ) හෝ WIPO ඉදිරිපත් කිරීම් සහ ශබ්ද වාහිනී තැටි ගිවිසුමට සම්බන්ධ වූ විට එමගින් එම රටේ ගුවන් විදුලි ප්‍රචාරකයන් හට තැටි නිෂ්පාදකයන් වෙත කතෘභාගය ගෙවීමට ඇති බැඳීම නැති වන අයුරින් ඉඩ කඩ සාදනු ඇත.

ලද ප්‍රචාරනයන් සම්ප්‍රේෂණයට සහ පරිගණක දත්ත ගබඩාවන්ට සම්බන්ධ කර ඇති තිර කරන ලද ගුවන් විදුලි ප්‍රචාරනයන්ට මාර්ග ගත ජාලයක් ඔස්සේ මහජනතාවට ප්‍රවේශ වීම සලසා දීමට අවසර දීම හෝ තහනම් කිරීමට හිමිකම් ඇත. නමුත් වෙනත් බොහෝ රටවල් අන්තර්ජාල ශ්‍රව්‍ය දෘශ්‍ය නාලිකා ඔවුන්ගේ ප්‍රතිරූපන අයිතිය  සහ සම්බන්ධිත හිමිකම පිළිබඳ නීති වල ඇති වගන්ති වලට අනුකූලව ගුවන් විදුලි ප්‍රචාරන සේවා ලෙස නොසලකයි සමහර රටවල ගුවන් විදුලි ප්‍රචාරකයින්ට ඔවුන්ගේ ප්‍රචාරනයන් කේබල් සම්ප්‍රෙෂණය සඳහා අවසර දීමට හෝ තහනම් කිරීමට ද හිමිකම් ඇත. නමුත් සමහර වෙනත් රටවල කේබල් ක්‍රියාකරුවන්ට අවසරයකින් හෝ ගෙවීමකින් තොරව ගුවන් විදුලි ප්‍රාචාරකයන්ගේ සංඥා නැවත සම්ප්‍රේෂණයට තවමත් හැකියාව ඇත



*ගුවන් විදුලි ප්‍රචාරනයන්ට අදාල හිමිකම් විත්‍රපට, සංගීතය හා අනෙකුත් සම්ප්‍රේෂණ කටයුතු සඳහා ලැබෙන ප්‍රතිරූපන අයිතියට වඩා වෙනස් වේ.*

බොහෝ රටවල රූපවාහිනී සන්නිවේදන සංඥාවක ප්‍රචාරකයාට මහජනතාව වෙත සන්නිවේදනයට අවසර දී හෝ තහනම් කිරීම සඳහා පරම හිමිකම ඇත. එය මහජනයාට විවෘත ස්ථානයක ඇතුලුවීමේ ගාස්තුවක් මත ඉදිරිපත් කිරීම උදාහරණයකි.

ගුවන් විදුලි ප්‍රචාරනයක් කේබල් මගින් නැවත සම්ප්‍රේෂණයට අවසර දීම හෝ තහනම් කිරීම සඳහා වන හිමිකම් ගුවන් විදුලි ප්‍රචාරන සංවිධානයක් තමාගේ සම්ප්‍රේෂණයන් පිළිබඳව යොදාගන්නා විට හැර අනෙක් අවස්ථාවලදී ක්‍රියාවේ යොදවන්නේ සාමූහික පාලන සංවිධානයක් හරහායි.

මාර්ග ගත (on line) ව අඩංගු දේ නිපදවීම හා ගලා යෑමට සැලැස්වීම සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණක් නම් මෙය සිග්‍රයෙන් පරිණාමය වන ක්ෂේත්‍රයක් නිසා ප්‍රතිරූපන අයිතිය පිළිබඳ විශේෂයෙකුගේ උපදෙස් පැතීම සුදුසු බවයි .

අන්තර් ජාලය තුළ ඉදිරිපත් කරන පටිගත කළ හෝ ප්‍රචාරණය කළ නිර්මාණයක් සඳහා ප්‍රතිරූපන අයිතිය මගින් ලැබෙන ආරක්ෂාවක් ඇත්නම් **සම්බන්ධිත හිමිකම්** වල යෙදීම සඳහා බල නොපායි.

## සංගීතය සඳහා වන ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම්

ව්‍යාපාරයක් තම පාරිභෝගිකයන් තුළ ධනාත්මක බලපෑමක් ඇති කිරීම පාරිභෝගිකයන් ආකර්ෂණය කිරීම හෝ තම සේවකයන්ගේ සුභ සිද්ධිය සඳහා වැනි විවිධ හේතු සඳහා සංගීතය භාවිතා කළ හැකිය. මෙය යම් ව්‍යාපාරයකට එහි කරගකරුවන්ට වඩා තරක් වාසියක් (Competitive edge) ලබාගැනීමට ඉඩ ලබා දීම, සේවකයන්ට වඩා හොඳ වැඩ පරිසරයක් ලබාදීම, විශ්වාසවන්ත පරිභෝගික පිරිසක් සාදා ගැනීමට උදව. වීම සහ මුළු සමාගම පිළිබඳ හෝ එහි වෙළඳනාමය පිළිබඳ ජනතාවගේ ආකල්පය වර්ධනය කිරීමට පවා උපකාරි වේ.

ප්‍රධාන රූපවාහිනී නාලිකා ජාල, ප්‍රාදේශීය රූපවාහිනී සහ රේඩියෝ සේවා ආයතන, කේබල් සහ චන්ද්‍රිකා ජාල සහ පද්ධති, මහජන ගුවන් විදුලි ප්‍රචාරකයන් අන්තර් ජාල වෙබ් අඩවි, විද්‍යාල විශ්ව විද්‍යාල , රාත්‍රි සමාජ ශාලා, ආපන ශාලා, පසුබිම් සංගීත සේවා, සෞඛ්‍ය හා ශාරීරික වර්ධන මධ්‍යස්ථාන, හෝටල, වෙළඳ ප්‍රදර්ශන, සංගීත සංදර්ශන ඉදිරිපත් කරන්නන්, අලෙවි මධ්‍යස්ථාන, විනෝද උයන්, ගුවන් සේවා, දුරකතන සමාගම් ඇතුළු පුළුල් පරාසයක පැතිරී ඇති වෙනත් කර්මාන්තයන් හි සංගීතය පරිශීලනය කරන්නන් එම සංගීතයන් භාවිතා කිරීමට හෝ අවසර සහිතව මහජනතාවට ඉදිරිපත් කිරීම සඳහා ගෙවීමක් කරනු ලැබේ. සංගීතය සඳහා වන ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් ආරක්පාව විවිධ තලයන්හි හිමිකම් සහ පද රචකයන්, සංගීත නිර්මාපකයන් මුද්‍රිත සංගීත රචනා ප්‍රකාශකයන්, තැටි සමාගම්, ගුවන් විදුලි ප්‍රචාරකයින්, ප්‍රතිරූපන අයිතිය එකතු කරන සංගම් වැනි පුළුල් පරාසයක හිමිකරුවන් / පරිපාලකයින් හා සම්බන්ධ වේ.



සංගීතය නිර්මාණය කිරීම සහ පද රචනය පුද්ගලයන් දෙදෙනෙක් විසින් කර තිබුණහොත් බොහෝ විට දේශීය නීතියක් මගින් මෙය නිර්මාණ දෙකක් ලෙස එනම් සංගීතමය නිර්මාණයක් සහ සාහිත්‍යමය නිර්මාණයක් ලෙස සලකා කටයුතු කරයි.

කෙසේ වෙතත් බොහෝ අවස්ථාවල එක් සාමූහික පාලන සංවිධානයක් මගින් සමස්ත ගීතය ප්‍රචාරණය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගත හැකිය.

සංගීත ප්‍රතිරූපන හිමිකම් වලට පටිගත කිරීමේ හිමිකම ඉදිරිපත් කිරීමේ හිමිකම, පිටපත් සෑදීමේ හිමිකම අදාළ නිර්මාණය නව හෝ වෙනත් නිර්මාණයක් තුළ අඩංගු කිරීමේ (සමහර විට ව්‍යුත්පන්න නිර්මාණ ලෙස හැඳින්වේ) හිමිකම යන ඒවා අඩංගු වේ. වාණිජමය උපයෝජනය සඳහා



www.wipo.int/sme/

ඉඩ සැලසීම සඳහා බොහෝ ගීත රචකයන් ප්‍රකාශකයා නමින් හැඳින්වෙන භාවයකට තම ප්‍රතිරූපන අයිතීන් පැවරීමට වැඩි කැමැත්තක් දක්වන අතර සංගීත ප්‍රතිරූපන ගිවිසුමකින් පසුව එමගින් ප්‍රතිරූපන අයිතිය හෝ ප්‍රතිරූපන අයිතිය පාලනය කිරීමේ අයිතිය ප්‍රකාශකයාට පැවරේ.

සංගීතමය නිර්මාණයන් අදාල වන විවිධ වර්ගයේ හිමිකම් අතර ඉදිරිපත් කිරීම් පිළිබඳ හිමිකම්, මුද්‍රණය පිළිබඳ හිමිකම්, යාන්ත්‍රික හිමිකම් සහ සමකාලීනතා හිමිකම් ආදිය වේ. මේවා පහත කෙටියෙන් විස්තර කෙරේ.

මහජනයා ඉදිරියේ **ඉදිරිපත් කිරීමේ හිමිකම** (Public Performance Right) සාමාන්‍යයෙන් ගීත රචකයන් වෙත ආදායම් ලබාදෙන වඩාත්ම වාසිදායක ප්‍රභවය වේ. සමහර රටවල මෙම හිමිකම ශබ්ද පටිගත කිරීම් සඳහා හිමි නොවුව



ද සංඛ්‍යාංක ශ්‍රව්‍ය සම්ප්‍රේෂණය සඳහා හිමිය. විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල සංඛ්‍යාංක නොවන ශබ්ද පටිගත කිරීමක් ඉදිරිපත් කිරීමට බලපත්‍රයක් අවශ්‍ය නොවන නමුදු පටිගත කිරීමේ අඩංගු පාදක ගීතය සඳහා අවශ්‍ය වේ.

එක් ගීතයක් සහ ගීත සමූහයක් හෝ සංගීතමය රචනාවන් හි පිටපත් මුද්‍රණයට සහ අලෙවියට ඇති හිමිකම **මුද්‍රණ හිමිකම** (Print Right) වන අතර මෙය ප්‍රකාශකයා මගින් බලගන්වනු ලබයි.

**යාන්ත්‍රික හිමිකමක්** (Mechanical Right) විසින් ශබ්ද තැටි (හඬ පට, සංයුක්ත තැටි සහ චලන චිත්‍ර හෝ වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ වලට සම්බන්ධ කර නොමැති වෙනත් ඕනෑම ආකාරයක ශබ්දය අඩංගු දේවල්) වල ඇති ප්‍රතිරූපන අයිතිය සහිත සංගීත නිර්මාණයන් පටිගත කිරීමට, ප්‍රතිනිෂ්පාදනයට හෝ බෙදා හැරීමට ඇති හිමිකම දක්වයි. යාන්ත්‍රික හිමිකම උපයෝජනය කිරීම සඳහා ලබා දෙන බලපත්‍ර **යාන්ත්‍රික බලපත්‍ර** (Mechanical License) නම් වේ .

චලන චිත්‍රයක් රූපවාහිනී වැඩසටහනක්, රූපවාහිනී වෙළඳ දැන්වීමක් හෝ වීඩියෝ නිෂ්පාදනයක් වැනි එකක රූප රාමු හෝ පින්තූර සමග එක විට සංගීත නිර්මාණයක් පටිගත කිරීම සඳහා ඇති හිමිකම **සමකාලීකතා හිමිකම** (Synchronization - “synch”) නම් වේ . ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමක සංගීතය තිර කිරීම සඳහා අවසර ගැනීමට **සමකාලීකතා බලපත්‍රයක්** (Synchronization License) අවශ්‍ය වේ. මෙම බලපත්‍රය ලබා දීම මගින් නිෂ්පාදකයාට කිසියම් විශේෂිත සංගීත ඛණ්ඩයක් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයකට සම්බන්ධ කර ගැනීමට අවසර දේ. සාම්ප්‍රදායික වශයෙන් මෙම බලපත්‍රය ප්‍රකාශකයා සමග රූපවාහිනී නිෂ්පාදකයා විසින් සංගීත නිර්මාණකරු සහ පද රචකයා සමග හෝ බොහෝ විට ප්‍රකාශකයා සමග සෘජු ගනුදෙනුවකින් පසු ලබා ගැනේ.

ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමක ඇති සංගීතය භාවිතා කිරීමට සංගීත නිර්මාණකරුගෙන් ලබාගත යුතු අවසරයට අමතරව අදාල සංගීත නිර්මාණය ඇතුළත් තැටිය පටිගත කළ හිමිකරුගෙන් වෙනම "Sync " බලපත්‍රයක් ලබාගත යුතුය.

පටිගත කිරීමේ නිෂ්පාදකයන් හෝ ශිල්පීන් මහජනයාට අලෙවි කරන සංගත තැටි හෝ හඬ පටි සෑදීමට යොදාගන්නා හඬ පටි හෝ වෙනත් ආවයන මාධ්‍යයක ගබඩා කළ මුලින්ම නිපද වූ හඬ පටිගත කිරීම් මාස්ටර් රෙකෝඩින්ග් ලෙස හඳුන්වයි. යම් විශේෂිත කලාකරුවකුගේ සංගීත නිර්මාණයක යම් විශේෂිත ඉදිරිපත් කිරීමක් ඇතුළත් වන හඬ පටිගත කිරීම් හිමිකම් හෝ මාස්ටර් භාවිතා හිමිකම් අවශ්‍ය වේ.

සංගීතය භාවිතා කරන ක්ෂේත්‍ර අතරින් ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන ක්ෂේත්‍රයක් ලෙස ජංගම දුරකථන නාද රටා සඳහා සංගීත නිර්මාණ යොදාගැනීම දැක්විය හැකිය. ජංගම දුරකතනයේ පුද්ගලිකතාවය ඇති කිරීමේ විනෝදාත්මක සහ විශාල වශයෙන් ජනප්‍රිය මාර්ගයක් බවට එය පත්ව ඇත. දුරකථන නාද රටා වල ජනප්‍රියතාව මුලින් බලාපොරොත්තු වූවාට වඩා වඩාත් පුළුල් පැතිරීමක් සහ කල්පැවැත්මක් සහිත බව ඔප්පු කර ඇති අතර එහි ජනප්‍රියතාව, නව ආකාරයේ




සංගීත භාවිතාව, ජංගම දුරකථන වල පහසුකම් සඳහා ගෙවා ලබා ගත යුතු ආකාරයේ පහසුකම් අතර ප්‍රමුඛස්ථානයක තබා ඇත. දුරකථන නාද




*නොකියා සමාගමේ අනුමැතිය සහිතව භාවිත කරන ලදී.*

රටාවක් යනු SMS හෝ WAP මගින් ජංගම දුරකථනයකට යවන ද්විමය කේත ගොනුවකි.

නාද රටා පිළිබඳ බලපත්‍රය සාමාන්‍යයෙන් දුරකථන නාද රටා වල ඒකතාල නාද රටා සහ බහුතාල නාද රටා යන දෙවර්ගයම නිර්මාණයේ සහ බෙදා හැරීම ආවරණය කරයි.

ඩිජිටල් හිමිකම් පරිපාලනය 1™ Digital Rights Management (DRM) හි මොලම් සහ ක්‍රමවේදයන් මාර්ග ගත (Online) සංගීත අලෙවියන් පරිපාලනය මගින් නීති විරෝධී උපුටා ගැනීම් වැළැක්වීම සඳහා වැදගත් මෙහෙයක් ඉටු කරයි. උදාහරණයක් ලෙප ඇපල් සමාගමේ ෆෙයාප්ලේ තාක්ෂණය හා මයික්‍රොසොෆ්ට් හි වින්ඩෝස් මීඩියා මගින් ඩිජිටල් සංගීතය සඳහා බාධක යෙදීමෙන් ප්‍රතිරූපන අයිතිය හිමිකරුවන් සඳහා ඔවුනගේ නිර්මාණ අලෙවියේදී වන්දි ලැබීමට සැලැස්වීම මගින් ඒවායේ ඩිජිටල් පිටපත් සෑදීම අඩුකොට ඇත.

## ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් කොතරම් කලක් පවතී ද ?

බොහෝ නිර්මාණ සඳහා බොහොමයක් රටවල ආර්ථික හිමිකම් මගින් ලැබෙන ආරක්පාව කතෘ ගේ ජීවිත කාලයට සහ අඩුම වශයෙන් අවුරුදු 50 ක අමතර කාලයක් පවතී. තවත් රටවල් ගණනාවක මෙම කාලය ඉහත කාලයටත් වඩා වැඩිය (උදාහරණයක් ලෙස යුරෝපයේ, ඇමරිකා එක්සත් ජනපදයේ සහ වෙනත් රටවල් කිහිපයක මෙය කතෘ ගේ මරණයෙන් පසු අවුරුදු 70 ක් වේ.) එම නිසා මෙයින් කතෘ පමණක් නොව ඔහුගේ උරුමකරුවන් ද ප්‍රයෝජනය ලබයි. කතෘන් කිහිපදෙනෙක් නිර්මාණයට සම්බන්ධ නම් (බද්ධ කතෘත්වයක් ඇති නිර්මාණ ) ආරක්පාව පිළිබඳ කාලය ගණනය කරන්නේ අන්තිමට ජීවත් වූ කතෘ ගේ මරණයෙන් පසුවය. නිර්මාණයක ප්‍රතිරූපන අයිතියේ ආරක්පාව අවසාන වූ පසු එම නිර්මාණය පොදු ස්වාමිත්වයේ :ජමඉකසජ ාදප්සබ- ඇති නිර්මාණයක් බවට සලකනු ලැබේ. සමහර වර්ගවල නිර්මාණ සඳහා දේශීය නීතිය මත පදනම් වූ විශේෂිත කොන්දේසි භාවිතා විය හැකිය. විශේෂයෙන්,

- සේවකයන් විසින් කළ නිර්මාණ සහ විශේෂ නියමයෙන් කළ නිර්මාණ (උදාහරණ ලෙස කාල සීමාව ප්‍රකාශනයෙන් අවුරුදු 95 ක් දක්වා හෝ නිර්මාණයෙන් අවුරුදු 120 ක් දක්වා විය හැකිය ) ;
- බද්ධ කතෘත්වයෙන් යුත් නිර්මාණ;
- චලන චිත්‍ර නිර්මාණ;
- නිර්නාමික හෝ ව්‍යාජ නම් දරණ නිර්මාණ;
- ඡායාරූපමය නිර්මාණ සහ ව්‍යවහාරික කලාව පිළිබඳ නිර්මාණ (සමහර විට මේවාට වඩා කෙටි කාලීන ආරක්පාවක් ඇත)
- රජය මගින් කළ නිර්මාණ (සමහරක් හෝ සියල්ලම ප්‍රතිරූපන අයිතියේ ආරක්පාවෙන් තොර විය හැකිය)
- කතෘගේ මරණයෙන් පසු ප්‍රකාශනයට පත් කළ නිර්මාණ ;
- මුද්‍රණ ශිල්පීමය සකස් කිරීම්

සදාචාරමය හිමිකම් සඳහා වන ආරක්පිත කාලය වෙනස් වේ. සමහර රටවල සදාචාරමය හිමිකම් සදාකල්හි පවතී. අනෙක් රටවල ඒවායේ පැවැත්ම ආර්ථික හිමිකම් වල පවතින කාලයට හෝ කතෘ ගේ මරණය තෙක් පවතී.

**සම්බන්ධිත හිමිකම්** වල ආරක්පාව පවතින කාල සීමාව සාමාන්‍යයෙන් ප්‍රතිරූපන අයිතියේ කාල සීමාවට වඩා අඩුය. සමහර රටවල සම්බන්ධිත හිමිකම් නිර්මාණය නිර කිරීම, ඉදිරිපත් කිරීම හෝ ගුවන් විදුලි ප්‍රචාරණය සිදුවූ කැලැන්ඩර් වර්ෂයේ අවසානයේ සිට අවුරුදු 20 ක කාලයක් දක්වා ආරක්පා වේ. කෙසේ වෙතත් බොහෝ රටවල මෙම කාලසීමාව නිර්මාණය එළ දැක්වීම නිර කිරීම හෝ ප්‍රචාරණය කළ කැලැන්ඩර් වර්ෂයේ අවසානයේ සිට අවුරුදු 50 ක් දක්වා විය හැකිය.



සමහර රටවල ඡායාරූප වල ආරක්පාව පවතින්නේ ප්‍රකාශනයට පත් කළ දිනයේ සිට අවුරුදු 5 ක් හෝ 15 ක් දක්වා පමණි.

# 3. මූල් නිර්මාණ ආරක්ෂා කිරීම

## ප්‍රතිරූපත අයිතියේ සහ සම්බන්ධිත හිමිකම් වල ආරක්ෂාව ලබා ගැනීමට ඔබ කළ යුත්තේ මොනවාද ?

ප්‍රතිරූපත අයිතිය සහ සම්බන්ධිත හිමිකම් වලින් ලැබෙන ආරක්පාව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයකින් තොරවම ලැබේ. කිසියම් නිර්මාණයක් එහි පැවැත්ම ආරම්භ වූ විගසම කිසිදු විශේප ලියාපදිංචියකින් , තැන්පතුවකින්, ගාස්තුවක් ගෙවීමකින් හෝ කිසිදු විධිමත් නියමයන්ගෙන් තොරව නිරායාසයෙන්ම ආරක්පා වේ. එසේ වූවද සමහර රටවලදී නිර්මාණය යම් ද්‍රව්‍යමය ආකාරයකට තිර කිරීම අවශ්‍ය වේ.

## ප්‍රතිරූපත අයිතිය හිමිකරු ඔබ බව ඔප්පු කරන්නේ කෙසේද ?

විධිමත් නියමයන්ගෙන් තොරවූ ආරක්පිත ක්‍රමවේදයක් හරහා කිසියම් ආරවුලක දී ඔබගේ අයිතීන් වල වලංගුභාවය තහවුරු කිරීමට යාමේදී විවිධ අපහසුතා මතුවිය හැකිය. ඇත්ත වශයෙන්ම යමෙක් ඔහු / ඇය ගේ නිර්මාණයක් අනුකරණය කළ බවට චෝදනා කරන විට ඔබ මූල් නිර්මාණකරු බව ඔප්පු කරන්නේ කෙසේ ද ? මේ සඳහා නියමිත වෙ.ලාවට සමහර පූර්වෝපයන් ගැනීමෙන් නිර්මාණයේ කතෘ ඔබ බව දැක්වෙන සාක්පි ගොඩනගා ගත හැකිය. උදාහරණ ලෙස,

- සමහර රටවල ගාස්තුවක් අය කිරීමකින් ඔබගේ නිර්මාණය ජාතික ප්‍රතිරූපත අයිතිය පිළිබඳ කාර්යාලයක තැන්පත් කිරීම සහ / හෝ ලියාපදිංචි කිරීම අවස්ථාවක් සපයයි. (ජාතික ප්‍රතිරූපත අයිතිය පිළිබඳ කාර්යාල වල වෙබ් අඩවි නාමාවලියක් සඳහා උපග්‍රන්ථය 11 බලන්න) මෙලෙස කිරීමෙන් ප්‍රතිරූපතඅයි තියේ ආරක්පාව ලබා ගැනීමට වලංගු සාක්පියක පැවැත්ම තහවුරු කරයි. ඒවාහි සමහර රටවල ඔබගේ නිර්මාණය

## බහුමාධ්‍ය නිපැයුම් සඳහා ප්‍රතිරූපත අයිතිය



බහුමාධ්‍ය නිපැයුමක් සාමාන්‍යයෙන් පරිගණක තැටියක් හෝ සංගත තැටියක් වැනි ස්ථාවර මාධ්‍යයක ගබඩා කළ විවිධ වර්ග වල නිර්මාණ වලින් යුක්ත වේ. බහුමාධ්‍ය නිපැයුම් වලට උදාහරණ ලෙස වීඩියෝ ක්‍රීඩා, තොරතුරු කුටි සහ විවිධ අන්තර් ක්‍රියාකාරි වෙබ් පිටු දැක්විය හැකිය. බහුමාධ්‍ය නිපැයුමකට අඩංගු කළ හැකි අංග අතර සංගීතය, අක්පර, ඡායාරූප, කුඩා චිත්‍ර, චිත්‍ර, මෘදුකාංග සහ සම්පූර්ණ චලන වීඩියෝ ආදිය වේ මේ එක් එක් අංග ඒවායේ හිමිකම් සඳහා වන ප්‍රතිරූපත අයිතිය සඳහා වෙන් වෙන් වශයෙන් සුදුසුකම් ලබයි. තවද මෙම නිර්මාණයන් සම්පාදනය හෝ බද්ධ කිරීමේ ක්‍රියාවලිය නිසා එය නවමු නිර්මාණයක් ලෙස සැලකෙයි නම් මෙම බහුමාධ්‍ය නිපැයුම් සඳහා එයටම හිමි ප්‍රතිරූපත අයිතිය ලබා ගත හැකිය.

ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳ කාර්යාලයක ලියාපදිංචි කර ඇත්නම් ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය පිළිබඳ නඩු ඉතා කාර්යක්ෂමව පවත්වාගෙන යා හැකිය. එවැනි රටවල පූර්වයෙන් ලියාපදිංචි වී සිටීම වඩාත් සුදුසුය.

- ඔබගේ නිර්මාණයේ පිටපතක් බැංකුවක හෝ නීතිඥයෙකු ළඟ තැන්පත් කළ හැකිය. විකල්ප පියවරක් ලෙසින් ඔබගේ නිර්මාණයේ පිටපතක් ඔබ විසින්ම මුද්‍රිත කවරයක බහා විශේෂ තැපැල් සේවාවක් මගින් යැවිය හැකි අතර බෙදාහැරීමේ දී කවරය විවෘත නොවී තිබිය යුතුය. (කවරය මත පැහැදිලි දින මුද්‍රාවක් තිබිය යුතුය.) කෙසේ නමුදු මෙම ක්‍රියාමාර්ගය වලංගු සාක්ෂියක් ලෙස සියළු රටවල් පිළිගන්නේ නැත.
- ප්‍රකාශයට පත්කළ නිර්මාණ මත **ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සටහනක්** තැබිය යුතුය.
- නිර්මාණය විශේෂිත සම්මත **හඳුනාගැනීමේ අංකන ක්‍රම** වේදයක් භාවිතා කොට සළකුණු කිරීම ද සුදුසුය. මෙවැනි ක්‍රමවේද වලට උදා: පොත් සඳහා අන්තර් ජාතික සම්මත පොත් අංකය (International Standad Book Number - ISBN) ; ශබ්ද පටිගත කිරීම් සඳහා අන්තර් ජාතික සම්මත පටිගත කිරීමේ කේතය (International Standard Recording Code - ISRC) මුද්‍රිත සංගීත ප්‍රතිරූපන සඳහා අන්තර් ජාතික සංගීත අංකය (International Standard Music Number - ISMN) ;සාමූහික පරිපාලන සංවිධාන මගින් පාලනය කරන සංගීත සමූහයන් හි අඩංගු සංගීත නිර්මාණයන් සඳහා අන්තර් ජාතික සම්මත සංගීත නිර්මාණ කේතය (International Standard Musical Work Code - ISWC) ; ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ සඳහා අන්තර් ජාතික සම්මත ශ්‍රව්‍ය දෘශ්‍ය අංකය (International Standard Audiovisual Number - ISAN)

## ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් ආකාරයෙන් ඇති නිර්මාණ ආරක්ෂා කරන්නේ කෙසේද ?

ඉලෙක්ට්‍රොනික හෝ සංඛ්‍යාංක (Digital) ආකාරයෙන් ඇති නිර්මාණ (උදා - CD , DVD, මාර්ගගත (On line) අක්ෂර, සංගීතය, චිත්‍රපට) බොහෝ විට ගුණාත්මක භාවයේ සැලකිය යුතු හානියක් නොමැතිව පිටපත් කිරීම සහ අන්තර්ජාලය හරහා සම්ප්‍රේෂණය ඉතා පහසු නිසා විශේෂයෙන්ම හිමිකම් උල්ලංඝනයට පහසුවෙන් ගොදුරු වේ. ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳ කාර්යාලයක ලියාපදිංචි වීම වැනි ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ග මෙවැනි නිර්මාණ සඳහාද භාවිතා වේ.

ව්‍යාපාරයන් ප්‍රතිරූපන අයිතියෙන් සුරැකි මාර්ගගත (On line) නිර්මාණ සපයන විට සාමාන්‍යයෙන් එය නිර්මාණයේ අඩංගු දැ සමග භාවිතා කරන්නාට කළ හැකි දේ සීමා කිරීමේ ගිවිසුමක් (Mouse Click Contract) අනුව සිදුවේ. එවැනි සීමාකිරීම් මගින් සාමාන්‍යයෙන් භාවිතය තනි පුද්ගලයෙකුට සීමා කරන අතර නිර්මාණයේ තනි පිටපතක් එක් වරක් කියවීමට / ඇසීමට සළස්වයි. නැවත බෙදාහැරීම හෝ නැවත භාවිතය සාමාන්‍යයෙන් තහනම් කෙරේ.

තවද බොහෝ ව්‍යාපාරයන් සංඛ්‍යාංකමය අන්තරගතයන් සඳහා වන ඔවුන්ගේ ප්‍රතිරූපන අයිතිය ආරක්ෂා කිරීමට තාක්ෂණික උපක්‍රම යොදා ගනී. එවැනි උපක්‍රම සාමාන්‍යයෙන් සංඛ්‍යාංක හිමිකම් කළමනාකරණ (Digital Right Management - DRM) මෙවලම් සහ ක්‍රම ලෙස හැඳින්වේ. මේවා නිර්මාණයන් පවතින තාක් කල් ඒවා සඳහා වන අවසරයන් හා තත්වයන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් අර්ථ දැක්වීමට, නිරීක්ෂණයට සහ බලගැන්වීමට භාවිතා කෙරේ.

සංඛ්‍යාංක නිර්මාණ සඳහා වන ප්‍රතිරූපන අයිතිය පාලනය සඳහා සංඛ්‍යාංක හිමිකම් කළමනාකරණ මෙවලම් සහ ක්‍රම උදව්වන ආකාර දෙකක් ඇත.

- **"හිමිකම් කළමනාකරණ තොරතුරු"** ලෙස හැඳින්වෙන ප්‍රතිරූපන අයිතිය නිර්මාණයේ හිමිකරු ආදිය පිළිබඳ තොරතුරු සංඛ්‍යාංක (Digital) නිර්මාණයන් හි සඳහන් කිරීම්
- සංඛ්‍යාංක නිර්මාණ වලට ප්‍රවේශය හෝ භාවිතය පාලනයට (අවසර දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට) උපකාර වන තාක්ෂණික ආරක්ෂක විධික්‍රම (Technical Protection Measures (TPMS) ) භාවිතා කිරීම මෙම විධික්‍රම :ඔජඵී– විවිධ ආකාරයේ ප්‍රතිරූපන අයිතින් සම්බන්ධයෙන් යොදා ගැනීම මගින් අදාල ප්‍රතිරූපන අයිතීන් හෝ සම්බන්ධිත හිමිකම නීති වලට අනුකූලව නිර්මාණය බැලීම . ඇසීම වැඩි දියුණු කිරීම, පටිගත කිරීම, උපුටා ගැනීම , පරිවර්තනය, නියමිත කාල සීමාවක් තබාගැනීම, වෙනත් කෙනෙකුට යැවීම, පිටපත් කිරීම, මුද්‍රණය ආදිය සඳහා භාවිතා කරන්නට ඇති හැකියාව පාලනයට උදව් දෙයි. මෙම විධික්‍රම (TPMS) පෞද්ගලිභාවය ආරක්ෂාව සහ අන්තරගතයේ අඛණ්ඩතාවය ද සහතික කරයි.

## සුදුසු (DRM) මෙවලම් තෝරා ගැනීම

ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය :ඍඍඑ– මෙවලම් සහ විධික්‍රම භාවිතය තුළින් අවම කිරීමට බොහෝ තාක්ෂණික විධි ඇත. ඒ එකිනෙකෙහි වෙනසු වූ ශක්‍යතා සහ දුර්වලතා මෙන්ම ලාභ සහ නඩත්තු වියදම් ඇත. නිර්මාණය භාවිතය හා සම්බන්ධිත අවධානම පිළිබඳ ඔබගේ තක්සේරුව මත විශේෂිත තාක්ෂණික ක්‍රමයක් තෝරා ගැනීම තීරණය වේ

## හිමිකම් කළමනාකරණ තොරතුරු

ඔබගේ ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂිත දෑ හඳුනා ගැනීමට විවිධ මාර්ග ඇත. හැකිය

- සංඛ්‍යාංක අන්තරගතයන් ප්‍රතිරූපන අයිතිය පිළිබඳ දැන්වීමකින් හෝ අවවාදයක් දැක්වෙන වාණිජමය නොවන කටයුතු සඳහා පමණක් ප්‍රතිනිප්පාදනය කළ හැකිය වැනි ලේබලයකින් ලේබල් කළ හැකිය. ඔබගේ ව්‍යාපාරික වෙබ් අඩවියේ සෑම පිටුවකම අන්තර්ගතයන් භාවිතා කිරීම පිළිබඳ කොන්දේසි සහ නියමයන් දැක්වෙන ප්‍රතිරූපන අයිතිය පිළිබඳ වගන්තියක් ඇතුළත් කිරීම ද සුදුසු ක්‍රියාමාර්ගයක් වේ
- සංඛ්‍යාංක වස්තූන් හඳුනාගනු ලබන්නා (Digital object indentifier (DOI) ) ඩිජිටල් වටපිටාවක් තුළ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ක්‍රියා හඳුනාගැනීම සඳහා වූ ක්‍රමවේදයකි. (DOI) යනු අන්තර් ජාලයේ භාවිතය සඳහා ඩිජිටල් ආකාරයේ නිර්මාණයන්ට දෙනු ලබන හැඳුනුම් සංකේතයනකි. ඒවා නිර්මාණය අන්තර් ජාලයේ සොයා ගත හැකි තැන් ඇතුළත්ව නිර්මාණය පිළිබඳ වර්තමාන තොරතුරු සැපයීමට භාවිතා කෙරේ. ඩිජිටල් නිර්මාණයක් සොයා ගත හැකි තැන් ඇතුළු එම නිර්මාණය පිළිබඳ තොරතුරු කාලය සමග තවනස් විය හැකි වුවත් එහස (DOI) නාමය වෙනස් නොවෙ..
- කාල මුද්‍රාවක් (Time Stamp) යනු සංඛ්‍යාංක නිර්මාණ වලට යොදනු ලබන ලේබලයක් වන තඅර එයට යම් අවස්ථාවක නිර්මාණයේ අන්තර්ගතයේ තත්වය කුමක් ද යන්න ඔප්පු කළ හැකිය. යම් විශේෂිත විද්‍යුත් ලිපියක් යැවීමේදී, කොන්ත්‍රාත්තුවක් සඳහා එකග වීමක දී, යම් බුද්ධිමය දේපලක් නිර්මාණයේ දී හෝ නවීකරණයේදී හෝ සංඛ්‍යාංක

සාක්ෂියක් ගැනීමේ දී සිදුවන ප්‍රතිරූපන අයිතිය උල්ලංගනයක් ඔප්පු කිරීමේ දී කාලය තීරණාත්මක සාධකයකි.

- සංඛ්‍යාංක දිය සටහන් (Digital Water Mark) සංඛ්‍යාංක නිර්මාණ තුළම ප්‍රතිරූපන අයිතිය පිළිබඳ තොරතුරු ගැබ් කරවීමට මෘදුකාංග භාවිතා කරයි. සංඛ්‍යාංක දිය සටහන් ඡායාරූපයක කෙළවරක දැකිය හැකි ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සටහනක් වැනි ඍජුවම දර්ශනය වන ආකාරයේ හෝ දිය සටහන් සහිත කඩදාසි වල මුද්‍රිත ලියවිලි මෙන් ලියවිල්ල පුරා ඔබ්බවා ඇති සේ හෝ විය හැකිය. බොහෝ විට මේවා නිර්මාණ තුළ ගිල්වා මෙන් ඇති අතර එම නිසා සාමාන්‍ය භාවිතයේ දී එතරම් නොපෙනේ. දෘශ්‍යමාන දිය සටහන් ප්‍රතිරූපන අයිතිය භාවිතයේ අකටයුතුකම් වළක්වාලීම සඳහා ප්‍රයෝජනවත් අතර අදෘශ්‍යමාන දිය සටහන් සොරකම් සහ මාර්ග ගත පිටපත් කිරීම් (On line tracing ) ඔප්පු කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ.

## තාක්ෂණික ආරක්ෂණ උපක්‍රම

(Technological Protection Measures (TPMs)

සමහර නිර්මාණ තම නිර්මාණයන්ට ප්‍රවේශ වීම එම නිර්මාණයන් හි භාවිතා සඳහා වන කොන්දේසි සහ නියමයන් පිළිගන්නා පාරිභෝගිකයන් හට පමණක් සීමා කිරීම සඳහා තාක්ෂණය භාවිතයට වඩා කැමැත්තක් දක්වයි. එවැනි ක්‍රම තුළ පහත දැ අඩංගු විය හැකිය.

- මෘදුකාංග නිෂ්පාදන ශබ්ද වාහිනී සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ වැනි ඒවායේ අනවසර භාවිතා ආරක්ෂා කිරීම සඳහා බොහෝ විට අක්ෂර කේතයන් බවට හැරවීම (Encryption) භාවිතා වේ. උදාහරණයක් ලෙස පාරිභෝගිකයෙක් නිර්මාණයක් අන්තර්ජාලයෙන් ලබා ගන්නා විට පාරිභෝගිකයා හට එහි අන්තර්ගතය නැරඹීමට හෝ සවන්දීම සඳහා අවශ්‍ය වන ගෙවීම් පිළියෙළ කිරීමට ගොනුව නැවත කියවිය හැකි සේ ඉදිරිපත් කිරීමට (Decrypt) සහ මුරපදයක් වැනි දෙයක් ලබාදීමට

## තාක්ෂණික ආරක්ෂක උපක්‍රම භාවිතයේ දී සැළකිය යුතු කරුණු

ප්‍රතිනිෂ්පාදනය සහ බෙදාහැරීමට එරෙහිව ආරක්ෂාවක අවශ්‍යතාව ඇති නම් එවැනි නිර්මාණ ඉදිරිපත් කරනු ලබන ව්‍යාපාරයන් තාක්ෂණික ආරක්ෂක උපක්‍රම (Technological Protection Measures - TPMs ) භාවිතය පිළබඳ සළකා බලනු ඇත. කෙසේ නමුදු මේවායේ භාවිතය අනෙකුත් කාරණා සමග සමබර විය යුතුය. උදාහරණයක් ලෙස පුද්ගලිකභාවය පිළිබඳ නීති. පාරිභෝගික ආරක්ෂණ නීති. හෝ ප්‍රතිකරාග ක්‍රියාකාරකම් වලට එරෙහි නීති වැනි භාවිතයේ පවතින නීති උල්ලංගනය වන ආකාරයට තාක්ෂණික ආරක්ෂක උපක්‍රම යොදා නොගත යුතුය.

අනෙක් පුද්ගලයන් ගේ සංඛ්‍යාංක අන්තර්ගතයන් තුළින් ප්‍රයෝජන ලබන ව්‍යාපාරයන් එම අදාල භාවිතා සඳහා අවශ්‍ය සියළු බලපත්‍ර හෝ අවසරයන් ලබා ගත යුතුය. මක් නිසාද යත් යම් පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් තාක්ෂණික ආරක්ෂාක උපක්‍රම වලින් බේරී එම ආරක්ෂිත නිර්මාණ භාවිතා කළහොත් එය වංචාවට එරෙහි නීති කඩ කිරීමට මෙන්ම ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනයට ද අදාල වන නිසාය.

ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් පාලනය කරන ආයතනයකට ඔහුව සම්බන්ධ කිරීමට සෑම මෘදුකාංග වලට හැකිය

- **ප්‍රවේශ පාලන හෝ තත්වාරෝපිත ප්‍රවේශ පාලන පද්ධතියක්** මගින් යම් නිර්මාණයක් භාවිතාකරන්නාගේ අනන්‍යතාව, අන්තර්ගත ගොනු සහ වරප්‍රසාද (කියවීම, වෙනස් කිරීම, සම්පාදනය ආදිය) පරීක්ෂා කර බලයි. ඩිජිටල් නිර්මාණයක හිමිකරුවෙකුට ඒ සඳහා ඇති ප්‍රවේශය බොහෝ ආකාර වලින් සැකසිය හැකිය. උදාහරණයක් ලෙස ලේඛනයක් නැරඹිය හැකි වුව ද මුද්‍රණය කළ නොහැකි විය හැකි හෝ භාවිතය සීමාසහිත කාලයක් සඳහා සීමා කළ හැකිය.
- **ගුණාත්මක බවින් හීන සංස්කරණ පමණක් ප්‍රචාරණය කිරීම** උදාහරණයක් ලෙස ව්‍යාපාරයක් ඔවුන්ගේ වෙබ් අඩවි වලට සගරාවක පළකිරීමට තරම් විස්තර සහ ගුණාත්මක භාවයෙන් යුක්ත නොවුවත් ඒවා ප්‍රයෝජනවත් දැයි තීරණය කිරීමට තරම් ප්‍රමාණවත් විස්තර සහිතව ඡායාරූප සහ වෙනත් අනුරූප ඇතුළත් කළ හැකිය.

## සිද්ධි අධ්‍යයනය – Memory Computación

වසර 2001 දී නිව්යෝර්ක් නුවරදී මයික්‍රොසොෆ්ට් ආයතනය Office XP දියත් කරද්දී Office XP වලට එකතු කිරීමට එැපදරහ ඝදබඑහ නම් ව්‍යාපාරයන් සඳහා වන ගිණුම්කරන මෘදුකාංගයක් ද ඉදිරිපත් කළේය. මේ මෘදුකාංගය නිර්මාණය කළේ උරුගුවේ හි කුඩා මෘදුකාංග සමාගමක් වන මෙමරි කොම්පියුටේෂන් ( "Memory") විසිනි.

Memory සමාගම එහි අයිතිය මගින් අත්කර ගත හැකි හොඳම වාණිජමය ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සමාගමේ හිමිකම් ආරක්ෂාවට, පරිපාලනයට සහ බලගැන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව තක්සේරු කර බලයි. Memory Conty මෘදුකාංගයන්හි සෑම පිටපතකම, එහි භාවිතයට ඉවහල් වන උපස්ථ පිටපත් (Back-up copy) ගැනීම හැර කිසිම හේතුවක් සඳහා සමස්තයම හෝ කොටසක් පිටපත් කිරීම හෝ ප්‍රති නිෂ්පාදනය වළක්වන, ප්‍රකාශන අයිතිය මගින් මෘතිකාංගය ආරක්ෂා කර ඇති බව දක්වෙන අයිතිකරුගේ බලපත්‍රයක් අඩංගු වේ. Memory සමාගම එය ක්‍රියාත්මක වන රටවල්වල ඇති ප්‍රකාශන අයිතිය ස්වේච්ඡාවෙන් ලියාපදිංචියට ඉඩ සලසන ප්‍රකාශන අයිතිය පිළිබඳ කාර්යාලයන්හි තම මෘතිකාංග ලියාපදිංචි කළේය.

Memory සමාගම බුද්ධිමය දේපල හිමිකම් උල්ලංඝනය, විශේෂයෙන්ම මෘතිකාංග අනවසරයෙන් පිටපත් කිරිබ්ම පිළිබඳ දැනුවත් නිසා ඊට සමාන්තරව ඔවුන්ගේ නිපැයුම්වල ආරක්ෂාවට උපාය මාර්ග සකසා ඇත. ප්‍රථමයෙන් ම එම සමාගම මෘදුකාංග පහසුවෙන් පිටපත් කිරීම වැළැක්වීමට තාක්ෂණික යාන්ත්‍රණ සහිත මෘතිකාංග පෙළක් සංස්ථාපිත කළේය. දෙවනුව Memory සමාගම අවධානය යොමු කළේ ඔවුන්ගේ නීත්‍යානුකූල පාරිභෝගිකයන් හට ලබාදිය යුතු අලෙවියෙන් පසු සේවයේ ගුණාත්මක භාවයට සහ නව සංස්කරණවල අඛණ්ඩ නවෝත්පාදනය කෙරෙහි වූ අතර එමනිසා සමාගමේ පාරිභෝගිකයන් ව්‍යාජ මෘදුකාංග වලට වඩා නීතියානුකූල මෘදුකාංග ප්‍රිය කරන අතර ඒවා මිලදී ගැනීමේ වටිනාකම ද වටහා ගනී.

## විදේශයකදී ලැබෙන්නේ කෙබඳු ආරක්ෂාවක් ද?

බොහෝ රටවල් **එක් රටකට නිර්මාණය වූ ප්‍රකාශන අයිතිය හිමි නිර්මාණයක් අන් සියලු සාමාජික රටවලට ද නිරායාසයෙන්ම ආරක්ෂිත බවට** සහතික වන අන්දමේ අන්තර්ජාතික ගිවිසුම් එකක හෝ කිහිපයක සාමාජිකයෝ වෙති. ප්‍රකාශන අයිතිය පිළිබඳ ඉතාමත් වැදගත් ගිවිසුම වන්නේ **සෞන්දර්යාත්මක හා සාහිත්‍යමය නිර්මාණවල ආරක්ෂාව සඳහා වූ බර්නි (Berne) ගිවිසුමයි**. (Berne Congention for the Protection of Literary and Artistic work) (උපග්‍රන්ථය III බලන්න) ඔබ බර්නි ගිවිසුමේ සාමාජිකයෙකු වන රටක ස්වදේශිකයෙකු හෝ පදිංචිකරුවෙකු නම් හෝ එම සාමාජික රටක ඔබේ නිර්මාණය ප්‍රකාශයට පත් කොට ඇත්නම් මෙම ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වයන් වන අනෙක් සියලු රටවල් සඳහා බර්නි ගිවිසුමෙන් ප්‍රදානය කොට ඇති මට්ටමේ ප්‍රකාශන අයිතියක් ඔබේ නිර්මාණය සඳහා ඉබේම හිමි වේ.

කෙසේ වෙතත් ප්‍රකාශන අයිතිය පිළිබඳ ආරක්ෂාව එහි ස්වාභාවය අනුව නිශ්චිත **ප්‍රදේශයකට සීමා වේ**. එම නිසා ඔබගේ නිර්මාණය අදාළ රටෙහි ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතියේ නීතිමය අවශ්‍යතා සපුරා ඇත්නම් පමණක් එයට ප්‍රකාශන අයිතියේ ආරක්ෂාව ලැබේ. එමනිසා ඔබගේ නිර්මාණය බොහෝ රටවලට ඉබේටම පාහේ ප්‍රකාශන අයිතිය මගින් සුරැකෙන නමුත් (අන්තර්ජාතික ගිවිසුම් නිසා) රටින් රටට සැලකිය යුතු අයුින් වෙනස් වන වෙන් වූ ප්‍රකාශන අයිතියක් සෑම රටකටම ඇත.

## ප්‍රකාශන අයිතිය පිළිබඳ දැන්වීමක් නිර්මාණය මත තිබීම අත්‍යවශ්‍යද?

බොහෝ රටවලදී ආරක්ෂාව සඳහා ප්‍රකාශන අයිතිය දැක්වෙන **දැන්වීමක්** අවශ්‍ය නොවේ. කෙසේ වුවද නිර්මාණය මත හෝ ඊට සම්බන්ධිතව ප්‍රකාශන අයිතිය පිළිබඳ දැන්වීමක් තිබීම අත්‍යවශ්‍ය වන්නේ එමගින් නිර්මාණය ප්‍රකාශන අයිතිය සහිත එකක් බව ජනතාවට මතක් කිරීමත්, ප්‍රකාශන අයිතිකරුව හඳුන්වා දෙන නිසාත්ය. එවැනි හඳුන්වා දීමක් නිර්මාණය භාවිතය සඳහා පූර්ව අනුමැතියක් ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලයන්ට උපකාරී වේ. ප්‍රකාශන අයිතිය පිළිබඳ දැන්වීමක් යොදම ඉතා වියදම් - සඵල ආරක්ෂණ ක්‍රමයකි. එයට සැලකිය යුතු අමතර වියදමක් දීමට අවශ්‍ය නොවූවද එමගින් ඔබගේ නිර්මාණය අන්‍යයන් විසින් පිටපත් කිරීම වළක්වා ලීමෙන් ජීවැය ඉතුරු වීම මෙන්ම ප්‍රකාශන අයිතිය දරන්නා හඳුනා ගැනීම පහසු කීමෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියට ඉඩ සළසයි.

තවද සමහර අධිකරණ බල සීමා තුළ, විශේෂයෙන් ම ඇමෙරිකා එක්සත් ජනපදයේ වලංගු දැන්වීමක් ඇතුලු කිරීම ම හිමිකම් උල්ලංඝනය කරන්නා අදාළ නිර්මාණයේ ප්‍රකාශන අයිතිය පිළිබඳ තත්වය දැන සිටි බවට සිතනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස අධිකරණයක් විසින් එම පුද්ගලයා සිතාමතා හිමිකම් උල්ලංඝනය කීමේ වරදට වගකිය යුතු බව සලකනු ලබන අතර අවිහිංසාවාදි හිමිකම් උල්ලංඝනයකට වඩා බොහෝ වැඩි දඩුවමකට ලක් වේ.

නිර්මාණය මත දැන්වීමක් යොදන විධිමත් ක්‍රියා පිළිවෙළක් නොමැත. එය ලියන ලද්දක්, යතුරු ලියනය කරන ලද්දක්, මුද්‍රා තැබීමක් හෝ අඳින ලද්දක් විය හැකි. ප්‍රකාශන අයිතිය පිළිබඳ දැන්වීමක සාමාන්‍යයෙන් පහත ඒවා අඩංගුය.

- "ප්‍රකාශන අයිතිය" යන වචනය හෝ ප්‍රකාශන අයිතිය හඟවන සංකේතය ©;
- පළමුවෙන්ම නිර්මාණය ප්‍රකාශයට පත් කළ වර්ෂය
- ප්‍රකාශන අයිතිකරුගේ නම

***උදා*** :- ප්‍රකාශන අයිතිය 2006, ABC Ltd.

නිර්මාණයක් සැලකිය යුතු තරම් නවීකරණයට ලක් කරන්නේ නම් සෑම නවීකරණයකට ම අදාළ වසර එකතු කිරීමෙන් ප්‍රකාශන අයිතිය පිළිබඳ දැන්වීම යාවත්කාලීන කළ යුතුය. උදාහරණයක් ලෙස, ,2000, 2002, 2004, යන්නෙන් නිර්මාණය වසර 2000 ට නිර්මාණය කොට 2002 සහ 2004 දී නවීකරණය කොට ඇති බව කියවේ.

වෙබ් අඩවියක අන්තර්ගතය වැනි නිරන්තරයෙන් යාවත්කාලීන වන නිර්මාණයක් සඳහා එහි ප්‍රථම ප්‍රකාශනයේ සිට මේ දක්වා කාලය වසර මගින් දැක්විය හැකිය. උදා:- © 1998 - 2006, ABC Ltd. අවසරයෙන් තොරව කළ නොහැකි ක්‍රියාවන් පිළිබඳ ලැයිස්තුවක් ද මෙම දැන්වීම සමග යෙටම වඩා සුදුසුය.

ආරක්ෂා කළ **ශබ්ද පටිගත කිරීම්** සඳහා වෘත්තයක් තුළ වරහනක් ඇති ,ජ, අක්ෂරය භාවිතා කෙරේ. සමහර රටවලට එම සලකුණ යතු පළවෙනි ප්‍රකාශනයේ වසර ශබ්දවාහිනී තැටි පිටපත්වල සඳහන් වීම අවශ්‍ය වේ. (උදා:- CD හෝ ශබ්ද පටි මත)

## වෙබ් අඩවි සඳහා ප්‍රකාශන අයිතිය

වෙබ් අඩවි රූපක, අක්පර, සංගීතය, චිත් නිර්මාණය, ඡායාරූප, දත්ත සමුදාය, වීඩියෝ, පරිගණක මෘදුකාංග, වෙබ් අඩවි නිර්මාණයට යොදා ගන්නා ෟමඑබ කේත ආදී විවිධ වෙනස් ආකාරයෙන් නිර්මාණාත්මක දේවල එකතුවකි. ප්‍රකාශන අයිතිය මගින් මේ අංග වෙන් වශයෙන් ආරක්ෂා කරනු ඇත. උදාහරණ ලෙස වෙබ් අඩවියක ඇති ලිපියකට එයට හිමි ප්‍රකාශන අයිතියක් තිබිය හැකිය. ප්‍රකාශන අයිතිය මෙම විවිධ අංග මුළු වෙබ් අඩවිය නිර්මාණයට තෝරාගත් හා පිළියෙළ කර ඇති විශේෂිත ආකාරය ද ආරක්ෂා කරයි. වැඩි විස්තර සඳහා www.wipo.int/sme/en/documents/business_website.htm

## 4. ප්‍රකාශන අයිතියේ හිමිකම

### නිර්මාණයක කතෘ සෑමවිටම ප්‍රකාශන අයිතියේ හිමිකරුද?

කතෘත්වය (Authorship) සහ හිමිකම (Ownership) යන ඒවායේ අරුත් නිතර වරදවා වටහා ගනියි. නිර්මාණයක කතෘ යනු එය නිර්මාණය කළ පුද්ගලයාය. නිර්මාණය සිදු කලේ එක් පුද්ගලයෙකුට වඩා වැඩි දෙනෙක් නම් සියලු නිර්මාණකරුවන් සම කතෘවරු හෝ බද්ධ කතෘන් ලෙස සලකනු ලබයි. කතෘත්වය පිළිබඳ කරුණ විශේෂයෙන්ම සදාචාර හිමිකම් වලට සහ ප්‍රකාශන අයිතිය කල් ඉකුත්වන දිනය තීරණය සඳහා සම්බන්ධ වේ.

ප්‍රකාශන අයිතිය පිළිබඳ හිමිකම වෙනස් කරුණක් වේ. නිර්මාණයක ප්‍රකාශන අයිතිය හිමිකරු යනු නිර්මාණය උපයෝජනයට, (උදා: භාවිතය, පිටපත් කිරීම, විකිණීම සහ ව්‍යුත්පන්න නිර්මාණ සෑදීම ආදිය) විශිෂ්ඨ හිමිකම් ඇති පුද්ගලයෙකි. සාමාන්‍යයෙන් නිර්මාණයක ප්‍රකාශන අයිතිය එය මුලින්ම නිපැයූ පුද්ගලයාට අයත් වේ. එනම් කතෘට වේ. කෙසේ වෙතත් සෑම රටකම තත්ත්වය මෙය නොවන අතර විශේෂයෙන්ම පහත අවස්ථාවලදී තත්ත්වය වෙනස්ය.

- නිර්මාණය කලේ ඔහුගේ / ඇයගේ රැකියාවේ කොටසක් ලෙස සේවකයෙකු විසින් නම්;
- විශේෂයෙන් නියම කළ හෝ ඇණවුම් කළ නිර්මාණයක් නම්
- නිර්මාණය කලේ පුද්ගලයන් කිහිප දෙනෙක් නම්

බොහෝ රටවල් වලට ගිවිසුමක් පිළිබඳ එකඟතාවයන් වලට ප්‍රකාශන අයිතියේ හිමිකම ට අදාළව නීතිය මගින් ස්ථාපිත නීන්දු වෙනස් කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිය.

### සදාචාරමය හිමිකම් සතු කාටද?

**සදාචාරමය හිමිකම් සෑමවිටම නිර්මාණයේ තනි නිර්මාපකයාට** අයත් වේ. නමුත් ඉහත සඳහන් කළ ලෙස සමහර රටවලට සදාචාරමය හිමිකම් අත්හළ හැකිය.

සමාගම් සතුව සදාචාරමය හිමිකම් නොමැත. උදාහරණයක් ලෙස චිත්‍රපටයක නිෂ්පාදකයා සමාගමක් නම් අධ්‍යක්ෂ සහ තිර රචකයාට පමණක් සදාචාරමය හිමිකම් වල අයිතිය ලැබේ.

### සේවකයෙකු විසින් කරනු ලැබූ නිර්මාණයක ප්‍රකාශන අයිතිය හිමි කාටද?

රටවල් බොහෝමයක සේවකයෙකු විසින් තම වෘත්තියේ සීමාව තුළ නිර්මාණයක් කළ විට වෙනත් ආකාරයක එකඟත්වයකට පැමිණ නැති නම් නිර්මාණයේ ප්‍රකාශන අයිතිය ඉබේම සේව්‍යයා සතු වෙයි. නමුත් සෑම විටම තත්ත්වය මේ ආකාර නොවේ. සමහර රටවල නීතියට අනුව සේව්‍යයා වෙත හිමිකම් ගලා යෑම ඉබේටම සිදු නොවන අතර රැකියා කොන්ත්‍රාතුවේ එය නියම කර තිබිය යුතුය. ඇත්ත වශයෙන් ම සමහර රටවල මේ ආකාරයෙන් කරන ලද සෑම නිර්මාණයක් සඳහාම පැවරීම පිළිබඳ නියම ඔප්පුව ක්‍රියාවේ යෙදවිය යුතු විය හැකිය.

**උදාහරණ :-** සමාගමක් විසින් පරිගණක ක්‍රමලේඛ ශිල්පියෙකු වැඩට යොදවා ගෙන ඇත. ඔහුගේ රැකියාවේ කොටසක් ලෙස, සාමාන්‍ය වැට කරන කාලය තුළ සමාගම විසින් සැපයූ උපකරණ භාවිතයෙන් ඔහු වීඩියෝ ක්‍රීඩා නිර්මාණය කරයි. මෙම මෘදුකාංග සඳහා වන ආර්ථික හිමිකම් බොහෝ රටවලට සමාගමට හිමිවේ. සේවකයාගේ සාමාන්‍ය රැකියාවේ විෂය පථයට අයත් නොවන නිර්මාණයක් ඔහු විසින් කළ විට හෝ ඔහුගේ නිවසේදී හෝ රාජකාරිමය කාල වේලාවෙන් පසුව නිර්මාණය කළ විට දී යම් ගැටළු පැන නැගිය හැකිය. මෙවැනි ගැටළු ඇති නොවීමට ගත හැකි සුදුසු ක්‍රියා පිළිවෙතක් වනුයේ සේවකයා සමග ප්‍රකාශන අයිතිය පිළිබඳ පැන නැගිය හැකි සියලු තත්ත්වයන් ආවරණය වන පරිදි කොන්දේසි අන්තර්ගත ලිඛිත ගිවිසුමකට එළඹීමයි.

## විශේෂ කටයුත්තක් සඳහා නියම කළ නිර්මාණ සඳහා ප්‍රකාශන අයිතිය දරන්නේ කවුද?

යම් නිර්මාණයක් බාහිර උපදේශක හෝ නිර්මාණශිලී සේවාවක් මගින් කලේ නම්, (එනම් කොමිස් කොන්ත්‍රාත්තුවක් වැනි) ඒ පිළිබඳ පටිපාටිය තරමක් වෙනස් වේ. බොහෝ රට වලදී විශේප කටයුත්තක් සඳහා නියම කළ නිර්මාණයක ප්‍රකාශන අයිතිය නිර්මාපකයා සතුවන අතර නිර්මාණය කිරීමට විධානය කළ තැනැත්තාට නියම කළ කාර්යය සඳහා නිර්මාණය යොදා ගැනීමට පමණක් බලයක් ලැබේ. බොහෝ සංගීත නිර්මාණ කරුවන්, ජායාරූප ශිල්පීන් ස්වාධීනව ලේඛනයේ යෙදෙන මාධ්‍යවේදීන්, චිත්‍රක සැලසුම්කරුවන් (Graphic Designers) පරිගණක ක්‍රමලේඛ ශිල්පීන් සහ වෙබ් අඩවි නිර්මාණකරුවන් මෙම පදනම මත වැඩ කරති. **අයිතිය පිළිබඳ ප්‍රශ්න බොහෝ විට මතු වන්නේ යම් විශේෂිත කාර්යයකට නියම කළ දේවල් එය ප්‍රථමයෙන් භාවිතා කළ කාර්යටම හෝ වෙනත් කාර්යයක් සඳහා නැවත භාවිත කරන විටය.**

## රජය සඳහා කළ නිර්මාණ

සමහර රටවල රජයේ මග පෙන්වීම සහ පාලනය යටතේ කළ නිර්මාණ හෝ ප්‍රථමයෙන් ප්‍රකාශයට පත් කළ නිර්මාණ සඳහා වන ප්‍රකාශන අයිතිය ලිඛිත ගිවිසුමක් මගින් වෙනත් ක්‍රමයකට එකඟ වී නැත්නම් එම රජය සතු වේ. රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන සඳහා නිර්මාණ කරන කුඩා පරිමාණයේ ව්‍යාපාරයන් මෙම නීතිය පිළිබඳ දැනුවත් විය යුතු අතර ප්‍රකාශන අයිතියේ හිමිකම පැහැදිලි කර ගැනීමට ලිඛිත ගිවිසුමකින් කටයුතු සුදානම් කරගත යුතුය.

## කුලියට දීම සඳහා වන නිර්මාණ

ඇමෙරිකා එක්සත් ජනපදය වැනි සමහර රටවල ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිය මගින් "කුලියට දීම සඳහා කළ නිර්මාණ නම් ප්‍රභේදයක් අර්ථකථනය කරයි. කුලියට දීම සඳහා කළ නිර්මාණයක් යනු සේවකයෙක් විසින් ඔහුගේ රැකියාවේ විෂය පථයට අදාළව හෝ යම් කොන්ත්‍රාත්තුවක් මගින් නියම කළ ආකාරයට කළ නිර්මාණයකි. කුලියට දීම සඳහා කළ නිර්මාණයක් සඳහා එහිදී ගෙවනු ලබන්නේ එය නිර්මාණය කළ පුද්ගලයාට නොව ප්‍රකාශන අයිතිය හිමිකරුටය. ප්‍රකාශන අයිතිය හිමිකරු ආයතනයක්, සංවිධානයක් හෝ තනි පුද්ගලයෙකු විය හැකිය.

**උදාහරණ :** ඔබ ඔබගේ සමාගම සඳහා වන වෙළෙඳ දැන්වීමක් නිර්මාණයට අනු කොන්ත්‍රාත්තුවක් ලබාදෙයි. ඒ සමගම ඔබගේ නව නිප්පාදනය ප්‍රචාරණය සඳහා එම දැන්වීම වෙළඳ ප්‍රදර්ශනයකදී භාවිතයට අදහස් කරයි. බොහෝ දේශීය නීති යටතේ වෙනස් ආකාරයකට කොන්ත්‍රාත්තුවේ එකඟ වී නොමැති නම් ප්‍රකාශන අයිතිය හිමි වන්නේ වෙළඳ දැන්වීම් ප්‍රචාරක ආයතනයටය. යම් කාලයට පසුව වෙළෙඳ දැන්වීමේ කොටසක් (චිත්‍රක සැලසුමක්, ඡායාරූපයක් හෝ ලාංඡනයක්) ඔබගේ නව වෙබ් අඩවිය සඳහා භාවිතා කිරීමට ඔබට උවමනා වේ. මෙම නව ආකාරයට ප්‍රකාශන අයිතිය හිමි දේවල් භාවිතා කිරීමට ඔබ වෙළඳ දැන්වීම් ප්‍රචාරක ආයතනයෙන් අවසර ලබාගත යුතුය. මක් නිසාද යත් අදාළ දෙය ඔබගේ වෙබ් අඩවියේ භාවිතය මුල් කොන්ත්‍රාත්තුවේ දී සළකා බලා නැති නිසාය. එසේ වුවද මෙයට වෙනස් ආකාරයක අවස්ථා සමහරක් ද ඇති අතර ඒවා ලෙස පුද්ගලික කාරණා සඳහා ගත් ඡායාරූප, අලේඛ්‍ය චිත්‍ර (Potraites) සහ කැටයම්, ශබ්ද පටිගත කිරීම්, චල චිත්‍රපටි වැනි ඒවා දැක්විය හැකි අතර වෙනත් අයුරකින් එකඟ වී නොමැති නම් නිර්මාණය කිරීමට නියම කළ පාර්ශ්වයට ප්‍රකාශන අයිතිය සමහර රටවලදී හිමිවේ.

## කතෘත් කිහිප දෙනෙක් කල නිර්මාණයක ප්‍රකාශන අයිතිය හිමි කාටද?


සම - කතෘභාවය සඳහා මූලික අවශ්‍යතාවයක් නම් සෑම සම කතෘවරයෙකුගේ ම දායකත්වය ප්‍රකාශන අයිති ගත කල හැකි ආකාරයේ විෂය කරුණක් විය යුතු වීමය. සම කතෘභාවය පිළිබඳ කාරණයේ දී සාමාන්‍යයෙන් හිමිකම් ක්‍රියාවේ යොදවන්නේ සියලු සම කතෘන් අතර එකඟතාවයක් මතය. එවැනි එකඟතාවයක් නොමැති අවස්ථාවක සාමාන්‍යයෙන් පහත නීති භාවිතා වේ.

- **ඒකාබද්ධ නිර්මාණ** (Joint work) - කතෘන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙක් තම පුද්ගලික දායකත්ව වල වෙනස් නොකළැකි හෝ ස්වාධීන එකතුවක් සඳහා ඔවුන්ගේ දායකත්වයන් එකට එකතු කිරීමට එකඟ වූ විට බද්ධ නිර්මාණයක් බිහිවේ. බද්ධ නිර්මාණයක් සඳහා උදාහරණයක් ලෙස පාඨ ග්‍රන්ථයක් දැක්විය හැකි අතර කතෘන් දෙදෙනෙක් හෝ වැඩි දෙනෙක් එක් තනි නිර්මාණයකට කැටි කිරීමට අදහස් කළ වෙනස් අංශ දායක කරයි. බද්ධ නිර්මාණයක දායකත්වය සපයන කතෘන් සමස්ත නිර්මාණයේ බද්ධ හිමිකරුවන් බවට පත්වේ. බොහෝ රටවල ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතියට අනුව සියලු බද්ධ හිමිකරුවන් ප්‍රකාශ අයිතිය ක්‍රියාවේ යෙදවීමට කැමති විය යුතුය. අනෙක් රටවල බද්ධ හිමිකරුවන්ගෙන් ඕනෑම අයෙකුට අනෙක් සමකතෘන්ගේ අවසරයකින් තොරව උපයෝජනය කළ හැකිය. (නමුත් එවැනි භාවිතයකින් ලැබෙන ලාභ බෙදා ගත යුතුය.) හිමිකම සහ භාවිතා ආකාරයෙන්, නිර්මාණ සංශෝධනය සඳහා වන හිමිකම්, අලෙවිකරණය සහ ආදායම් බෙදා ගැනීම සහ ප්‍රකාශන අයිතිය උල්ලංඝනයට එරෙහිව ඇප

වැනි කාරණා නිශ්චිතව දැක්වෙන කතෘන් හෝ හිමිකරුවන් අතර ඇති කර ගන්නා ලිඛිත ගිවිසුමක් සාමාන්‍යයෙන් හොඳම ක්‍රියා පිළිවෙතක් වේ.

- **සාමූහිත නිර්මාණ** (Collective works) - නිර්මාණය බද්ධ එකක් නොවී තම දායකත්වයන් වෙන්ව භාවිතා කිරීමට කතෘන් කැමති වූ විට නිර්මාණය සාමූහික එකක් ලෙස සලකනු ලබයි. සාමූහික නිර්මාණ වලට උදාහරණ ලෙස විවිධ සංගීතඥයන්ගේ ගීත සංග්‍රහයක් ඇතුළත් සංගත තැටියක් හෝ ස්වාධීන ලේඛකයන්ගේ ලිපි වලින් සමන්විත සඟරාවක් දැක්විය හැකි අතර මෙහිදී **එක් එක් කතෘ තමා නිර්මාණය කළ කොටස සඳහා ප්‍රතිරූපන අයිතිය දරයි.**
- **ව්‍යුත්පන්න නිර්මාණ** (Derivative works) - ව්‍යුත්පන්න නිර්මාණයක් යනු මීට පෙර පැවති නිර්මාණයක් හෝ නිර්මාණ මත පදනම් ව කළ පරිවර්තනයක්, සංගීත සංයෝජනයක්, කලා ප්‍රතිනිර්මාණයක්, නාට්‍යාකාරයෙන් දැක්වීමක් හෝ චලන චිත්‍ර පිටපතක් වැනි නිර්මාණයකි. **ව්‍යුත්පන්න නිර්මාණ කිරීම ප්‍රකාශන අයිතිය හිමිකරුගේ පරම හිමිකමකි.** කෙසේ වුවද ව්‍යුත්පන්න නිර්මාණයකට වෙනම ප්‍රකාශන අයිතියක් සඳහා සුදුසුකම් ලැබිය හැකි නමුත් එම ප්‍රකාශන අයිතිය අදාල වන්නේ **ව්‍යුත්පන්න නිර්මාණයට නවමු වූ අංගවලට පමණි.** ප්‍රායෝගිකව සැමවිටම බද්ධ නිර්මාණයක් සාමූහික හෝ ව්‍යුත්පන්න නිර්මාණයකින් වෙන් කොට දැක්වීම පහසු නොවේ. බද්ධ නිර්මාණයක විවිධ කෘතීන් නිතරම ඔවුන්ගේ අදාළ දායකත්වයන් ස්වාධීනව සහ වෙනස් අවස්ථාවලදී කරන නිසා "පෙර හෝ "පසු නිර්මාණ තිබිය හැකිය.

බොහෝ රටවල නිර්මාණය බද්ධ නිර්මාණයක් ද, සාමූහික නිර්මාණයක් හෝ ව්‍යුත්පන්න නිර්මාණයක් ද යන්න තීරණය කරන්නේ බද්ධ කතෘන් වනවාද හෝ නැතිද යන්න පිළිබඳ සම කතෘන්ගේ අභිප්‍රාය අනුවයි. බද්ධ කතෘත්වය සඳහා එවැනි අභිප්‍රායක් අවශ්‍ය වේ. බද්ධ නිර්මාණයක් කිරීමේ අභිප්‍රායක් නොමැති කතෘන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් වෙන් නොකලැකි හෝ එකක් අනෙකට බැඳුනු නිර්මාණ කළ විට ව්‍යුත්පන්න හෝ සාමූහික නිර්මාණ බිහිවේ.




*ඩා වින්සි කෝඩ චිත්‍ර පටය ඩා වින්සි කෝඩ ග්‍රන්ථයේ ව්‍යුත්පන්න නිර්මාණයකි. එම නිසා මෙම චිත්‍ර පටයේ නිෂ්පාදකයාට චිත්‍ර පටය නිෂ්පාදනය හා බෙදා හැරීම සඳහා ඩැන් බ්‍රවුන්ගේ අනුමැතිය ගැනීමට සිදුවිය.*

## 5. ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් වල ප්‍රතිලාභ ලැබීම

### නිර්මාණාත්මක කාර්යයන් ගෙන් ආදායමක් ලබාගන්නේ කෙසේද?

නිර්මාණයක ප්‍රකාශන අයිතිය ඔබේ සමාගම සතු නම් සම්පූර්ණ පරම හිමිකම් (Exclusive rights) ගොන්නක් ඉබේම ඔබ සතු වේ. මෙයින් අදහස් වන්නේ එම ආරක්ෂිත නිර්මාණය අලෙවි කිරීම හෝ පිටපත් කුලියට දීම, ව්‍යුත්පන්න නිර්මාණ කිරීම, ජනතාව ඉදිරියේ නිර්මාණය ඉදිරිපත් කිරීම වැනි ක්‍රියා සඳහා නිර්මාණය ප්‍රතිනිප්පාදනය කිරීමට ඔබ සමාගමට හැකි බවය. වෙනත් පාර්ශවයකට ඔබට ප්‍රකාශන අයිතිය හිමි දේවල් භාවිතයට හෝ වාණිජකරණයට අවශ්‍ය නම් මුදල් ගෙවීමක් මත ඔබගේ පරම හිමිකම් සියල්ල හෝ එකක් හෝ කිහිපයක් කොටස් බලපත්‍රයක් මගින් පැවරීමට හෝ විකිණීමට හැකිය. මෙම මුදල් ගෙවීම එක් වරක් කරන එකක් හෝ නැවත නැවත සිදුකර එකක් විය හැකිය. මෙමගින් බොහෝ විට ඔබගේ ප්‍රකාශන අයිතිය කතෘ, නිර්මාපකයා හෝ ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් කෙලින්ම උපයෝජනයට වඩා වැඩි ලාභයක් ඔබගේ ව්‍යාපාරයට ලබා දෙයි.

මෙම පරම හිමිකම් අන්‍යයන්ට බෙදීම, අනුබෙදීම හෝ බලය පැවීම හෝ විකිණීම ඔබ සිතනා ඕනෑම ආකාරයකට කළ හැකිය. මේවා මෙලෙස විකිණීම හෝ බලය පැවරීමට ප්‍රදේශය, වේලාව, වෙළඳපළ කොටස, භාෂා මාධ්‍ය, හෝ අන්තර්ගතය මගින් සීමාසහිත වේ. උදාහරණයක් වශයෙන් ප්‍රකාශන අයිතිය හිමිකරුවෙකුට නිර්මාණයක ප්‍රකාශන අයිතිය සම්පූර්ණයෙන් ම පැවරීමට හෝ ප්‍රකාශන හිමිකම් පොත් ප්‍රකාශකයෙකුට විකිණීම, චිත්‍රපට හිමිකම චිත්‍රපට සමාගමට විකිණීම, නිර්මාණය ගුවන් විදුලි ප්‍රචාරණයට ඇති හිමිකම් ගුවන් විදුලි ආයතනයකට විකිණීම, නිර්මාණය නාට්‍යයකට සුදුසු සේ සකස් කිරීමට ඇති හිමිකම් නාට්‍ය සංගමයකට හෝ රූපවාහිනී සමාගමකට විකිණීම හෝ කළ හැකිය.

නිර්මාණාත්මක කාර්යයන් වාණිජකරණය කිරීමට බොහෝ මාර්ග ඇත.

- ප්‍රකාශන අයිතිය මගින් ආරක්ෂිත නිර්මාණ විකිණීම හෝ ඒවායේ පිටපත් සාදා **පිටපත් විකිණීම** කළ හැකිය. මේ අවස්ථා දෙකෙහිදීම ප්‍රකාශන අයිතියේ හිමිකම් වලට පිටතින් ඇති සියලු හෝ බොහෝ හිමිකම් ඔබ වෙත රැඳේ.
- වෙනත් කෙනෙකුට නිර්මාණය භාවිතා කිරීමට හෝ ප්‍රතිනිප්පාදනයට ඉඩදිය හැකිය. නිර්මාණය සඳහා වන **ආර්ථික හිමිකම් වල බලය පැවරීම** මගින් මෙය කළ හැකිය.
- නිර්මාණය සඳහා වන ප්‍රකාශන අයිතිය **සම්පූර්ණයෙන් ම හෝ එයින් කොටසක් විකිණීමට** (පැවරීමට) හැකිය.

### නිර්මාණය විකිණීමෙන් පසු ඒ සඳහා වන ප්‍රතිරූපන අයිතිය ඔබගෙන් ගිලිහේද?

නිර්මාණය අඩංගු වන භෞතික ද්‍රව්‍යයේ අයිතියේ පිළිබඳ හිමිකමෙන් ප්‍රතිරූපන අයිතිය වෙනස් වේ. ප්‍රතිරූපන අයිතිය සහිත නිර්මාණය හුදු විකිණීමක් (උදා: පරිගණක ක්‍රමලේඛනයක් හෝ අත් පිටපතක්) මගින් ඉබේටම ප්‍රතිරූපන අයිතිය ගැණුම්කරුට පැවරෙන්නේ නැත. නිර්මාණයේ ගැණුම්කරු වෙත ලිඛිත ගිවිසුමකින් පවරන්නේ නොමැති නම් සාමාන්‍යයෙන් නිර්මාණයක ප්‍රතිරූපන අයිතිය කතෘ වෙතම රැඳේ. කෙසේ වෙතත් සමහර රටවලදී ඔබ නිර්මාණයේ පිටපතක් හෝ මුල් නිර්මාණය අලෙවි කරන විට ප්‍රතිරූපන අයිතිය සමග සම්බන්ධිත පරම හිමිකම් ගොන්නෙන් කිහිපයක් ඔබට අහිමි විය

හැකිය. උදාහරණයක් ලෙස පිටපත මිලදී ගත් ගැනුම්කරුට එම පිටපත සම්බන්ධයෙන් අභිමත සේ ක්‍රියා කිරීමේ අයිතිය, එනම් එය අලෙවි කිරීම හෝ පැවරීම වැනි ක්‍රියාවන්ට අයිතිය හිමිවනු ඇත. කුමන හිමිකම් නැතිවේද රඳවා ගත හැකිවේද යන්න රටින් රටට විශාල වශයෙන් වෙනස් වේ. තම රටේදී මෙන්ම විදේශීය වෙළඳ පොළෙදී ද ඔබගේ නිර්මාණයේ පිටපත් අලෙවියට පෙර අදාළ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීති සලකා බැලීම ඉතා සුදුසුය.

## ප්‍රතිරූපන හිමිකම් අවසරයක් යනු කුමක්ද?

ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂිත නිර්මාණයක් සතු ආර්ථික හිමිකම් එකක් හෝ කිහිපයක් භාවිතා කිරීම සඳහා අන්‍යයන්ට (පුද්ගලයන්ට හෝ ආයතන වලට) දෙනු ලබන බලය බල පත්‍රගත අවසරයක් නම් වේ. මෙවැනි අවසරයක ඇති වාසිදායක තත්ත්වය වනුයේ අන්‍යයන්ට නිර්මාණයේ පිටපත් සෑදීමට, බෙදාහැරීමට, ලබා ගැනීමට (download) ගුවන් විදුලි ප්‍රචාරණයට, වෙබ් අඩවිවල ප්‍රචාරණයට හෝ ව්‍යුත්පන්න නිර්මාණය කිරීමට ඉඩ සලසන අතරම ඔබට ප්‍රතිරූපන අයිතියේ හිමිකරු ලෙස පෙනී සිටීමට හැකියාව ලැබීමයි. බල ගැන්වීමේ ගිවිසුම් අදාල පාර්ශ්වයන්ගේ විශේෂ අවශ්‍යතාවලට අනුකූල වන පරදි සකසා ගත හැකිය. මෙලෙස සමහර හිමිකම් සඳහා බලය පැවරීමටත් සමහර ඒවා සඳහා එසේ නොකර සිටීමටත් හැකිය. උදාහරණයක් ලෙස පරිගණක ක්‍රීඩාවක් භාවිතයට හා පිටපත් කිරීමට ඇති හිමිකම සඳහා බලය පැවරුවත් එමගින් ව්‍යුත්පන්න නිර්මාණ කිරීම සඳහා ඇති හිමිකම් ඔබ වෙතම රඳවා ගත හැකිය.

## පරම අයිතිය (Exclusive Right) සහ පරම නොවූ අයිතිය (Non Exclusive Right) අතර වෙනස කුමක්ද?

අයිතිය යන්න සීමා කරන ලද්දක් හෝ එසේ නොකරන ලද එකක් විය හැකිය. ඔබ නිර්මාණයක් සඳහා සීමාසහිත හිමිකමක් ලබා වෙනත් පාර්ශවයකට ලබා දුන්නේ නම් හිමිකම් ලාභියාට හිමිකම මගින් ආවරණය කළ ආකාරවලට පමණක් නිර්මාණය භාවිතා කිරීමේ හිමිකම ඇත. බොහෝ රටවල පරම අයිතිය වලංගු වීම සඳහා එය **ලිඛිත** එකක් විය යුතුය. **පරම අයිතියක්** විශේෂිත ප්‍රදේශයකට, කාල සීමාවකට, නිපවිත කාර්යයකට භාවිතා කිරීම සඳහා සීමා කරනු ලැබීමට හෝ එහි සීමාසහිත භාවයේ පැවතීම නිර්මාණය මගින් ඉටු කෙරෙන අවශ්‍යතා මත රඳා පවතිනවා විය හැකිය. ඔබගේ නිර්මාණය සඳහා ඔබ සතුව හොඳ වෙළඳ පොළක් නොමැති නම් මෙම සීමාසහිත අවසරයන් ප්‍රතිරූපන අයිතිය සහිත නිපැයුම් වෙළෙඳ පොළේ බෙදා හැරීමට හෝ අලෙවියට සුදුසු වෙළඳ උපක්‍රමයකි.

අනෙක් අතට යම් සමාගමක් සඳහා සීමා රහිත අවසරයක් ඔබ ලබා දෙන්නේ නම් එම සමාගමට ඔබේ පරම හිමිකමක් හෝ කිහිපයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම ඔබ විසින් ලබාදෙන නමුත් එමගින් අන්‍යයන්ට (ඔබ ඇතුළුව) එම හිමිකම් එම කාලසීමාවේදී පාවිච්චි කිරීමට ඔබ විසින් ඉඩ සැලසීම වළක්වනු නොලබයි. එසේම ඕනෑම තනි පුද්ගලයන් ගණනාවකට හෝ සාමගම් වලට ඔබගේ නිර්මාණය භාවිතයට හෝ බෙදා හැරීමට ඉඩ දිය හැකිය. සීමාසහිත අවසරයන් හිදි මෙන්ම සීමාරහිත අවසරයන් ද සෑම ආකාරයකින් ම සීමා කිරීමට හා අවහිර කිරීමට හැකිය. බොහෝ රටවල සීමාරහිත අවසරයන් ලිඛිත හෝ වාචික විය හැකිය. කෙසේ වෙතත් ලිඛිත ගිවිසුමක් වඩා යෝග්‍ය වේ.

## ඔබගේ ප්‍රතිරූපන අයිතිය අලෙවි කළ විට කුමක් සිදුවේද?

ප්‍රතිරූපන අයිතිය සඳහා අවසරයක් දීම වෙනුවට විකල්ප ක්‍රියාමාර්ගයක් වනුයේ නිර්මාණයේ ප්‍රතිරූපන අයිතිය වෙනත් අයෙකුට අලෙවි කිරීම වන අතර එවිට එම පුද්ගලයා ප්‍රතිරූපන අයිතියේ නව හිමිකරු බවට පත් වේ. එවිට මේ සඳහා භාවිතා කරන පාරිභාෂික වචනය වනුයේ "**පැවරීම**" (Assignment) යන්නයි. **බලපත්‍රයක්** (License) මගින් බලපත්‍ර නොමැතිව කරන ලද්දක් නීත්‍යානුකූල නොවන බවට ඉඟි කරයි.පැවරීමක් මගින් ඔබගේ හිමිකම් වල සමස්ථ අයිතිය පවරා දෙයි. ඔබට සම්පූර්ණ හිමිකම් ගොන්නම හෝ එයින් කොටසක් පමණක් පැවරිය හැකිය. බොහෝ රටවල පැවරීම ලියවිල්ලක් විය යුතු අතර එය වලංගු වීම සඳහා ප්‍රතිරූපන අයිතිය හිමිකරු විසින් අත්සන් කළ යුතුය. රටවල් සුළු සංඛ්‍යාවකදී, ප්‍රතිරූපන අයිතිය කිසිදු ආකාරයකින් පැවරීම කළ නොහැකිය. එමෙන්ම මතක තබා ගත යුත්තේ ආර්ථික හිමිකම පමණක් පැවරිය හැකි අතර සදාචාරමය හිමිකම් කතෘ වෙතම රැඳෙන බවය.



පැවරීමක් හෝ පරම හිමිකමක් ලියවිල්ලකින් දිය යුතුයි.

## බලපත්‍ර පිළිබඳ ක්‍රමෝපාය

අවසරයක් ප්‍රදානය කිරීම මගින් අවසර ලාභියාට එවැනි අවසරයක් රහිතව කළ නොහැකි යමක් කළ හැකි වේ. අවසරය සඳහා වන ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ සමහර දේවල් කිරීමට බලය ලබාදේ. එමනිසා අවසර ගිවිසුම මගින් බලය ලබාදෙන ක්‍රියාකාරකම් වල විෂය පථය හැකි උපරිම ලෙස නිවැරදිතාවයෙන් පැහැදිලි අර්ථ දැක්වීම ඉතා වැදගත්ය. සාමාන්‍යයෙන් අවසරලාභියාගේ විශේෂ අවශ්‍යතා සහ රුචිකත්වයන්ගේ **විෂය පථයට සීමාවූ අවසරයන් ප්‍රදානය කිරීම වඩා සුදුසුය.** සීමාරහිත අවසරය ප්‍රදානය මගින් අනන්‍ය හෝ වෙනස් නියමයන් සහ කොන්දේසි සඳහා හෝ අනන්‍ය හා වෙනස් අරමුණු සඳහා උනන්දුව දක්වන ඕනෑම පරිශීලකයින් ගණනකට අවසර ලබා දිය හැකිය. කෙසේ වෙතත් සමහර විටක නිර්මාණයක් පිළිබඳ සම්පූර්ණ පාලනය අවසරලාභියා සඳහා හෝ එහි ව්‍යාපාර ක්‍රමෝපායේ අත්‍යවශ්‍ය කොටසක් හෝ සඳහා වන ව්‍යාපාරික රැකවරණය විදහා දක්වයි. එවැනි අවස්ථාවලද සියලු හිමිකම් සඳහා සීමාසහිත අවසරයක් හෝ පැවරීමක් එක් වරක් පමණක් වන ගාස්තුවක් (one-time fee) සඳහා හුවමාරුව හොඳම ගනුදෙනුව විය හැකිය. නමුත් එවැනි ගනුදෙනු සලකා බැලිය යුත්තේ අනෙක් සියලු විකල්පයන් සලකා බැලීමෙන් පසු මේ සඳහා ප්‍රමාණවත් ගෙවීමක් ලබන බව සහතික වීමෙන් අනතුරුවය. ඔබගේ නිර්මාණය සඳහා වන ප්‍රකාශන අයිතිය එක් වරක් හෝ පැවරීම මගින් ඒ සඳහා වන සියලු අනාගත ආදායම් උපයන විභවයන් ඔබගෙන් ගිලිහේ.

## අලෙවිකරණයේදී භාණ්ඩ ඉදිරිපත් කිරීම (Merchandising) යනු කුමක්ද?

අලෙවිය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීම (Merchandising) යනු පාරිභෝගිකයන් ඉදිරියේදී නිෂ්පාදනයක් ආකර්ෂනය වැඩිකිරීම සඳහා බුද්ධිමය දේපළ හිමිකමක් (වෙළඳ ලකුණක් කාර්මික සැලසුමක් හෝ ප්‍රතිරූපන අයිතියක්) නිෂ්පාදනය මත යොදා ගන්නා අලෙවිකරණ ක්‍රමයකි. කාටූන් තිර, නළුවන් පොප් සංගීතකරුවන්, ක්‍රීඩාවේ කීර්තිමත් පුද්ගලයන් ආදී චරිත ජනප්‍රිය චිත්‍ර, මූර්ති සහ වෙනස් බොහෝ ඉමේජ්, ටී ෂර්ට්, සෙල්ලම් බඩු, ලිපිද්‍රව්‍ය, කෝපි ජෝගු සහ පෝස්ටර ආදී විශාල පරාසයක නිෂ්පාදන මත ප්‍රදර්ශනය කරයි. ප්‍රතිරූපන අයිතිය මත විශ්වාසය තබා අලෙවිය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීම ඉතා ලාභදායි අතිරේක ආදායම් මාර්ගයකි.

- ප්‍රතිරූපන අයිතිය ඇති නිර්මාණ (කාටූන් චිත්‍ර සහ ඡායාරූප වැනි) සතු ව්‍යාපාරයන්ට තම ප්‍රතිරූපන අයිතිය භාවිතයට අවසරය හැකියාවෙන් පූර්ණ අලෙවිය සඳහා භාණ්ඩ ඉදිරිපත් කරන්නන් (Merchandisers) වෙත ලබාදීම මගින් ලාභදායි **බලපත්‍ර ගාස්තු සහ කතෘභාග** ඉපයීම කළ හැකිය.
- තොග වශයෙන් නිපදවන අඩු මිලැති භාණ්ඩ වන කෝපි ජෝගු, පැණිරස බීම වර්ග හෝ ටී ෂර්ට් වැනි ඒවා නිෂ්පාදනය කරන සමාගම් ඔවුන්ගේ නිෂ්පාදන මත ජනප්‍රිය චරිතයක්, සෞන්දර්යාත්මක නිර්මාණයන් හෝ වෙනත් සිත් ඇදගන්නා අංගයක් භාවිතයෙන් එම නිෂ්පාදන වඩාත් ආකර්ශණීය බවට පත් කරයි.

අලෙවිකරණයේදී භාණ්ඩ **ඉදිරිපත් කිරීමේ** (Merchandising) ක්‍රියාවලිය සඳහා එම භාණ්ඩ වලට අයත් විවිධ හිමිකම් (ප්‍රතිරූපන අයිතිය හිමි නිර්මාණයක්, කර්මාන්ත සැලසුමක් හෝ වෙළඳ ලකුණක් වැනි) භාවිතයට පූර්ව අවසරය ලබා ගත යුතුය. ජනප්‍රිය පුද්ගලයන්ගේ රූප පුද්ගලිකත්වය සහ ප්‍රසිද්ධිය පිළිබඳ හිමිකම් මගින් ආරක්ෂිත නිසා ඒවා ඉහත ක්‍රියාවලි (Merchandising) සඳහා යොදා ගැනීමේදී අමතර අවධානයක් යොමු කළ යුතුය.

### මේරි එන්ගල්බ්‍රෙයිට් : කලාකරුවෙක් සහ ව්‍යවසායකයෙක් ලෙස

මේරි එන්ගල්බ්‍රෙයිට් ඇයගේ වර්ණවත් සහ සංකීර්ණ සැලසුම් සඳහා ලොව පුරා ප්‍රසිද්ධියක් දරන අතර කලා නිර්මාණ සඳහා අවසර ලබාදීම පිළිබඳ පුරෝගාමීත්වයට පත්ව ඇත. ප්‍රසිද්ධ කාඩ් කුට්ටම් නිපදවන සමාගම් කිහිපයක් ඇගේ සැලසුම් මිලදී ගෙන ඇති අතර තවත් බොහෝ සමාගම් කැලැන්ඩර්, ටී ෂර්ට්, ජෝගු, තෑගි පොත්, රබර් මුද්‍රා, මැටියෙන් තැනූ කුඩා ප්‍රතිමා ආදී වෙනත් බොහෝ දේ ඇතුළත් පුළුල් පරාසයක නිෂ්පාදන සඳහා මේරිගේ විශිෂ්ඨ නිර්මාණ යොදා ගැනීමේ අවසරය ලබා ගැනීමට නොඉවසිල්ලෙන් පසුවෙයි. ඇයගේ ව්‍යාපාරය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් පහත වෙබ් අඩවියෙන් කියවිය හැකිය. *http://www.wipo.int/sme/en/case_studies/engelbreit_licensing.htm.*



## ඔබගේ නිර්මාණ භාවිතය සඳහා අවසර ලබා දෙන්නේ කෙසේද?

ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් වල අයිතිකරු ලෙස කෙසේ කුමන කෙනෙකුට ඔබගේ නිර්මාණ භාවිතයට අවසර දෙන්නේ දැයි තීරණය ඔබ සතුය. අවසරය/බලය ලබාදීම ප්‍රතිරූපන අයිතිය හිමිකරුවන් විසින් හසුරුවන ආකාර බොහෝමයක් ඇත.

එක් මාර්ගයක් වන්නේ **අවසරය/බලය දීමේ ක්‍රියා මාර්ගයේ සියලුම අංග ඔබ විසින් ම හසුරවනු ලැබීමයි**. සෑම අවසරලාභියෙකු සමගම පෞද්ගලිකව සාකච්ඡා කොට නියම සහ කොන්දේසි තීරණය කර ගැනීම හෝ අනෙක් පාර්ශ්වය ඔබගේ ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් උපයෝජනයට කැමති නම් ඔවුන් විසින් පිළිගත යුතු සම්මත නියම සහ කොන්දේසි ඉදිරිපත් කිරීම කළ හැකිය.

ඔබ විසින්ම ඔබගේ සියලු හිමිකම් පරිපාලනය කිරීම නිරන්තරයෙන් ම සැලකිය යුතු පරිපාලනමය වැඩ කොටසක් සහ වෙළෙඳපොළ තොරතුරු, හැකියාව සහිත අවසරලාභීන් සෙවීමට සහ ගිවිසුම් සාකච්ඡා කර ගැනීම ආදිය සමග සම්බන්ධ වේ. එම නිසා ඔබගේ හිමිකම් සියල්ල හෝ කිහිපයක් පරිපාලනය පොත් ප්‍රකාශකයෙකු හෝ පටිගත කිරීම් නිෂ්පාදකයෙකු වැනි ඔබ වෙනුවෙන් බලය/ අවසර ලබාදීමේ ගිවිසුම් වල පැමිණෙන වෘත්තීමය නියෝජිතයෙකුට හෝ ඒජන්සියකට භාරදිය හැකිය. මෙවැනි නියෝජිතයින් නිරන්තරයෙන් ම හැකියාව සහිත අවසරලාභීන් දැක්වීම, වඩා හොඳ මිල ගණන් සාකච්ඡා කොට නියම කර ගැනීම සහ අවසර ලබාදීමේ වගන්ති ආදිය පිළිබඳ ක්‍රියා කිරීම වඩා යහපත් ලෙස කරනු ලබයි.

ප්‍රායෝගිකව ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් අයිතිකරුවන්ට සහ බලපත්‍ර නියෝජිතයින්ට පවා ඔවුන්ගේ නිර්මාණවල වෙනස් භාවිතා සියල්ල පරීක්ෂා කිරීම අපහසුය. සමහර විට රේඩියෝ සහ රූපවාහිනී ආයතන වැනි පරිශීලකයන්ට ද අවශ්‍ය කරන අවසරය ලබාගැනීම සඳහා පෞද්ගලිකව එක් එක් කතෘ හෝ ප්‍රතිරූපන අයිතිය හිමිකරු මුණ ගැසීම ඉතා දුෂ්කරය. පුද්ගලිකව අවසර ලබා ගැනීම අපහසු හෝ ප්‍රායෝගික නොවන අවස්ථාවන්හිදී අදාළ විශේෂ වර්ගයේ නිර්මාණ සඳහා අදාළ වේ නම් **සාමූහික කළමණාකරණ සංවිධානයක්** (Collective Management Organization) හා සම්බන්ධ වීම සුදුසු පියවරක් විය හැකිය. මෙම සංවිධාන නිශ්චිත වර්ගයේ නිර්මාණවල නිර්මාපකයින් වෙනුවෙන් නිර්මාණයන් හි භාවිතා පරීක්ෂා කර බලන අතර අවසරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ සහ මුදල් ගෙවීම් එකතු කිරීම සිදුකරයි. මෙවැනි අදාළ සංවිධාන ඔබ රටේ තිබේ නම් එම සංවිධානයකට සහ/හෝ වෙනත් රටක සංවිධානයකට ඔබට සම්බන්ධ විය හැකිය.

## සාමූහික කළමනාකරණ සංවිධාන ක්‍රියා කරන්නේ කෙසේද? (Collective Management Organization)

මෙම සංවිධාන තම සාමාජිකයන් වන ප්‍රතිරූපන අයිතිය හිමිකරුවන් සහ පරිශීලකයන් අතර මැදිහත්කරුවන් ලෙස ක්‍රියා කරයි. සාමාන්‍යයෙන් මෙම සංවිධාන පවතින්නේ එක් රටක එක නිර්මාණ වර්ගයකට එක් සංවිධානයක් ලෙසය. කෙසේ නමුදු චිත්‍රපට, සංගීතය, ඡායාරූප ශිල්පය, සියළු ආකාරයේ මුද්‍රිත ද්‍රව්‍ය, රූපවාහිනි සහ විඩියෝ සහ දෘශ්‍ය කලා වැනි සමහර නිර්මාණ වර්ග වලට පමණක් මෙම සංවිධාන පවතී. මෙවැනි සංවිධානයකට සම්බන්ධ වීමෙන් එම සාමාජිකයින් තමා නිපැයූ හෝ තමාට අයිති නිර්මාණ පිළිබඳ සංවිධානය දැනුවත් කරයි.

මෙම සංවිධානවල ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ

1) සංවිධානයේ සාමාජිකයන්ගේ නිර්මාණ ලේඛණගත කිරීම.

2) සාමාජිකයන් වෙනුවෙන් කතෘභාග එකතු කිරීම හා අවසර දීම.

3) නිර්මාණයේ භාවිතාවන් පිළිබඳ තොරතුරු එකතු කිරීම සහ වාර්තා කිරීම.

4) පරීක්ෂා කිරීම සහ විගණනය

5) කතෘභාග සාමාජිකයන්ට බෙදා හැරීම.

සාමූහික කළමනාකරණ සංවිධානවල භාණ්ඩාගාර වල ඇති නිර්මාණ භාවිතය සඳහා අවසර ලබා ගැනීමට කැමති පුද්ගලයන් හෝ සමාගම් එම නිර්මාණ පිළිබඳ තොරතුරු විමසීමක් කරයි. ප්‍රතිරූපන අයිතිය හෝ හිමිකම් දරන්නන් අන්තර්ජාතිකව නියෝජනය කරනු ලැබීමට හැකියාව ලබා දීමට මෙම සංවිධාන ලොව පුරා පවතින මෙවැනි අනෙකුත් සංවිධාන හා අන්‍යෝන්‍ය ගිවිසුම් වලට එළඹේ. සාමූහික කළමනාකරණ සංවිධාන තම සාමාජිකයන් වෙනුවෙන් අවසර දීම් ලබාදීම, ගෙවීම් එකතු කිරීම සහ ප්‍රතිරූපන අයිතිය හිමිකරුවන්ට එකග්‍ර වූ නියමයන්ට අනුකූලව එකතු කරගත් මුදල් නැවත බෙදා හැීම සිදු කරයි.

සාමූහික කළමනාකරණයේ ප්‍රායෝගික ප්‍රයෝජන පහත පරිදි වේ.

- සාමූහික අයිතිය පැවරීමෙන් (Collective licensing) පරිශීලකයන්ට සහ හිමිකම් දරන්නන්ට බොහෝ වාසි ඇත. එක් තැනකින් සියල්ල ඉටු කර ගැනීමට හැකි වීමෙන් පරිශීලකයන්ට සහ හිමිකම් දරන්නන්ට වන පරිපාලනමය අවහිරතා බොහෝ සේ අඩුකර ගත හැකිය. සාමූහික කළමණාකරණය මගින් හිමිකම් දරන්නන් හට පරිපාලනමය වියදම් සම්බන්ධයෙන් පරිමාණාකූල පිරිමැසුම් (Economics of scale) වලට ප්‍රවේශය සලසනවා පමණක් නොව අනවසර උපුටා ගැනීම් වලට එරෙහිව කාර්යක්ෂමව සටන් කිරීමට ඉඩ සලසන සංඛ්‍යාංක පද්ධති (Digital systems) නිර්මාණය සඳහා වන පර්යේෂණ සඳහා ආයෝජනයන් ද කරයි. තවද සාමූහික අයිතිය පැවරීම සමථකරුවෙකු ලෙසද ක්‍රියා කරයි. මෙවැනි සාමූහික පද්ධතියක් නොමැති නම් සියලු වෙළඳපොළ ක්‍රියාකරුවන් සහභාගී වන තැනක කුඩා සහ මධ්‍ය පරිමාණයේ හිමිකම් දරන්නන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ පරිශීලකයන් හට වෙළඳ පොළට ඇතුළු විය නොහැකිය.
- මෙම සංවිධාන වලට වඩා බලවත් සහ ඇත විසිරී සිටින පරිශීලක කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් සමග වඩාත් සමබර ලෙස

ගනුදෙනු කළ හැකි නිසා ආරක්‍ෂිත නිර්මාණ හිමිකරුවන්ට වඩාත් හොඳ නියම හා කොන්දේසි අත්කර ගැනීමට **සාමූහික කේවල් කිරීමේ** (collective bargaining) බලය භාවිතා කිරීමට ඉඩ සලසයි.

- අන්‍යයන්ගේ ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් භාවිතයට අවශ්‍ය ව්‍යාපාරයන්ට කටයුතු කළ හැක්කේ එක් සංවිධානයක් සමග වන අතර **බ්ලැන්කට්ටු අවසරයක්** (Blanket license) ලබා ගැනීමට හැකිය. බ්ලැන්කට්ටු අවසරය අවසරලාභියා වෙත මෙම සාමූහික සංවිධාන වල නාමාවලි හා භාණ්ඩාගාරවල ඇති ඕනෑම අයිතමයක් එක් එක් පුද්ගලික නිර්මාණවල නියම සහ කොන්දේසි සමග ගනුදෙනු කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව නිශ්චිත කාල සීමාවක් සඳහා භාවිතයට ඉඩ සලසයි.
- **ඩිජිටල්** ආකාරයේ ඇති නිර්මාණවලට අවසර දීම අවශ්‍ය ව්‍යාපාරයන්ට මෙය ප්‍රයෝජනවත් මෙවලමක් සපයන අතර එම හිමිකම් ලබා ගැනීම සරල කොට ඇත.
- බොහෝ සාමූහික කළමනාකරණ සංවිධාන අවසරයන් ලබාදීම වන ඔවුන්ගේ මූලික කාර්යයට පිටින් වූ වැදගත් කාර්යයක් ඉටු කරයි. උදාහරණයක් ලෙස බල ගැන්වීම, (උපුටා ගැනීම් වලට එරෙහි) අධ්‍යාපන සහ තොරතුරු බෙදා හැරීමේ සේවා සැපයීම, නීති සම්පාදකයන් සමග ගනුදෙනු කිරීම, සංස්කෘතික මූල පිරිම් තුළින් විවිධ සංස්කෘතීන් තුළ නව නිර්මාණයන් හි වර්ධනය උත්තේජනය සහ අනුග්‍රහය කිරීමේදී දී තම සාමාජිකයන්ගේ සාමාජික සහ නෛතික සුභ සාධනයට හවුල් වීම දැක්විය හැකිය. මෑත අවුරුදු වලදී බොහෝ සාමූහික කළමනාකරණ සංවිධාන හිමිකම් කළමනාකරණය සඳහා සංඛ්‍යාංක හිමිකම් කළමනාකරණ (Digital Right Management) සංරචක ක්‍රියාකාරී ලෙස වැඩි දියුණු කිරීමේ යෙදී සිටි. තවද බොහෝ සාමූහික කළමනාකරණ සංවිධාන ඔවුන් නියෝජනය කරන හිමිකම් කළමනාකරණය, පරිපාලනය සහ බලගැන්වීම සඳහා වන ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන පොදු, අන්තර් ක්‍රියාවේ යෙදවිය හැකි ආරක්ෂාකාරී සම්මතයන් සංවර්ධනය දිරි ගැන්වීම සඳහා අන්තර්ජාතික වශයෙන් ක්‍රියාකාරී ලෙස සහභාගී වෙමින් සිටි.
- යම් රටක අදාළ සාමූහික කළමනාකරණ සංවිධාන පිළිබඳ විස්තර මෙම සංවිධාන සඳහා වන අන්තර්ජාතික සමූථවකින් (ඇමුනුම් අංක I බලන්න) හෝ ජාතික ප්‍රතිරූපන අයිතිය සඳහා වන කාර්යාලයකින් (ඇමුනුම් අංක II බලන්න) හෝ අදාළ කර්මාන්ත සංගමයෙන් හෝ ඇමුනුම් අංක I හි සඳහන් වන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයකින් ලබා ගත හැකිය.

## ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් කළමණාකරණය

ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් මගින් ලැබෙන අයිතිවාසිකම් කසමනාකරණය පිළබඳ පහත කරුණු වැදගත් වේ.

- අයිතිය හෝ සම්බන්ධිත හිමිකමේ හිමිකාරීත්වය;
- ප්‍රකාශක, නිෂ්පාදක හෝ බෙදා හරින්නන්;හෝ
- සාමූහික කළමණාකරණ සංවිධාන(CMO). සමහර අවස්ථා වලදී සාමූහික කළමණාකරණ සංවිධාන වල කළමණාකාරීත්වය නීතිය මගින් අනිවාර්ය කර ඇත.

## සංගීත කර්මාන්තයේ සාමූහික කළමනාකරණය

සංගීත ව්‍යාපාර දාමයේ ඇති විවිධ වර්ගයේ හිමිකම් හේතුවෙන් හිමිකම් පිළිබඳ සාමූහික කළමනාකරණය සංගීත කර්මාන්තයේ ප්‍රධාන තැනක් ගනී. එම විවිධ හිමිකම් වර්ග අතර දැකිය හැකි ප්‍රධාන හිමිකම් පහත පරිදි වේ.

කතෘන්, සංගීත නිර්මාණකරුවන් හා ප්‍රකාශකයන් වෙනුවෙන් ගොනු කළ **කාර්මික හිමිකම්** (Mechanical rights);
කතෘන්, සංගීත නිර්මාණකරුවන් හා ප්‍රකාශකයන් වෙනුවෙන් ගොනු කළ **ඉදිරිපත් කිරීම් සඳහා වන හිමිකම්** (Performance rights); සහ නැටුම්, ගීත ආදිය ඉදිරිපත් කරන්නන් (Performers) සහ ශබ්දවාහිනී තැටි නිෂ්පාදකයන් වෙනුවෙන් ගොනු කළ ඉදිරිපත් කිරීම් සඳහා වන හිමිකම් (Performance rights)

දහස් සංඛ්‍යාත කුඩා සහ මධ්‍ය පරිමාණයේ පටිගත කිරීමේ සමාගම්, සංගීත ප්‍රකාශකයන් සහ කලාකරුවන් ඔවුන්ගේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීම සහතික කර ගැනීම සඳහා එම සංගීත නිර්මාණයන් හි ප්‍රබල පරිශීලකයන් (විශාල සන්නිවේදන කණ්ඩායම්, ගුවන් විදුලි, රූපවාහිනී, විදුලි සංදේශ කණ්ඩායම්, හෝ කේබල් ක්‍රියාකරුවන්) සමග ගනුදෙනු කිරීමට සහ තම රුචිකත්වයන් නියෝජනයට තම රටවල ප්‍රාදේශීය හෝ දුරස්ථ සාමූහික අවසර ලබාදීමේ සංවිධාන (Collective Licensing Organization) කෙරෙහි විශ්වාසය තැබීම පුදුමයක් නොවේ. ඒ හා සමගාමීව තරාතිරම නොසලකා සියලුම අවසරලාභීන්ට විශාල සංඛ්‍යාවක් වූ තනි හිමිකම් දරන්නන් හා ගනුදෙනු කිරීමෙන් තොරව සියළු



සංගීත සමූහයක් සහිත භාණ්ඩාගාර (Repertoires) වලට ප්‍රවේශය හිමිය. ඉදිරිපත් කරන්නන් සඳහා වන සාමූහික කළමනාකරණ සංවිධාන ආරම්භයේ සිටම අන්තර්ජාලයේ හිමිකම්, කළමනාකරණය කරමින් සිට ඇති අතර දැන් දැන් "ප්‍රායෝජනයේ යෙදවිය හැකි හිමිකම්" (Making available rights) කෙරෙහි යොමු වේ.

බොහෝ රටවල ගුවන් විදුලි ප්‍රචාරක සංස්ථා සංගීත ප්‍රචාරණය සඳහා වන හිමිකම් සඳහා ගෙවිය යුතුය. සාමාන්‍යයෙන් මෙම ගෙවීම සංගීත නිර්මාපකයාට අනියම් ආකාරයකින් කරනු ලබයි. ප්‍රායෝගිකව සංගීත නිර්මාණකරු ඔහුගේ හෝ ඇයගේ හිමිකම් සංගීතය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන සියල්ලන් සමග ගනුදෙනු කරන සංවිධානයකට (CMO) පවරයි. සංගීත නිර්මාණකරුවන් විශාල සංඛ්‍යාවක සාමාජිකත්වය නියෝජනය කරන සාමූහික කළමනාකරණ සංවිධාන, යම් නිර්මාණයක් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කෙරෙන වාර ගණනට අනුකූලව කතෘභාගය එහි සාමාජිකයන්ට ගෙවයි. ගුවන් විදුලි ප්‍රචාරක සංවිධාන, සාමූහික කළමනාකරණ සංවිධානවලට සමස්ථ වාර්ෂික ගෙවීමක් මගින් ගනුදෙනු කරන අතර යම් පටිගත කිරීමක් වාදනය කළ වාර ගණන අනුව සංගීත නිර්මාණකරුවන්ට කතෘභාගය ගෙවීමේ කාර්යය සඳහා ගණනය කිරීමට ඉඩ සළසන නියැදි වාර්තා (Sample Returns) සපයයි. මෙම සාමූහික කළමනාකරණ සංවිධාන ඉදිරිපත් කිරීමේ හිමිකම් පිළිබඳ ඕනෑම සංවිධානයක් විය හැකිය.

උදාහරණයක් ලෙස පොදුරාජ්‍ය මණ්ඩල ගුවන් විදුලි ප්‍රචාරකයන් සඳහා අදාළ වනුයේ ඕස්ට්‍රේලියානු ඉදිරිපත් කිරීමේ හිමිකම් සංගමය (Australian-performing Right Association) හෝ එක්සත් රාජධානියේ පදනම් වූ ඉදිරිපත් කිරීමේ හිමිකම් සමාජය වේ. මේ සංවිධාන දෙකම ලොව ඕනෑම තැනක නිර්මාණය කළ ඕනෑම සංගීතයක්

ප්‍රචාරණය සඳහා ප්‍රචාරකයන්ට වෙබ් අඩවි හරහා අවසර දීම සඳහා සුදුසු තත්ත්වයක සිටී.

උදාහරණයක් වශයෙන් ඕස්ට්‍රේලියානු ඉදිරිපත් කිරීමේ හිමිකම සංගමය, ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ සහ දකුණු පැසිපික් කලාපයේ සිටින එහි සාමාජිකයන් සංගමයට පවරන සංගීතය පමණක් නොව ඉදිරිපත් කිරීමේ හිමිකම් සමාජයේ සාමාජික එක්සත් රාජධානියේ සංගීත රචකයන් සහ ප්‍රකාශකයින් විසින් රචිත සංගීතය ද පාලනය කරයි. මීට සමාන ගිවිසුම් මගින් ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ APRA සංගමයට එක්සත් ජනපදයේ සංගම්වල සාමාජිකයන් මෙන්ම ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ස්පාඤ්ඤය, ඕලන්දය, ග්‍රීසිය සහ වෙනත් රටවල සංගම්වල සාමාජිකයන් වන විවිධ සංගීත රචකයන් විසින් රචිත සංගීත නිර්මාණවල පාලනය ලබා දෙයි.

**සංගීතය අඩංගු ඕනෑම රූපවාහිනී වැඩසටහනක් ප්‍රචාරය කිරීම** සඳහා ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීමේ අවසරයක් (Public Performance license) අවශ්‍ය වේ. ඉදිරිපත් කිරීමේ හිමිකම (Performance rights), ප්‍රතිරූපන අයිතිය හිමිකරු විසින් හෝ සංගීත නිර්මාණය සහ භාවිතා කළ සංගීත පටිගත කිරීම ප්‍රකාශයට පත් කරන්නන් විසින් වලංගු කළ යුතුය. ඉදිරිපත් කිරීමේ හිමිකම් සඳහා වන සංගමයකින් ලබාගත් බ්ලැන්කට්වූ අවසරයක් (Blanket license) සාම්ප්‍රදායිකව ආරක්‍ෂා සහිතය.

## පිටපත්කරණය (Reprography) සඳහා සාමූහික කළමනාකරණය

ව්‍යාපාර **ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂිත සෑම වර්ගයකම මුද්‍රිත ද්‍රව්‍යයන්** විශාල වශයෙන් භාවිතා කරයි. උදාහරණ වශයෙන් ඔවුන්ට ප්‍රවෘත්ති පත්‍රවල, ජර්නල සහ අනෙකුත් වාර සඟරාවල අඩංගු ලිපිවල ඡායාපිටපත් ලබාගෙන තොරතුරු හා සමීක්‍ෂණ කටයුතු සඳහා ඒවා ඔවුන්ගේ සේවකයන්ට බෙදා හැරීමට අවශ්‍ය විය හැකිය. කළනොහැකි නොවූ නමුත්, එවැනි භාවිතයක් සඳහා ලොව පුරා සිටින කතෘන්ගෙන් සහ ප්‍රකාශකයින්ගෙන් සෘජුව අවසරය ඉල්ලා සිටීම සමාගම් සඳහා ප්‍රායෝගික නොවේ.

විශාල පරිමාණයේ ඡායාපිටපත් කරණය සඳහා අවසර ගැනීම සඳහා වන අවශ්‍යතාවය තෘප්ත කිරීමට කතෘන් සහ ප්‍රකාශකයන් බොහෝ රටවල සාමූහික කළමනාකරණ සංවිධාන වර්ගයක් වන ප්‍රතිනිෂ්පාදන හිමිකම් සංවිධාන (Reproduction Rights Organizations (RROs)) පිහිටුවා ගෙන ඇත්තේ තනි තනිව හිමිකම් දරන්නන්ට ක්‍රියා කිරීම ප්‍රායෝගික නොවූ විට අවශ්‍ය ප්‍රතිරූපන අයිතිය පිළිබඳ අධිකාරින්ට මැදිහත්කරුවන් සහ පහසුකම් සපයන්නන් ලෙස ක්‍රියා කිරීමටය.



ආයතනවල සහ සංවිධානවල (පුස්තකාල, පොදු පරිපාලනයන්, පිටපත් අලෙවිහල්, අධ්‍යාපනික ආයතන සහ පුළුල් පරාසයක වෙළෙඳ සහ කර්මාන්තමය ව්‍යාපාර වැනි) සේවකයන්ගේ භාවිතය සඳහා යම් ප්‍රකාශිත නිර්මාණයක (පොත්, ජර්නලය සහ වාර සඟරා ආදිය) කොටසක සීමිත පිටපත් සංඛ්‍යාවක පිටපත්කරණය හෝ පරිලෝකනය කරන ලද පිටපත් සෑදීම සඳහා අවසරය ලබාදෙන බලපත්‍ර මෙම ප්‍රතිනිෂ්පාදන හිමිකම් සංවිධාන තම සාමාජිකයන් වෙනුවෙන් නිකුත් කරයි. සමහර ප්‍රතිනිෂ්පාදන හිමිකම් සංවිධාන පරිගණක ජාල හරහා ඉලෙක්ට්‍රොනික බෙදාහැරීමට සම්බන්ධ දෑ වැනි වෙනත් ප්‍රතිරූපන අයිතියේ භාවිතාවන් ද බල ගැන්වීම සඳහා අවසර ලබා ඇත.

## 6. වෙනත් පාර්ශ්වයන්ට හිමි නිර්මාණ භාවිතා කිරීම.

### අන්‍යයන්ගේ නිර්මාණ භාවිතයට අවසරයක් අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවලදද?

ව්‍යාපාරයන්ට නිතරම තම ව්‍යාපාරික ක්‍රියාකරකම්වලට ආධාර වශයෙන් ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් වලින් ආරක්ෂිත නිර්මාණ භාවිතා කිරීමට අවශ්‍ය වේ. අන්‍යයන්ගේ නිර්මාණ භාවිතයේදී ප්‍රථමයෙන් ම ප්‍රතිරූපන අයිතිය සඳහා වන අවසරය අවශ්‍ය දැයි ප්‍රථමයෙන් නිශ්චය කරගත යුතුය.

- නිර්මාණය ප්‍රතිරූපන අයිතිය සහ/හෝ සම්බන්ධිත හිමිකම් වලින් ආවරණය වී ඇත්නම්
- නිර්මාණය පොදු ස්වාමිත්වය (Public domain) තුළ නොවේ නම්
- ප්‍රතිරූපන අයිතිය සහ / හෝ සම්බන්ධිත හිමිකම් අයිතිකරු සතු හිමිකම් සියල්ල හෝ කොටසක් ඔබ සැළසුම් කළ උපයෝජනය තුළ භාවිතයට අදහස් කරයි නම්ත
- ඔබ අදහස් කළ භාවිතය ජාතික ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් නීතියේ විශේෂයෙන් අඩංගු ව්‍යතිරේකයක් (Exception) මගින් හෝ සීමාවක් මගින් හෝ සාධාරණ භාවිතය හෝ "සාධාරණ ගනුදෙනුව" මගින් ආවරණය නොකරන්නේ නම්

ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රතිරූපන අයිතිය හිමිකරුගෙන් මේ සඳහා අවසරයක් අවශ්‍ය වේ.

මතක තබා ගත යුතු කරුණක් වනුයේ ඔබගේ **ව්‍යාපාර පරිශ්‍රයෙන් පිටත** ආයෝජකයන්ගේ මාර්ග අසල ප්‍රදර්ශනයක් (Road show) සමාගම් වෙබ් අඩවි, වාර්ෂික වාර්තා, සමාගම් ලිපි ආදිය සහ ව්‍යාපාර පරිශ්‍රය තුළ (සේවකයන්ට බෙදා හැරීම, නිෂ්පාදන සමීක්ෂණ, ආයතනය තුළ පවත්වන රැස්වීම් සහ පුහුණු වැඩසටහන් ආදිය) අන් පුද්ගලයන්ගේ නිර්මාණ භාවිතය සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතුය. තවද ඔබ **ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂිත නිර්මාණයක කොටසක් පමණක්** භාවිතා කළ ද සාමාන්‍යයෙන් පූර්ව අවසරය අවශ්‍ය වේ.

### වෙනත් පුද්ගලයන්ගේ නිර්මාණවල ඉලෙක්ට්‍රොනික හා සංඛ්‍යාංක (Digital) භාවිතාවන්ට ද අවසරය අවශ්‍ය වේද?

අනෙක් සියලු භාවිතාවලට යෙදෙන අන්දමට ම ප්‍රතිරූපන අයිතියේ ආරක්ෂාව සංඛ්‍යාංක භාවිතය හා ආචයනය (Storage) සඳහා යෙදේ. එනිසා අදාළ නිර්මාණ පරිලෝකනය කිරීමටත් ඉලෙක්ට්‍රොනික ලුහුඬු ප්‍රකාශ පුවරුවක (Electronic bulletin board) හෝ වෙබ් අඩවියක යෙදීමටත් සංඛ්‍යාංක අන්තර්ගතයන් ඔබගේ සමාගමේ දත්ත සමුදායක තැන්පත් කිරීමටත් එම නිර්මාණ ඔබගේ වෙබ් අඩවියේ ප්‍රචාරණය කිරීමට එම නිර්මාණවල ප්‍රතිරූපන අයිතිය හිමිකරුවන්ගෙන් පූර්ව අවසරය ලබා ගත යුතුය. බොහෝ වෙබ් අඩවි ඉමේජ් සහ පාඨ ප්‍රතිනිෂ්පාදනය සඳහා අවසරය ඉල්ලා සිටීම සාපේක්ෂව පහසු කිරීම සඳහා සම්බන්ධ විය යුතු පුද්ගලයන්ගේ විද්‍යුත් ලිපින ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.



*නූතන තාක්ෂණය චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන්, සංගීතය, චිත්‍රක, ඡායාරූප, මෘදුකාංග, පාඨ ආදී අන්‍යයන් විසින් නිර්මාණය කරන ලද දේවල් ඔබගේ වෙබ් අඩවිය තුළ භාවිතය පහසු කරවයි. මෙලෙස නිර්මාණ භාවිතය හා පිටපත් කිරීම සඳහා වන තාක්ෂණික පහසුව එසේ කිරීමට නීතිමය හිමිකමක් ලබා දෙන්නේ නැත.*

### ඔබ ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂිත නිර්මාණයක් මිල දී ගෙන ඇත්නම් ඔබ කැමති ආකාරයට එය භාවිතයට නිදහස තිබේද?

ඉහත පැහැදිලි කළ ආකාරයට නිර්මාණයක අයිතිය පිළිබඳ හිමිකමෙන් ප්‍රතිරූපන අයිතිය වෙනස් වේ. පොතක, සංගත තැටියක, වීඩියෝ එකක හෝ පරිගණකවැඩසටහනක පිටපතක් මිලදී ගැනීම මගින් ඒවායේ වෙනත් පිටපත් ගැනීමට හෝ ඒවා ප්‍රසිද්ධියේ භාවිතා කිරීමට හෝ පෙන්වීමට ගැනුම්කරුට එමගින් හිමිකම ලබා නොදෙයි. සාමාන්‍යයෙන් මේවා කිරීමට ඇති හිමිකම් ප්‍රතිරූපන අයිතිය හිමිකරු සමගම රැඳෙන අතර එම ක්‍රියා කිරීම සඳහා අවසරය එම හිමිකරු වෙතින් ලබා ගත යුතුය. සැලකිය යුතු කරුණක් වනුයේ නිර්මාණයක ඡායාපිටපතක් ලබාගැනීමේදී මෙන්ම, ඉලෙක්ට්‍රොනික පිටපතක් නිපදවීම සඳහා නිර්මාණයක් පරිලෝකනය සහ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඇති නිර්මාණයක පිටපතක් ලබා ගැනීම (downloading) යන සියලු ක්‍රියා නිර්මාණය පිටපත් කිරීම හා සම්බන්ධ වන අතර එවැනි ක්‍රියා කිරීමට පෙර පූර්ව අවසරය අවශ්‍ය වේ.

### මෘදුකාංග සඳහා අවසරයන් දීම (Licensing software)

ප්‍රමිතියෙන් යුත් පැකේජ වශයෙන් ඇති මෘදුකාංගයන් මිල දී ගැනීමෙන් ම ඔබ වෙත අවසරය පැවරේ. ඔබ භෞතික පැකේජය මිලදී ගන්නා නමුත් එහි අඩංගු මෘදුකාංගයන්ගේ සමහර භාවිතා වල පමණක් බලය ලැබේ. අවසරයට අදාළ නියම සහ කොන්දේසි පැකේජයේ අඩංගු වන අතර ඒවා සමග ඔබ එකඟ නොවේ නම් එය නැවත දිය යුතුය. පැකේජය විවෘත කිරීමෙන් ඔබ විසින් ගිවිසුමට අදාළ නියම සහ කොන්දේසි පිළිගත් බව සිතනු ලැබේ. නැතහොත් අවසරය පැවරීමේ ගිවිසුම මෘදුකාංග පැකේජයේ ඇතුළත අඩංගු කර තිබිය යුතුය.

බොහෝ විට මෘදුකාංග භාවිතය පිළිබඳ අවසරය මාර්ගගතව (on line) “මූසිකය” එබීමෙන් හෝ අවසර දීම ("Click-wrap licenses") ලෙස තිබිය හැකිය. එවැනි අවසරයන්හි දී වෙබ් පිටුවක අදාළ අයිකනය මත එබීමෙන් ඔබ ගිවිසුමේ නියම සහ කොන්දේසි පිළිගනියි. ඔබට යම් මෘදුකාංගයක් ඔබගේ සමාගම තුළ පරිගණක බොහෝ ගණනක් සඳහා අවශ්‍ය නම්, මෘදුකාංග සඳහා වන අවසරයන් රාශියක් මිලදී ගැනීම නිසා ලැබෙන සැලකිය යුතු වට්ටමක් ලබාදෙන **වෙළුම් අවසරයක්** (Volume licenses) ඔබට ලබාගත හැකිය. මෑතක සිට මෘදුකාංග වලට දෙන අවසරයන්හි වලංගුතාවය පිළිබඳ ක්‍රමයෙන් වර්ධනය වන මත භේදයක් පවතින අතර බොහෝ නිෂ්පාදකයෝ ප්‍රතිරූපන අයිතිය සහ/ හෝ සම්බන්ධිත හිමිකම් නීති මගින් දෙන අවසරය ඉක්මවා අතිරේක ගිවිසුමක් පිළිබඳ වූ වගන්ති මගින් තම හිමිකම් වල සීමා පළල් කිරීමට උත්සහ ගනිති.

එවැනි අවස්ථාවල ඔබ මිලදී ගෙන තිබෙන මෘදුකාංගය සම්බන්ධයෙන් ඔබ කළ සහ නොකළ යුත්තේ කුමක්ද සෙවීම සඳහා විමසිල්ලෙන් අවසරඨමේ ගිවිසුම කියවා බැලිය යුතුය. මීට අමතරව අන්තර් ක්‍රියා කළ හැකි නිෂ්පාදන සෑදීම, වැරදි නිවැරදි කිරීම, ආරක්ෂාව පරීක්ෂා කර බැලීම සහ උපස්ථ පිටපත් (back up copy) සෑදීම වැනි අවසරයේ අවශ්‍යතාවයකින් තොරව කළ හැකි පරිගණක ප්‍රකමනයක සමහර භාවිතාවන් කිරීම සඳහා ඉඩ සලසන ව්‍යතිරේක ඔබගේ දේශීය ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතියේ තිබිය හැකිය.

## අවසරයකින් තොරව භාවිතය සඳහා ඔබ හිමිකම් ලබන්නේ කුමන අන්තර්ගතයන් හෝ ද්‍රව්‍ය සඳහාද?

- කිසියම් නිර්මාණයක ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින් ආරක්ෂා නොකළ අංගයක් ඔබ භාවිතා කරන විට.
  උදා: ආරක්ෂිත නිර්මාණයක ඇති කරුණු සහ අදහස් කතෘගේ ප්‍රතිරූපනය පිටපත් කිරීමක් නොවන අයුරින් ඔබ විසින් ප්‍රකාශ කිරීම.
- නිර්මාණය පොදු ස්වාමිත්වය (public domain) තුළ තිබේ නම්
- ඔබගේ භාවිතය ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතියේ විශේෂයෙන් අඩංගු ව්‍යතිරේකයක් මගින් හෝ සීමාවක් මගින් හෝ "සාධාරණ භාවිතය" හෝ "සාධාරණ ගනුදෙනුව" පිළිබඳ මතයෙන් ආරක්ෂිත නම්

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ හිමිකරුගෙන් අවසර ගැනීම අවශ්‍ය නොවේ.

## නිර්මාණයක් පොදු ස්වාමිත්වයට (Public Domain) පත් වන්නේ කුමන අවස්ථාවකද?

යම් නිර්මාණයක් සඳහා කිසිවෙකු සතුව ප්‍රතිරූපන අයිතියක් නොමැති නම් එම නිර්මාණය පොදු ස්වාමිත්වයට අයත් වන අතර ඕනෑම කෙනෙකුට ඕනෑම කාර්යයක් සඳහා එය නිදහසේ භාවිතා කළ හැකිය. පහත ආකාරයේ නිර්මාණ පොදු ස්වාමිත්වය තුළ පවතී.

**උදාහරණ:** ෆෙඩ්‍රික් චොපින් 1849 දී මිය ගියේය. ඔහු විසින් රචිත සංගීතය සහ පද රචනා පොදු ස්වාමිත්වයේ පවතී. එම නිසා චොපින්ගේ සංගීතය ඕනෑම කෙනෙකුට වාදනය කළ හැකිය. කෙසේ වෙතත් සංගීත රචනාවන්ගෙන් වෙනස් ලෙස පටිගත කිරීම් ආරක්ෂා කොට ඇති නිසා චොපින්ගේ සංගීත පටිගත කිරීම් තවමත් ප්‍රතිරූපන අයිතියේ ආරක්ෂාව ලබයි.

- ප්‍රතිරූපන අයිතියේ ආරක්ෂාව පවතින කාල සීමාව ඉක්මවා ගිය නිර්මාණයක්
- ප්‍රතිරූපන අයිතිය මගින් ආරක්ෂා කළ නොහැකි නිර්මාණයක්
- ප්‍රතිරූපන අයිතිය හිමිකරු විසින් පැහැදිලිව ම ඔහුගේ හිමිකම් අත්හළ නිර්මාණයක්. උදාහරණ ලෙස නිර්මාණය මත පොදු ස්වාමිත්වය පිළිබඳ සටහනක් දැමීමෙන්

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සටහනක් නොමැති වීම නිර්මාණය පොදු ස්වාමිත්වය යටතේ ඇති බව නොහඟවයි. නිර්මාණය අන්තර්ජාලයේ ඇති විට පවා මෙය අදාළ වේ.

## ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් වලින් තව දුරටත් නිර්මාණය ආරක්ෂිත දැයි සොයා ගන්නේ කෙසේද?

සදාචාරමය හිමිකම් අනුව කතෘගේ නම සාමාන්‍යයෙන් නිර්මාණය මත දක්වෙන නමුත් කතෘ මිය ගිය වර්ෂය ජීවිත කතා නිර්මාණවල හා පොදු ජන ලේඛණවල තිබිය හැකිය. එම සෙවීම පැහැදිලි ප්‍රතිඵල ලබා දුන්නේ නැතිනම් කිසියම් අදාළ තොරතුරක් පරීක්ෂා කර බැලීමට ඔබට ඔබේ රටේ ප්‍රතිරූපන අයිතිය සඳහා වන කාර්යාලයේ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නාම ලේඛණය පරීක්ෂා කර බැලීම හෝ අදාළ සාමූහික කළමනාකරණ සංවිධානය හෝ නිර්මාණයේ ප්‍රකාශක සම්බන්ධ කර ගැනීම හෝ කළ හැකිය. මතක තබා ගත යුතු කරුණක් වන්නේ එක් නිෂ්පාදනයක් සඳහා ප්‍රතිරූපන අයිති කිහිපයක් තිබිය හැකි බවත් ඒ සඳහා විවිධ හිමිකරුවන් විවිධ කාල පරිච්ඡේද සඳහා සිටිය හැකි බවත්ය. උදාහරණයක් ලෙස පොතක වෙනස් වූ ප්‍රතිරූපන අයිතීන්ගෙන් ආරක්ෂිත, වෙනස් අවස්ථාවල කල් ඉකුත්වන පාඨ සහ ඉමේජ තිබිය හැකිය.

www.wipo.int/sme/

## නිර්මාණයක් ප්‍රතිරූපන අයිතියේ ව්‍යතිරේකයක් හෝ සීමාවක් ලෙස හෝ "සාධාරණ භාවිතය" හෝ "සාධාරණ ගනුදෙනුව" සංකල්පය යටතේ හෝ භාවිතා කළ හැක්කේ කවර අවස්ථාවකදීද?

සියලු දේශීය ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිවල ව්‍යතිරේක සහ සීමා විශාල සංඛ්‍යාවක් අඩංගු වන අතර ඒවා මගින් ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ආරක්ෂාවේ විෂය පරාසය සීමා කර නිර්මාණයන් යම් අවස්ථා යටතේ නොමිලේ භාවිතයට හෝ ගාස්තුවක් ගෙවීමෙන් පසු අවසර ලබා ගැනීමකින් තොරව භාවිතා කිරීමේ ඉඩ ලබාදෙයි. නියම වගන්ති රටින් රටට වෙනස් වුවත් සාමාන්‍යයෙන් ව්‍යතිරේක සහ සීමා සැලකු විට ඒවාටත් ප්‍රතිරූපනයට පත් කරන ලද නිර්මාණයකින් කළ උපුටා ගැනීමක් භාවිතය (එනම් ස්වාධීනව කරන ලද නිර්මාණයකට කුඩා උද්ධෘත භාවිතය). පෞද්ගලික සහ ස්වකීය භාවිතය සඳහා වූ පිටපත් කිරීම් (සමීක්ෂණ සහ අධ්‍යයන කටයුතු සඳහා වැනි). **පුස්තකාල සහ ලේඛනාගාර**වල යම් ප්‍රතිනිෂ්පාදන (ජනතාවට නිකුත් කිරීමට නොහැකි තරමට නිර්මාණ පිටපත් අබලන් වූ විට ඒවා මුද්‍රණය කිරීම වැනි). **ගුරුවරුන්** විසින් පන්ති කාමරයක සිසුන්ට භාවිතා කිරීම සඳහා නිර්මාණවල උපුටාගැනීම් ප්‍රතිනිෂ්පාදනය. **දෘශ්‍යාබාධිත** පුද්ගලයන්ගේ භාවිතය සඳහා විශේෂ ආකාරයේ පිටපත් තැනීම වැනි ඒවා අඩංගු වේ.

වෙනස් රටවල සිටින විවිධාකාර කණ්ඩායම් වල ප්‍රයෝජනය සඳහා බොහෝ ව්‍යතිරේක සහ සීමා පවතී. බොහෝ විට මෙම සීමා සහ ව්‍යතිරේකයන් දීර්ඝ ලෙස දේශීය නීතිවල විස්තර කෙරෙන අතර මඟපෙන්වීමක් ලෙස මේවා විමසීම කිරීම හෝ විශේෂඥ උපදෙස් ලබාගැනීම කළ යුතුය.

ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, එක්සත් රාජ්‍ය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ව්‍යවහාර නීතිය පවතින රටවල නිර්මාණ **"සාධාරණ භාවිතය"** හෝ **"සාධාරණ වෙළඳාම"** යටතට වැටේ. මෙහි ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය විස්තර වී ඇත්තේ අඩුවෙනි. "සාධාරණ භාවිතය" ප්‍රතිරූපන අයිතිය මගින් සුරැකීම අන්‍යන්ගේ නිර්මාණවල සමහර ආකාරවල භාවිතා සඳහා ප්‍රතිරූපන අයිතිය දරන්නාගේ අවසරය අවශ්‍ය නොවන බව පිළිගනියි. එම අදාළ භාවිතය ප්‍රතිරූපන අයිතිය දරන්නා සතු ප්‍රතිනිෂ්පාදන සහ අනෙක් ආකාර භාවිතා සඳහා වන හිමිකම්වලට බාධා නොකරන සැහෙන පමණට අවම මට්ටමේ බව සිතනු ලැබේ. "සාධාරණ භාවිතය" පිළිබඳ කිසියම් ආකාරයක පොදු නීති දැක්වීම අපහසු වන්නේ එය සෑම විටම තොරතුරු විශේෂිත වන නිසාය. කෙසේ වෙතත් වාණිජමය භාවිතාවන් සඳහා නිර්මාණ පිටපත් කරන්නන්ට වඩා පෞද්ගලික භාවිතා සඳහා එසේ කරන තනි පුද්ගලයන්ට "සාධාරණ භාවිතය" හිමිකම් ඇත. "සාධාරණ භාවිතය" යටතේ අවසර දිය හැකි ක්‍රියාකාරකම් වලට ප්‍රවෘත්ති පත්‍රයකින් ගත් පින්තූර වල පිටපත් පන්ති කාමරයක අධ්‍යාපනික අරමුණු සඳහා බෙදා හැරීම, සමාජ විචාරණයක් හෝ උපහාසාත්මක වැටසටහනක් සඳහා නිර්මාණයක් අනුකරණය කිරීම, ප්‍රකාශයට පත් කළ නිර්මාණයකින් උපුටා ගැනීමේ ලබා ගැනීම ආදිය ඇතුළත් වේ. "සාධාරණ භාවිතය" පිළිබඳ පරාසය රටින් රටට වෙනස් වේ.


මතක තබා ගත යුතු කරුණක් නම්, බොහෝ රටවලදී ඉහත නීති රීතිවලට අනුකූලව අන්‍යයන්ගේ නිර්මාණ භාවිතා කළත් නිර්මාණයේ කතෘගේ නම සඳහන් කිරීම අවශ්‍ය බවය.

## පෞද්ගලික පිටපත් කිරීම සඳහා වන අයබදු ක්‍රමයක් යනු කුමක්ද?

තනි පුද්ගලයන් විසින් වාණිජමය නොවන තම පුද්ගලික භාවිතය සඳහා ප්‍රතිරූපන අයිතිය සහිත දේවල් විශාල වශයෙන් පිටපත් කරයි. එවැනි පිටපත් කිරීම් මගින් පටිගත/ පිටපත් කිරීමේ උපකරණ සහ මාධ්‍ය නිප්පාදකයින් සහ ආනයනකරුවන්ට ඉතා වාසිදායක වෙළෙඳපොළක් නිර්මාණය වේ. කෙසේ වෙතත් පුද්ගලික පිටපත් කිරීම් එහි නියම ස්වාභාවයෙන් ගිවිසුමක් මගින් පාලනය කළ නොහැකිය. පුද්ගලික පිටපත් කිරීම් පුද්ගලයන් විසින් පෞද්ගලිකත්වයකින් යුතුව ඔවුන්ගේ නිවෙස්වල අහඹු ලෙස සිදුකරනු ලබයි. එමනිසා සමහර රටවල පෞද්ගලික භාවිතය සඳහා සරල ලෙස ව්‍යතිරේකයක් යටතේ අවසර දෙනු ලැබේ. පූර්ව අවසරයක් පැතීම අවශ්‍ය නොවේ. නමුත් එවැනි බොහෝ රටවල තම නිර්මාණවල පිටපත් ගැනීම වෙනුවෙන් කලාකරුවන්ට, ලේඛකයන්ට සහ සංගීතඥයින්ට ප්‍රතිපූර්ණය සඳහා අයබදු ගෙවීමේ ක්‍රමයක් පිහිටුවා ඇත. අයබදු ක්‍රමයක් අංග දෙකකින් සමන්විත වේ.

- **උපකරණ සහ මාධ්‍ය අයබදු** :- පිටපත් කිරීමේ සහ ෆැක්ස් යන්ත්‍රවල සිට සංගත තැටි සහ සංඛ්‍යාංක බහුවිධ තැටි යන්ත්‍ර, වීඩියෝ කැසට් රෙකෝඩර සහ පරිලෝකන යන්ත්‍ර කරා පරාසයක විහිදෙන සියලු වර්ගවල පටිගත කිරීමේ උපකරණවල මිලට ප්‍රතිරූපන අයිතිය සඳහා වන කඩඩා ගාස්තුවක් එකතු කරයි. සමහර රටවල් ජායා පිටපත් කඩදාසි, හිස් පටි, හෝ ෆ්ලැප් කාඩ් වැනි හිස් පටිගත කිරීමේ මාධ්‍ය සඳහා ද අයබදු යොදා ඇත.
- **ක්‍රියාකරු අයබදු** (Operator LEvy):- විශාල පරිමාණයෙන් ජායා පිටපත් ලබා ගන්නා පාසල්, විද්‍යා පීඨ, ආණ්ඩුවේ ආයතන, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, පුස්තකාල සහ ව්‍යාපාරයන් විසින් පරිශීලක ගාස්තු වක් ගෙවනු ලැබේ.

සාමාන්‍යයෙන් සාමූහික කළමනාකරණ සංවිධානයක් මගින් නිප්පාදකයන්ගෙන්, ආයතයකරුවන්ගෙන්, ක්‍රියාකරුවන්ගෙන් හෝ පරිශීලකයන්ගෙන් අයබදු එකතු කොට අදාළ හිමිකම් දරන්නන්ට ඒවා බෙදා හරිනු ලැබේ.



### බෙල්ජියම් උදාහරණය

බෙල්ජියමේ දී තමාට අයිති උපකරණවලින් (අයිති, කුලියට ගත් හෝ බද්දට ගත්) ආරක්ෂිත නිර්මාණවල පිටපත් ලබා ගන්නා ව්‍යාපාර ඒ සඳහා ගාස්තුවක් ගෙවිය යුතුය. එම ගාස්තුව ආරක්ෂිත නිර්මාණයෙන් ලබාගත් පිටපත් සංඛ්‍යාවට අනුරූප විය යුතුය. බෙල්ජියානු ප්‍රතිනිප්පාදන හිමිකම් සංවිධානය (REPROBEL) මෙම අයබදු එකතු කරන අතර ආදායම් නියමිත පරිදි බෙදා හරියි.

## තාක්ෂණික ආරක්ෂක උපක්‍රම (TPMs) වලින් ආරක්ෂිත නිර්මාණ ඔබට භාවිතා කළ හැකිද?

ව්‍යාපාර විසින් තාක්ෂණික ආරක්ෂක උපක්‍රම (TPMs) මගින් ආරක්ෂිත නිර්මාණ වාණිජමය භාවිතාවන් සඳහා යොදාගන්නා විට බොහෝ රටවල් වල නීතියෙන් තහනම් කර ඇති ක්‍රියාවක් වන එම **උපක්‍රම මගහැර යාමේ ක්‍රියාමාර්ග** (Circumvention) අවශ්‍ය වේ දැයි සැලකිලිමත්ව සොයා බැලිය යුතුය. බොහෝ රටවල්වල මෙම නීති කඩ කිරීම් පිළිබඳ වන වගකීම් ආරක්ෂිත නිර්මාණවල ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය කිරීම පිළිබඳ වගකීම් වලින් වෙනස් වේ. මෙයින් අදහස් වන්නේ උපක්‍රම මගහැර යාම (Circumvention) සඳහා අවසර ලැබුණත් ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය සඳහා වන සාමාන්‍ය නීති තව දුරටත් අදාළ වන බවයි. ඒ හේතුවෙන් නිර්මාණයේ කිනම් හෝ උපයෝජනයක් සඳහා අදාළ ප්‍රතිරූපන අයිතිය හිමිකරුගේ අවසරයක් අවශ්‍ය වේ.

තාක්ෂණික ආරක්ෂක උපක්‍රම මගහැරීම සිදුවිය හැකි ආකාරවලට උදාහරණ ලෙස ආරක්ෂිත අන්තර්ගතයන් අනවසරයෙන් භාවිතය සඳහා යමෙකුගේ සංඛ්‍යාංක හිමිකම් කළමනාකරණ පද්ධතිවල අනවසරයෙන් ඇතුළු වීම දැක්විය හැකිය. අනවසරයෙන් ප්‍රකාශිත අයිතිය සහිත නිර්මාණයක් විකේතකරණය (Decrypt) දැක්විය හැකිය. සමහර රටවල දේශීය නීති මගින් මගහැර යාමේ (Circumgention) ක්‍රියාමාර්ග නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනවා පමණක් නොව ඒ සඳහා වන ඕනෑම මූලික ක්‍රියාකාරකමක් හෝ මගහැරයාමේ උපකරණ (Circumvention equipment) ලබාගත හැකි ලෙස ක්‍රියා කිරීම ද නීති කඩ කිරීමක් ලෙස සලකයි.

## අන්‍යයන් සතුව හිමිකම් පවතින ආරක්ෂිත නිර්මාණ භාවිතයට අවසරය ඔබ ලබා ගන්නේ කෙසේද?

ප්‍රතිරූපන අයිතිය මගින් හෝ සම්බන්ධිත හිමිකම් මගින් සුරැකි නිර්මාණ භාවිතයට අවසර ලබාගත හැකි මූලික ක්‍රම දෙකක් තිබේන එනම් සාමූහික කළමනාකරණ සංවිධානයක සේවා භාවිතය හෝ සම්බන්ධ කරගත හැකි විස්තර පහසුවෙන් ලබාගත හැකි නම් ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් අයිතිකරු සමග සෘජුව සම්බන්ධ වීමය.

සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ පළමුවෙන්ම නිර්මාණය අදාළ සාමූහික කළමනාකරණ සංවිධානයේ භාණ්ඩාගාරයේ ලියාපදිංචි වී ඇති ද යන්න වන අතර එසේ නම් අවසර ලබා ගැනීමේ ක්‍රියා මාර්ගය වඩා සරල එකක් වේ. **සාමූහික කළමනාකරණ සංවිධාන** මගින් විවිධ අරමුණු සහ භාවිතයන් සඳහා විවිධ වර්ගවල අවසරයන් ලබා දෙයි. සමහර සාමූහික කළමනාකරණ සංවිධාන සංඛ්‍යාංක බලපත්‍ර ද ලබා දෙයි.

නිර්මාණයේ හෝ නිර්මාණවල ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් සාමූහික කළමනාකරණ සංවිධානයක් මගින් කළමනාකරණය නොකරන්නේ නම් ප්‍රතිරූපන අයිතිය හෝ සම්බන්ධිත හිමිකම් අයිතිකරු හෝ ඔහු / ඇය ගේ නියෝජිතයා සමඟ සෘජුවම සම්බන්ධ විය යුතුය. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ දැන්වීමේ නම් කර ඇති පුද්ගලයා මුල්ම ප්‍රතිරූපන අයිතිය හිමි පුද්ගලයා වුවද කල් ගත වත්ම ප්‍රතිරූපන අයිතියේ හෝ සම්බන්ධිත හිමිකම්වල ආර්ථික හිමිකම් වෙනත් පුද්ගලයෙකුට පැවරී තිබිය හැකිය. ඉන්දියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීමේ ක්‍රමයක් ඇති රටවල ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නාමාවලිය පිරික්සා බැලීමෙන් ප්‍රතිරූපන

අයිතියේ හෝ සම්බන්ධිත හිමිකම්වල වර්තමාන හිමිකරු හඳුනාගත හැකිය. ලිඛිත හෝ සංගීතමය නිර්මාණ සම්බන්ධයෙන් ගත් විට නිර්මාණය ප්‍රතිනිෂ්පාදනයට නිරන්තරයෙන් ම හිමිකම දරණ නිර්මාණයේ ප්‍රකාශක හෝ පටිගත කිරීම් නිෂ්පාදන සම්බන්ධ කරගත යුතුය.

නිර්මාණයක් සඳහා හිමිකම් "ස්ථර" (Layers) කිහිපයක් පැවතිය හැකි බැවින් එක් එක් හිමිකරුගේ අවසරය අවශ්‍ය අන්දමේ විවිධ හිමිකම් දරන්නන් කිහිප දෙනෙකු සිටිය හැකිය. උදාහරණයක් වශයෙන් සංගීත නිර්මාණයක් සඳහා ප්‍රකාශකයෙකු, සංගීත පටිගත කිරීම සඳහා පටිගත කිරීමේ සමාගමක් සහ නිරන්තරයෙන් ම සංගීත නිර්මාණය ඉදිරිපත් කරන්නන් (Performers) සිටී.

වැදගත් බලය පැවීම් සඳහා ඔබගේ අවසරය ඨමේ ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි සාකච්ඡා කොට නියම කර ගැනීමට පෙර විශේෂඥ උපදෙස් ලබාගැනීම සුදුසුය. බලපත්‍ර සැඨමේ දක්ෂ විශේෂඥයෙකුට ඔබගේ ව්‍යාපාර අවශ්‍යතාවලට ගැලපෙන හොඳම බලය පැවීමේ විසඳුම් සාකච්ඡා කොට නියම කර ගැනීමට උපකාරී විය හැකිය.



*ඔබට ප්‍රතිරූපන ආරක්ෂණය සහිත යම් කටයුත්තක් භාවිත කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා නීත්‍යානුකූල හිමිකරුගේ අවසරය ගත යුතුය. ගත් කතුවරුන් සාමාන්‍යයෙන් ආර්ථික ඵල නෙලා ගැනීම පිළිබඳ තම අයිතිය ප්‍රකාශකයන්ට හෝ සාමූහික කළමණාකරණ සංවිධාන(CMO) වෙත පවරනු දැකිය හැකිය.*

## ඔබගේ ව්‍යාපාරය නීති උල්ලංඝනය කිරීමේ අවදානම අඩුකර ගන්නේ කෙසේද?

ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය කිරීම සඳහා නීති මගින් කටයුතු කිරීම වියදම් අධික ක්‍රියාවලියක් විය හැකිය. එම නිසා එවැනි උල්ලංඝනය කිරීම් වළක්වා ගැනීමට සැලසුම් ක්‍රියාත්මක කිරීම ඥාණාන්විතය. පහත ක්‍රියා මාර්ග ඒ සඳහා සුදුසු වේ.

- ඔබගේ ආයතනය මගින් සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සේවයේදී සහ ක්‍රියාකාරකම් වලට සිදුවිය හැකි ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සංකූලතා පිළිබඳ දැනුවත් වීම සඳහා පුහුණුව ලබාදෙන්න.
- අවශ්‍ය අවස්ථාවල ලිඛිත අවසර දීම් හෝ ගිවිසුම් ලබාගෙන ඔබගේ කාර්ය මණ්ඩලය එවැනි අවසරදීම හෝ පවරා දීම් වල පරාසය පිළිබඳ හුරුවක් ඇති බවට සහතික වන්න.
- ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනයට භාවිතා කළ හැකි ආකාරයේ ඕනෑම උපකරණයක් (ඡායාපිටපත් යන්ත්‍ර, පරිගණක, සංගත තැටි හා සංඛ්‍යාංක බහුවිධ තැටි ලියනයන් ආදිය) මත එම උපකරණය ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනයට භාවිතා නොකළ යුතු බව දක්වෙන දැන්වීමක් දමන්න.
- ඔබගේ කාර්ය මණ්ඩලයට කාර්යාල පරිගණක භාවිතා කොට අවසරයකින් තොරව ප්‍රතිරූපන අයිතිය සහිත දේවල් අන්තර්ජාලයෙන් ලබා ගැනීමට පැහැදිලිවම තහනම් කරන්න.
- ඔබගේ ව්‍යාපාරය නිතර තාක්ෂණික ආරක්ෂක උපක්‍රම වලින් ආරක්ෂා කළ නිෂ්පාදන භාවිතා කරයි නම්, සේවකයන් ප්‍රතිරූපන අයිතිය හිමිකරුගේ අවසරයකින් තොරව එම උපක්‍රම මගහැර ක්‍රියා කිරීම (Circumvention) හෝ අවසරයේ පරාසය ඉක්මවා ක්‍රියා කිරීම යන ඒවා නොකරන බවට සහතික කරන ප්‍රතිපත්ති ගොඩ නගන්න.

සෑම ව්‍යාපාරයක් සතුවම ප්‍රතිරූපන අයිතිය සඳහා වන අනුකූලතාව සඳහා සවිස්තර ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර එම ව්‍යාපාරයට සහ භාවිතයන්ට විශේෂ වන ප්‍රතිරූපන අයිතිය පිළිබඳ අවසරයන් ලබාගැනීම පිළිබඳ සවිස්තර ක්‍රියාමාර්ගයක් එහි අඩංගු විය යුතුය. ප්‍රතිරූපන අයිතියට අනුකූලතාව දක්වන සංස්කෘතියක් ඔබගේ ව්‍යාපාරය තුළ ගොඩනැංවීම ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය සඳහා ඔබ සතු අවදානම අඩු කරයි.



## සාරාංශය

- **ඔබගේ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ආරක්ෂාව වැඩි කරගන්න.** ස්වේච්ඡාවෙන් ප්‍රතිරූපන අයිතිය පිළිබඳ ලියාපදිංචිය ලබාගත හැකි නම් ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳ කාර්යාලයක ඔබගේ නිර්මාණ ලියාපදිංචි කරන්න. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සටහනක් ඔබේ නිර්මාණ මත යොදන්න. සංඛ්‍යාංක නිර්මාණවල ආරක්ෂාව සඳහා සංඛ්‍යාංක හිමිකම් කළමනාකරණ මෙවලම් භාවිතාවේ යොදවන්න.
- **ප්‍රතිරූපන අයිතියේ හිමිකම නිවැරදි ව සොයා දැනගන්න.** ඔබගේ ආයතනය සඳහා කළ ඕනෑම නිර්මාණයක ප්‍රතිරූපන අයිතියේ හිමිකම පිළිබඳ ගැටළුවකට යොදා ගැනීම සඳහා සියලු සේවකයන්, නිදහස් කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් පුද්ගලයින් සමඟ ලිඛිත ගිවිසුම් තබා ගන්න.
- **හිමිකම් උල්ලංඝනයෙන් වළකින්න.** ඔබගේ නිෂ්පාදනයේ හෝ සේවාවේ ඔබගේ සමාගමට සම්පූර්ණයෙන් ම නවමු නොවූ යමක් අඩංගු වේ නම්, එය භාවිතය සඳහා අවසරයක් ලබාගත යුතුද යන්න සොයා බලා අවශ්‍ය නම් පූර්ව අනුමැතිය ලබා ගන්න.
- පුරුද්දක් ලෙස ඔබගේ **ප්‍රතිරූපන අයිතියෙන් ගත හැකි උපරිම ප්‍රයෝජනය ලබාගන්න.** ඔබගේ ප්‍රතිරූපන අයිතිය විකිණීම නොව ඒ සඳහා අවසර දීම කරන්න. අවසර ලාභියාගේ විශේෂිත අවශ්‍යතා සඳහා එක් එක් අවසරය සකසා ගැනීම සඳහා විශේෂිත සහ සීමා කරන ලද අවසරයන් පිරිනමන්න.

## 7. ප්‍රතිරූපන අයිතිය බලගැන්වීම

### ඔබගේ ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය වනුයේ කුමන අවස්ථාවලදීද?

ප්‍රතිරූපන අයිතිය හිමිකරුට තනිව කිරීමට හෝ තහනම් කිරීමට අවසරලත් ක්‍රියාකාරකමක වෙනත් කෙනෙක් ප්‍රතිරූපන අයිතිය හිමිකරුගේ පූර්ව අවසරයකින් තොරව යෙදුනු විට හිමිකරුගේ ප්‍රතිරූපන අයිතිය කඩකළ බව සහ ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය කළ බව කියනු ලැබේ.

යමෙක් පූර්ව අවසරයකින් තොරව.

- ඔබට පමණක් කිරීමට විශිෂ්ඨ හිමිකම් ඇති ක්‍රියාවක් කළ විට
- සමහර රටවල නීති උල්ලංඝනය කර, කළ නිර්මාණයක් සමඟ වාණිජමය ගනුදෙනුවක් කිරීමෙන් හෝ එය සෑදීමට අවශ්‍ය දේ සැපයීමෙන්
- සමහර රටවල නීති උල්ලංඝනය කළ නිර්මාණයක් (එය නීති ව්‍යතිරේකවලට නොවැටේ නම්) ආනයනය කිරීමෙන් හෝ සන්තකයේ තබා ගැනීමෙන්

**ආර්ථික හිමිකම්** උල්ලංඝනය විය හැකිය.

නිර්මාණයක කොටසක් පමණක් භාවිතා කළ විට පවා ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනයක් විය හැකිය. උල්ලංඝනය කිරීමක් ලෙස සාමාන්‍යයෙන් සිදුවන්නේ "සැලකිය යුතු **කොටසක්**" එනම් වැදගත්, අත්‍යවශ්‍ය හෝ විශේෂ කොටසක් **ප්‍රතිරූපන අයිතිය** හිමිකරුට සුවිශේෂ ලෙස වෙන් වූ ආකාර වලින් එක් ආකාරයකට භාවිතා කළ විටය. එමනිසා මෙහිදී **ප්‍රමාණාත්මකභාවය** සහ **ගුණාත්මකභාවය** යන දෙකම වැදගත් වේ. කෙසේ වෙතත් ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනයෙන් තොරව නිර්මාණයක කොපමණ ප්‍රමාණයක් භාවිතා කළ හැකිද යන්නට පොදුවේ පිළිගත හැකි නීතියක් නොමැත. ගැටළුව තීරණය කළ හැක්කේ එක් එක් සිද්ධිය මත පිහිටා වන අතර සෑම සිද්ධියකම සිදුවීම් සහ සත්‍ය තොරතුරු මත මෙය රඳා පවතී.

- කතෘ ලෙස නිර්මාණයට ඇති ඔබගේ දායකත්වය පිළිගනු ලබන්නේ නොමැති නම් හෝ
- ඔබගේ නිර්මාණය නොගැළපෙන අන්දමේ සැලකීමකට භාජනය වීම හෝ ඔබගේ ගෞරවයට හෝ කීර්තිනාමයට හානිවන සේ නවීකරණය කිරීම හෝ වූයේ නම්

**සදාචාරමය හිමිකම්** (Moral Rights) උල්ලංඝනය විය හැකිය.

ඔබගේ ප්‍රතිරූපන අයිතිය සහිත දේවල් ආරක්‍ෂා කිරීමට අනවසර පරිශීලකයන්ට එරෙහිව සකස් කළ **තාක්‍ෂණික ආරක්‍ෂන උපක්‍රම** මගහැර බේරීමට (circumvent) භාවිතා කළ හැකි ප්‍රයෝග පිළිබඳ වාණිජ ගනුදෙනු, ආනයනයන් හෝ නිර්මාණයන් යමෙකු කරන්නේ නම් එහි (ප්‍රතිරූපන අයිතිය හෝ නිදහස්) උල්ලංඝනයක් සිදුවිය හැකිය.

තවදුරටත් කිවහොත් යමෙක් ප්‍රතිරූපන අයිතිය සහිත නිර්මාණයකට ඔබ විසින් බද්ධ කොට ඇති හිමිකම් කළමනාකරණ තොරතුරු ඉවත් කිරීම හෝ වෙනස් කිරීම සිදුකලේ නම් එහි හිමිකම් උල්ලංඝනයක් විය හැකිය.



www.wipo.int/sme/

එක් තනි ක්‍රියාවක් මගින් බොහෝ හිමිකම් දරන්නන්ගේ හිමිකම් කඩවීම විය හැකිය. උදාහරණයක් ලෙස ගුවන් විදුලියෙන් ප්‍රචාරණය වූ වැඩසටහන් වල හඬ පටි විකිණීම ගුවන් විදුලි ප්‍රචාරණය සඳහා වූ හිමිකම් උල්ලංඝනය කිරීමකි. ඇත්ත වශයෙන් ම මෙම ක්‍රියාව සංගීත නිර්මාණකරුගේ සහ මුල් පටිගත කිරීම කළ පටිගත කිරීමේ සමාගමේ ප්‍රතිරූපන අයිතීන් ද උල්ලංඝනය කරනු ලබයි. සෑම හිමිකම් දරන්නෙකුටම වෙන් වෙන් නීති ක්‍රියාමාර්ග ගත හැකිය.

## ඔබගේ හිමිකම් කඩ කරනු ලැබ ඇති හෝ එසේ විය හැකි සේ පෙනේ නම් ඔබ කළ යුත්තේ කුමක්ද?

ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් බල ගැන්වීමේ දුෂ්කරතාවය ප්‍රධාන වශයෙන් ම හිමිකම් දරන්නා මත පැවරේ. ඔබගේ හිමිකම් වල කුමන ආකාරයක හෝ කඩවීමක් හඳුනා ගැනීම සහ ඔබගේ හිමිකම් බලගැන්වීම සඳහා කුමන පියවර ගත යුතුදැයි තීරණය කිරීම ඔබ සතුවේ. හිමිකම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග ගන්නේ නම් ඒවා මොනවාද, ඒවා කෙසේ කුමන අවස්ථාවේ ගත යුතුද සහ නීතිමය ක්‍රියා මාර්ගයකින් හෝ වෙනත් අයුරකින් එම ගැටළු විසඳා ගන්නේ කෙසේද යන ඒවා තීරණය කිරීමට ඔබට උපකාර වීම සහ දැනට පවතින ගතහැකි ක්‍රියාමාර්ග සහ තොරතුරු සැපයීම ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිඥයෙකු හෝ සමාගමකින් කරනු ඇත. ඔබගේ සමස්ථ ව්‍යාපාර ක්‍රමෝපායන්ට සහ අරමුණුවලට එවැනි තීරණ ගැලපේ දැයි සහතික කර ගන්න.

ඔබගේ ප්‍රතිරූපන අයිතිය උල්ලංඝනය වී ඇත්නම්, චෝදිත හිමිකම් උල්ලංඝනකරුට ලිපියක් යැවීම මගින් ඉදිරියේදී විය හැකි ගැටුමක් පිළිබඳ ඔහුට / ඇයට දැන්වීමෙන් ඔබට ආරම්භයක් ලබාගත හැකිය. මෙම ලිපිය ලිවීම සඳහා නීතිඥයකුගේ සහාය ලබා ගැනීම සුදුසුය. (මෙම ලිපිය "නැවැත්වීමේ සහ වැළැක්වීමේ ලිපිය ලෙස හඳුන්වයි.) සමහර රටවලදී, අන්තර්ජාලයේ ඇති ඔබගේ ප්‍රතිරූපන අයිතිය යමෙක් උල්ලංඝනය කර ඇත්නම් පහත ක්‍රියා මාර්ග ගත හැකිය.

- උල්ලංඝනයට ලක් වූ අන්තර්ගතය වෙබ් අඩවියෙන් ඉවත් කරන ලෙස හෝ එයට ප්‍රවේශ වීම අවහිර කරන ලෙස ඉල්ලමින් අන්තර්ජාල සේවා සපයන්නා වෙත විශේෂ නැවැත්වීමේ හා වැළැක්වීමේ ලිපියක් යැවීම.
- අන්තර්ජාල සේවා සපයන්නාට දැනුම් දීම මගින් මෙම චෝදිත හිමිකම් උල්ලංඝණය පිළිබඳ සේවා ග්‍රාහයකයන් දැනුවත් කර එමගින් අදාළ කරුණු සමථයකට පත්කර ගැනීමට පහසුකම් සැලසීම.

සමහරවිට **මධ්‍ය කරවීම** සුදුසුම උපාය මාර්ගය වේ. හිමිකම් උල්ලංඝණය කල පුද්ගලයා වෙත හිමිකම්පෑමේ නිවේදනයක් ඉදිරිපත් කිරීම ඔහුට සැඟවීමට හෝ සාක්ෂි විනාශ කිරීමට රුකුල් දීමක් වේ. හිමිකම් උල්ලංඝණය හිතාමතා කරන ලද බව ඔබ සලකයි නම් හා උල්ලංඝණ ක්‍රියාකාරකම් සිදුකල ස්ථානය ඔබ දන්නේ නම් අදාළ වූ චෝදිතයාට කිසිදු දැනුම් දීමකින් තොරව උසාවියට ගොස් චූදිතයාගේ පරිශ්‍රයෙහි හදිසි සෝදිසියකින් අදාළ සාක්ෂි අත්අඩංගුවට ගැනීමට ඉට සලසන ඒකපාර්ශවික නියෝගයක් (Ex parte) ඉල්ලා සිටීමට හැකිය.

උසාවි ක්‍රියාමාර්ගවලට සැලකිය යුතු කාලයක් ගතවේ. මෙම කාල සීමාව තුළ තවදුරටත් වන හානි වැළැක්වීමට චෝදිත හිමිකම් උල්ලංඝණය කිරීමේ ක්‍රියාව නවත්වා අදාළ භාණ්ඩ වෙළඳපොළට ඇතුළුවීම වළක්වන ක්ෂණික ක්‍රියාමාර්ගයක් ගත යුතුය.

බොහෝ රටවල නීතිය අවසන් උසාවි නියෝගය ලැබෙන තුරු චෝදිත උල්ලංඝණකරුට ඔහුගේ වංචාකාරී ක්‍රියාව නවත්වා අදාළ සාක්ෂි සුරක්ෂිතව තබන ලෙස නියෝග කෙරෙන තාවකාලික තහනමක් නිකුත් කිරීමට ඉඩ සලසයි.

හිමිකම් උල්ලංඝණය කළ පුද්ගලයෙකුට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වන්නේ

*1. නිර්මාණයේ ප්‍රතිරූපන අයිතිය ඔබ සතු බව ඔප්පු කිරීමට හැකිනම්*

*2. ඔබගේ හිමිකම් උල්ලංඝණය ඔප්පු කළ හැකිනම්*

*3. නීතිමය ක්‍රියාමාර්ගය සඵලවීමේ වටිනාකම අදාළ ක්‍රියාමාර්ගය ගැනීමට යන වියදමට වඩා වැඩිනම් පමණි.*

හිමිකම් උල්ලංඝණයකට වන්දි ගෙවීම සඳහා උසාවියක් මගින් දෙන පිළියම් අතර අලාභ, තහනම් කිරීම්, ලාභ සඳහා වගකියන ලෙස නියම කිරීම් සහ හිමිකම් උල්ලංඝණයට ලක්වූ භාණ්ඩ හිමිකම් දරන්නන් වෙත සැපයීමට නියම කිරීම ආදිය ඇතුළත් වේ. තවද හිමිකම් උල්ලංඝණය කෙරූ පුද්ගලයාට අදාළ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීමට සම්බන්ධවූ තෙවන පාර්ශවය සහ බෙදා හැරීමේ මාර්ග හෙළි කිරීම සඳහා බලකරනු ලබයි. තවද ඉල්ලීමක් මත හිමිකම් උල්ලංඝණයට ලක් වූ භාණ්ඩ වන්දි ගෙවීමකින් තොරව විනාශ කිරීම සඳහා අණ කිරීමට උසාවියට හැකිය.

ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය මගින් හිමිකම් උල්ලංඝණයට ලක්කල නිර්මාණ සෑදීම හා වාණිජමය ලෙස ගණුදෙනු කිරීම සඳහා **සාපරාධී වගකීමක්** පවරයි. හිමිකම් උල්ලංඝණය කිරීමට දඩුවම දඩයක් හෝ සිරගතවීමක් පවා විය හැකිය.

අනවසරයෙන් උපුටා ගත් නිර්මාණ ආනයනය වැළැක්වීම සඳහා දේශීය රේගු අධිකාරීන්ගේ සහය පැතිය යුතුය.

බොහෝ රටවල් සුදුසු ලෙස සීමා බලගැන්වීමේ උපක්‍රම යොදා ඇති අතර එමගින් ප්‍රතිරූපන අයිතියේ හිමිකරුවන්ට සහ අවසරලාභීන්ට අනවසර උපුටා ගැනීම් යැයි සැක සහිත හෝ ව්‍යාජ භාණ්ඩ රඳවා ගැනීමේ නියෝගයක් ඉල්ලා සිටිය හැකිය.

## ප්‍රතිරූපන අයිතිය උල්ලංඝණය කිරීම සමථයකට පත්කර ගැනීම සඳහා උසාවියකට යෑම හැර ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

බොහෝ අවස්ථාවල උල්ලංඝණය කිරීම් සමග ගණුදෙනු කරනා ඵලදායි ආකාරයක් වන්නේ **බේරුම්කරණය** (Arbitration) හෝ **සමථකරණයයි** (Mediation) බේරුම්කරණයේ වාසිය වන්නේ උසාවි ක්‍රියාමාර්ගවලට වඩා විධිමත්භාවය අඩුවීම, කෙටි සහ ලාභදායී මාර්ගයක් වීම වන අතර අන්තර්ජාතික ලෙස බේරුම්කරුවකු විසින් කරන පහසුවෙන් බලගැන්විය හැකි වීමයි. බේරුම්කරණය හා සමථකරණය යන දෙකෙහිම ඇති වාසියක් වනුයේ ආරවුල් නිරාකරණය කරගැනීමේ ක්‍රියාවලියේ පාලනය අදාළ පාර්ශව සතුවීමයි. ඒ නිසාම ඔබගේ සමාගම අනාගතයේදී නව අවසර ගැනීම් පටිපාටිවලට ඒමට හෝ සහයෝගයෙන් ක්‍රියා කිරීමට කැමති අනෙක් ව්‍යාපාරයක් සමග ඇති යහපත් ව්‍යාපාරික සබඳතා තහවුරු කරගැනීමට හැකිය. අවසර දීමේ ගිවිසුම් වල සමථ කරන සහ/හෝ බේරුම්කරණ වගන්ති ඇතුළු කිරීම සාමාන්‍යයෙන් සුදුසු ක්‍රියාමාර්ගයකි. වැඩිදුර තොරතුරු සඳහා WIPO හි බේරුම්කරණ හා සමථකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවියට පිවිසීමට arbiter.wipo.int/center/index.html වෙබ් ලිපිනය භාවිතා කරන්න.

ඇමුණුම I

## වැදගත් අන්තර්ජාල ලිපින

ලෝක බුද්ධිමය දේපල සංවිධානය: *www.wipo.int*

කුඩා සහ මධ්‍ය පිමාණ ව්‍යාපාර සඳහා WIPO ශාඛාව: *www.wipo.int/sme/en/*

ප්‍රතිරූපන අයිතිය සහ සම්බන්ධිත හිමිකම් සඳහා වන WIPO වෙබ් අඩවිය : *www.wipo.int/copyright/en/index.html*

බලගැන්වීම පිළිබඳව WIPO වෙබ් අඩවිය : *www.wipo.int/enforcement/en/index.html*

WIPO ඉලෙක්ට්‍රොනික පොත්හලෙන් ප්‍රතිරූපන මිලට ගැනීමට : *www.wipo.int/ebookshop*. මෙහි පහත ඒවා ඇතුලත් වේ:
– ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම්වල අයිතිය පැවරීම සඳහා වන මාර්ගෝපදේශය. ප්‍රතිරූපන අංක 897
– ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් සඳහා සාමූහික කළමණාකරණය. ප්‍රතිරූපන අංක 855

නොමිලේ දෙන ප්‍රතිරූපන ලබාගැනීමට : *www.wipo.int/publications*. මෙහි පහත ඒවා ඇතුලත් වේ:
– ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් තේරුම් ගැනීම. ප්‍රතිරූපන අංක 909

– කලාකරුගේ සිට ප්‍රේක්පකාගාරයට නිර්මාණ ශිල්පින් සහ පාරිභෝගිකයින් ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් සහ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ සාමූහික කළමණාකරණ පද්ධති වලින් ප්‍රයෝජන ලබන්නේ කෙසේද? ප්‍රතිරූපන අංක 922

– පිටපත්කරණය සඳහා වන සාමූහික පරිපාලනයත ප්‍රතිරූපන අංක 924
ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳව නාමාවලිය: *www.wipo.int/news/en/links/addresses/cr/index.htm*

## ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන

යාන්ත්‍රික පටිගත කිරීම් සහ ප්‍රතිනිප්පාදන හිමිකම් පාරිපාලනය කරන සංගම් වල ජාත්‍යන්තර මණ්ඩලය : *www.biem.org*
ව්‍යාපාර මෘදුකාංග සන්ධානය : *www.bsa.org*

## ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන

යාන්ත්‍රික පටිගත කිරීම් සහ ප්‍රතිනිෂ්පාදන හිමිකම් පාරිපාලනය කරන සංගම් වල ජාත්‍යන්තර මණ්ඩලය : *www.biem.org*

ව්‍යාපාර මෘදුකාංග සන්ධානය : *www.bsa.org*

කතෘන් සහ රචකයින්ගේ සංගම්වල ජාත්‍යන්තර සංවිධාන : *www.cisac.org*

චිත්‍රපට නිෂ්පාදකයින්ගේ සංගම් වල ජාත්‍යන්තර සංගමය : *www.fiapf.org*

ප්‍රතිනිෂ්පාදන හිමිකම් සන්ධාන වල ජාත්‍යන්තර සංවිධානය : *www.ifrro.org*

ශබ්දවාහිණී තැටි කර්මාන්තයේ ජාත්‍යන්තර සංවිධානය : *www.ifpi.org*

ස්වාධීන සංගීත සමාගම් එකමුතු: *www.impalasite.org*

ජාත්‍යන්තර ප්‍රකාශකයන්ගේ සංගමයේ : *www.ipa-uie.org*

මෘදුකාංග හා තොරතුරු කර්මාන්ත සංගමය : *www.siia.net*

ඇමුණුම I

## ජාතික ප්‍රතිරූපන අයිතිය පරිපාලන ආයතනවල වෙබ් ලිපින

| | |
|---|---|
| ඇල්ජීරියාව | *www.onda@wissal.dz* |
| ඇන්ටෝරාව | *www.ompa.ad* |
| ආර්ජෙන්ටිනාව | *www2.jus.gov.ar/minjus/ssjyal/autor* |
| ඕස්ට්‍රේලියාව | *www.ag.gov.au* |
| බාබදෝස් | *www.caipo.gov.bb* |
| බෙල්රුස් | *vkudashov@belpatent.gin.by* |
| | *ncip@belpatent.gin.by* |
| බෙලීස් | *www.belipo/bz* |
| බොස්නියාව හා හර්සගොවිනියාව | *www.bih.nat.ba/zsmp* |
| බ්‍රසීලය | *www.minc.gov.br* |
| කැනඩාව | *cipo.gc.ca* |
| චීනය | *www.info.gov.hk/ipd* |
| කොලොම්බියාව | *www.derautor.gov.co* |
| ක්‍රොයේෂියාව | *www.dziv.hr* |
| චෙස් ජනරජය | *www.mkcr.cz* |
| ඩෙන්මාර්කය | *www.kum.dk* |
| එල් සැල්වදෝරය | *www.cnr.gob.sv* |
| ෆින්ලන්තය | *www.minedu.fi* |
| ජෝර්ජියාව | *www.global-erty.net/saqpatenti* |
| ජර්මනිය | *www.bmj.bund.de* |
| හන්ගේරියාව | *www.hpo.hu* |
| අයිස්ලන්තය | *www.ministryofeducation.is* |
| ඉන්දියාව | *copyright.gov.in* |

යාවත්කාලීන තොරතුරු සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න. : *www.wipo.int/directory*

| | |
|---|---|
| ඉන්දුනීසියාව | *www.dgip.go.id* |
| අයර්ලන්තය | *www.entemp.ie* |
| කිර්කිස්තානය | *www.kyrgyzpatent.kg* |
| ලැට්වියාව | *www.km.gov.lv* |
| ලෙබනනය | *www.economy.gov.lb* |
| ලිතුඑනියාව | *www.muza.lt* |
| ලක්සැම්බර්ගය | *www.etat.lu/EC* |
| මලයාසියාව | *mipc.gov.my* |
| මෙක්සිකෝව | *www.sep.gob.mx/wb2/sep/sep_459_indautor* |
| මොනාකෝව | *www.european-patent-* office.org/patlib/country/monaco/ |
| මොන්ගෝලියාව | *www.ipom.mn* |
| නවසීලන්තය | *www.med.govt.nz* |
| නයිගර් | *www.bnda.ne.wipo.net* |
| නොර්වේ | *www.dep.no/kd/* |
| පේරු | *www.indecopi.gob.pe* |
| පිලිපීනය | *ipophil.gov.ph* |
| කොරියානු ජනරජය | *www.mct.go.kr/english* |
| රුසියානු සමූහාණ්ඩුව | *www.rupto.ru* |
| සිංගප්පූරුව | *www.gov.sg/minlaw/ipos* |
| | *www.ipos.gov.sg/* |
| ස්ලොවේකියාව | *www.culture.gov.sk* |
| ස්ලොවේනියාව | *www.sipo.mzt.si/* |
| ස්පාඤ්ඤය | *www.mcu.es/Propiedad_Intelectual/indice.htm* |
| ස්විට්සර්ලන්තය | *www.ige.ch* |
| තායිලන්තය | *www.ipthailand.org* |
| තුර්කිය | *www.kultur.gov.tr* |
| යුක්රේනය | *www.sdip.gov.ua* |
| | *www.uacrr.kiev.ua* |
| එක්සත් රාජධානිය | *www.patent.gov.uk* |
| ඇමෙරිකා එක්සත් ජනපදය | *www.loc.gov/copyright* |

යාවත්කාලීන තොරතුරු සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න. : *www.wipo.int/directory*

ඇමුණුම III

## ප්‍රතිරූපන අයිතිය හා සම්බන්ධිත හිමිකම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන අන්තර්ජාතික ගිවිසුම්වල සාරාංශය

### සාහිත්‍ය හා සෞන්දර්යමය නිර්මාණ ආරක්ෂාව සඳහා වූ බර්න් ගිවිසුම (1886)

බර්න් ගිවිසුම අන්තර්ජාතික ප්‍රතිරූපන අයිතිය පිළිබඳව ප්‍රධාන ගිවිසුම වේ. මෙයින් පිහිටුවනු ලැබූ නිතියක් වන "දේශීය සැලකීම" යන්නෙන් සෑම රටකටම විදේශීය කතෘන් හට දේශීය කතෘන් භුක්ති විඳින හිමිකම් වලට සමාන හිමිකම් අයිති බව දැක්වේ. මෙම සමුළුව දැනට රටවල් 162 ක ක්‍රියාත්මක වේ. මෙම ගිවිසුමට සම්බන්ධිත පාර්ශව හා සම්පූර්ණ විස්තර www.wipo.int/treaties/en/ip/berne/index.html වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය. .

### ඉදිරිපත් කරන්නන් (Performer) ශබ්දවාහිනි තැටි නිෂ්පාදකයින් සහ ගුවන් විදුලි ප්‍රචාරණ සමාගම්වල ආරක්ෂාව සඳහා වූ අන්තර්ජාතික ගිවිසුම (රෝම ගිවිසුම) (1961)

රෝම ගිවිසුම තම ආරක්පාව Neighboring rights නම් හිමිකම් තෙක් විහිදුවයි. ගීත නැටුම් ඉදිරිපත් කරන්නන් තම ඉදිරිපත් කිරීම් සඳහා වූ හිමිකම්ද, ශබ්දවාහිණි තැටි නිපදවන්නන් තම ශබ්ද පටිගත කිරීම සඳහාද, රේඩියෝ හා රූපවාහිණි ආයතන තමන් ප්‍රචාරණය කරන වැඩසටහන් සඳහාද වන හිමිකම් භුක්ති විඳී මෙහි සාමාජික දැනට රටවල් 83 ක් ලබා ඇත. මෙම සමුළුවට සම්බන්ධිත පාර්ශව සහ සම්පූර්ණ විස්තර *www.wipo.int/treaties/en/ip/rome/index.html යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.*

### ශබ්දවාහිණි තැටිවල අනවසර පිටපත් සෑදීමට එරෙහි ශබ්දවාහිණි තැටි නිෂ්පාදකයින්ගේ ආරක්ෂාව සඳහා වන ගිවිසුම (ශබ්දවාහිණි තැටි ගිවිසුම) (1971)

ශබ්දවාහිණි තැටි ගිවිසුම මගින් එම ගිවිසුමට බැඳුන රාජ්‍යයක වැසියෙකු වන ශබ්දවාහිණි තැටි නිෂ්පාදකයෙකුව, තම නිෂ්පාදන ජනතාවට බෙදා හැරීම පිණිස අවසරයකින් තොරව පිටපත් කිරීම, පිටපත් ආනයනය සහ එවැනි පිටපත් ජනතාවට බෙදාහැරීම යන ඒවායින් ආරක්පා කිරීම සඳහා ගිවිසුමට සම්බන්ධ සෑම රාජ්‍යයකටම කළයුතු දේ සුදානම් කරයි. "ශබ්දවාහිණි (Phonogram) යනුවෙන් අදහස් වන්නේ එහි ආකාරය කුමක් වුවත් (තැටි, පටි හෝ වෙනත් ආකාර) විශේෂයෙන්ම ඇසීමට සම්බන්ධ තිර කිරීම් වේ. (එනම් මේවාට චිත්‍රපටයක් හෝ වීඩියෝ පටියක හට සටහන් අයත් නොවේ.) මේ ගිවිසුම දැනට රටවල් 75 බල පැවැත්වේ. ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන් සහ සම්පූර්ණ විස්තර *www.wipo.int/treaties/en/ip/phonograms/index.html වෙබ් අඩවියේ අඩංගු වේ.*

## බුද්ධිමය දේපල හිමිකම්හි වෙළඳාමට සම්බන්ධ පාර්ශව පිළිබඳ එකඟතා ගිවිසුම (1994)

බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ ඵලදායි සහ ප්‍රමාණවත් ආරක්ෂාව සමඟ අන්තර්ජාතික වෙළඳාම එකට එකමුතු කිරීම අරමුණු කොට වෙළඳාම හා සබැඳි බුද්ධිමය දේපල හිමිකම් වල අදාලත්වය, පරාසය හා භාවිතය පිළිබඳ මූලධර්ම සහ සුදුසු සම්මතයන් සහිත නියෝග නිවැරදි සේ සකස් කරගැනීමට මෙම ගිවිසුම කෙටුම්පත් කෙරිණි. ඒ හා සමඟම මෙම ගිවිසුම එවැනි හිමිකම් බලගැන්වීමේ ආකාර සපයයි. ලෝක වෙළඳ සංවිධානයේ සියලු සාමාජිකයින් 149 දෙනාම මෙම ගිවිසුමෙන් බැඳේ. මෙහි විස්තර ලෝක වෙළඳ සංවිධානයේ වෙබ් අඩවිය වන *http://www.wto.org/english/docs_e/legal_e/27-trips.doc* වෙත පිවිස ලබා ගත හැකිය.

## ප්‍රතිරූපන අයිතිය පිළිබඳව උෂජධ ගිවිසුම සහ ඉදිරිපත් කිරීම් හා ශබ්දවාහිණි තැටි පිළිබඳ WIPO ගිවිසුම (1996)

මෙම ගිවිසුම් දෙක 1996 දී ඇතිකර ගනු ලැබුවේ සංඛ්‍යාංක ලෝකයේ (Digital World) පහළ වීමත් සමඟ ඇති වූ අභියෝගයන්ට සරිලන සේ කතෘන්ගේ, ඉදිරිපත් කරන්නන්ගේ (Performer) සහ ශබ්දවාහිණි තැටි නිපදවන්නන්ගේ හිමිකම් ආරක්ෂාව සලසා ගැනීමටය. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ WIPO ගිවිසුම තොරතුරු සමාජයේ (Information Society) නව අවශ්‍යතාවලට ගැලපෙන සේ තම කොන්දේසි සකසා ගනිමින් සාහිත්‍යමය සහ සෞන්දර්‍යාත්මකව නිර්මාණවල ආරක්ෂාව සඳහා වන බර්න් ගිවිසුමට සහය දෙයි. මෙයින් අදහස් කරන්නේ ප්‍රථමයෙන්ම බර්න් ගිවිසුමේ වන සියලු නියෝග විස්තර කරනු ලැබ ඇති තැන් වලට අදාලව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (mutatis mutandis) සංඛ්‍යාංක පිසරය (Digital Engironment) සඳහා භාවිතා කල හැකි බවයි. එයින් අදහස් වන තවත් දෙයක් වන්නේ බර්න් ගිවිසුමට සම්බන්ධව වුවත් නැතත් ප්‍රතිරූපන අයිතිය පිළිබඳ WIPO ගිවිසුමට බැඳී ඇති පාර්ශව ගිවිසුමේ ස්වාධීන නියමයන්ට එකඟ විය යුතු බවයි. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ WIPO ගිවිසුම, විශිෂ්ඨ හිමිකම් 03 ක් සැපයීමෙන් තම නිර්මාණ සඳහා කතෘන් සතු හිමිකම් වැඩිදියුණු කරයි. එම විශිෂ්ඨ හිමිකම් වනුයෙ:

- මුල් නිර්මාණ හෝ ඒවායේ පිටපත් අලෙවියෙන් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රසිද්ධියේ බෙදා හැරීම සඳහා අවසරය දීමට හෝ තහනම් කිරීමට ඇති හිමිකමයි. (බෙදාහැරීමේ හිමිකම);
- පරිගණක වැඩසටහන්, සිනමා නිර්මාණ හෝ ශබ්දවාහිණි තැටිවල අන්තර්ගත නිර්මාණ වාණිජමය වශයෙන් කුලියට දීම සඳහා (මෙවැනි වාණිජමය වශයෙන් කුලියට ඵම විශාල පරිමාණයෙන් නිර්මාණ පිටපත් කර ප්‍රතිනිෂ්පාදනය සඳහා වන හිමිකම්වලට බොහෝ සෙයින් හානි කරයි නම්) අවසර දීමට හෝ තහනම් කිරීමට ඇති හිමිකම (කුලියට දීම සඳහා වන හිමිකම)
- තමා විසින් පුද්ගලිකව තෝරා ගත් වේලාවක හෝ ස්ථානයක සිට නිර්මාණ වලට පිවිසීමට හැකි ආකාරයකට නිර්මාණ ජනතාවට ලබා ගතහැකි බවට පත්කිරීමටද (Making Agailable) ඇතුළුව රැහැන් සහිත හෝ රැහැන් රහිත ආකාරයකින් තම මුල් නිර්මාණ හෝ ඒවායේ පිටපත් ජනතාවට සන්නිවේදනය කිරීම සඳහා අවසර දීමට හෝ තහනම් කිරීමට ඇති හිමිකම (ජනතාවට සන්නිවේදනයට ඇති හිමිකම)

ප්‍රතිරූපන අයිතිය පිලිබඳව උපජඩ ගිවිසුම බලාත්මක වූයේ 2002 මාර්තු 02 වැනිදා වූ අතර වර්තමානයේ රාජ්‍යයන් 59 ක් එහි සාමාජිකයින් වී ඇත. (*www.wipo.int/treaties/en/ip/wct/index.html හි බලන්න.*).

ප්‍රතිරූපන අයිතිය පිලිබඳ WIPO ගිවිසුමට වෙනස් ආකාරයකින් ක්‍රියාකරන ඉදිරිපත් කිරීම් හා ශබ්දවාහිණී තැටි පිලිබඳව WIPO ගිවිසුමේ අරමුණ තොරතුරු සමාජයක සිටින ඉදිරිපත් කරන්නන් සහ ශබ්දවාහිණී තැටි නිෂ්පාදකයින්ගේ ආරක්පාව ජාත්‍යන්තර වශයෙන් එක් තලයක ගෙන ඒම නිසා එය ගණුදෙනු කරන්නේ සම්බන්ධිත හිමිකම් දරන්නන් සමඟය. කෙසේ වෙතත් මෙය ශ්‍රව්‍යදෘශ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා නොයෙදේ. ශබ්දවාහිණී තැටිවල පටිගතවී ඇති හෝ නොමැති තම ඉදිරිපත් කිරීම් සඳහා ඉදිරිපත්කරන්නන් (නළුවන්, ගායකයින්, සංගීතඥයින් වැනි) සතු ආර්ථික හිමිකම් හා පෞද්ගලිකත්වය පිලිබඳ හිමිකම් මෙම ගිවිසුම මගින් ප්‍රධාන වශයෙන් ආරක්පා කරයි. හට තිර කිරීම සඳහා මූලික පියවර ගන්නා සහ ඒ සඳහා වගකීම දරණ පුද්ගලයින්ට හෝ නෛතික භාවයන්ටද මෙම ගිවිසුම ආධාර කරයි. ඉදිරිපත් කිරීම් හා ශබ්දවාහිණී තැටි පිලිබඳ ගිවිසුම මගින් හිමිකම් දරන්නන්ට පහත විශිෂ්ඨ හිමිකම් ලබාදේ:

- ශබ්දවාහිණී තැටි ඍජු ලෙස හෝ වක්‍රව ප්‍රතිනිෂ්පාදනයට අවසර දීම හෝ තහනම් කිරීම සඳහා වන හිමිකම් (ප්‍රතිනිෂ්පාදනය සඳහා හිමිකම);
- අලෙවියකින් හෝ වෙනත් ක්‍රමයකින් අයිතිය පැවරීමකින් ශබ්දවාහිණී තැටියක මුල් පිටපත හෝ අනු පිටපත් ජනතාවට ලබා ගත හැකි බවට පත්කිරීමට (Making Agailable) අවසර දීම හෝ තහනම් කිරීම සඳහා වන හිමිකම (බෙදාහැරීමේ හිමිකම);
- ශබ්දවාහිණී තැටියක මුල් පිටපත හෝ අනු පිටපත ජනතාවට වාණිජමය වශයෙන් කුලියට දීමට අවසරදීම හෝ තහනම් කිරීමට ඇති හිමිකම (කුලියට දීමේ හිමිකම)
- තමා විසින් පුද්ගලිකව තෝරාගත් වේලාවක හෝ ස්ථානයක සිට තිර කරන ලද ඉදිරිපත් කිරීමකට ප්‍රවේශ වීමට ජනතාවට හැකි ආකාරයකට, රූහැන් සහිත හෝ රූහැන් රහිත ක්‍රමයකින් ශබ්දවාහිණී තැටියක තිර කරන ලද ඉදිරිපත් කිරීමක් (Performance) ජනතාවට ලබාගත හැකි තත්ත්වයට පත්කිරීමට (Making Agailable) අවසර ධම හෝ තහනම් කිරීම සඳහා වන හිමිකම (ලබාගත හැකි තත්ත්වයට පත්කිරීමේ හිමිකම).

ඉදිරිපත් කිරීම හා ශබ්දවාහිණී තැටි පිලිබඳ WIPO ගිවිසුම ශබ්දවාහිණී තැටිවල තිර නොකරන ලද සජීවී ඉදිරිපත් කිරීම් සඳහාද ඉදිරිපත් කරන්නන් වෙත විශිෂ්ඨ හිමිකම් ලබාදීම් එමගින්.:

- ජනතාව වෙත ගුවන් විදුලි ප්‍රචාරණයට;
- ජනතාවට සන්නිවේදනයට
- තිර කිරීමට (ශබ්දය පමණි) අවසර ලබාදෙයි.

මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 2002 මැයි 20 සිටය. රාජ්‍යයන් 58 ක් දැනට සාමාජිකත්වය දරයි. (*www.wipo.int/treaties/en/ip/wppt/index.html වෙත පිවිසෙන්න.*).

## අන්තර්ජාල අපරාධ පිළිබඳ ගිවිසුම (2001)

යුරෝපීය කවුන්සිලය මගින් කෙටුම්පත් කල අන්තර්ජාල අපරාධ පිළිබඳ ගිවිසුම, අන්තර්ජාල අපරාධවලට එරෙහිව සමාජයේ ආරක්පාවට ඉලක්ක කල, පොදු අපරාධ පිළිබඳ ප්‍රතිපත්තියක් විදහා දක්වයි. මේ අන්තර්ජාලය හා අනෙකුත් පරිගණක ජාල කරන අපරාධ පිළිබඳ ප්‍රථම අන්තර්ජාතික ගිවිසුම වන අතර විශේපයෙන්ම ප්‍රතිරූපන අයිතිය පිළිබඳ උල්ලංඝණ, පරිගණකආශ්‍රිත වංචාවන්, ළමා අපචාර හා ජාල ආරක්පාව කට කිරීම් ආදී ය සමහ ගණුදෙනු කරයි. පරිගණකජාල පරික්පා කිරීම සහ නවත්වාලීම වැනි බලතල සහ ක්‍රියාමාර්ග ශ්‍රේණියක් එහි අඩංගුය. සම්පූර්ණ විස්තර conventions*.coe.int/Treaty/en/Treaties/Html/185.htm* මගින් කියවිය හැකිය. .

## ප්‍රතිරූපන අයිතියේ විධානය (2001)

තොරතුරු සමාජයක ප්‍රතිරූපන අයිතියේ සහ සම්බන්ධිත හිමිකම්වල සමහර පැති එකමුතු කිරීම සඳහා වන යුරෝපීය ප්‍රජාවේ විධානය සමහර ප්‍රධාන වර්ගයේ හිමිකම් එකට එකතු කරන්නේ මූලික වශයෙන් අන්තර්ජාලයේ සහ විද්‍යුත් වෙළඳාමේ සහ සංඛ්‍යාංක තාක්පණයේ අභියෝගයන්ට මුහණ දීමටය. හිමිකම් කළමණාකරණ පද්ධතිවල තාක්පණික අංශයන් සඳහා වන නීතිමය ආරක්පාවන් සහ හිමිකම් වල ව්‍යතිරේඛයන් සමහද මෙය ගණුදෙනු කරයි.

## සාහිත්‍යය සහ සෞන්දර්යාත්මක නිර්මාණවල ආරක්ෂාව සඳහා වන බර්න් ගිවිසුමේ පාර්ශ්වයන් වන රටවල ලැයිස්තුව (2006 ජූනි 16 දින ප්‍රකාශිත අන්දමට)

ඇල්බේනියාව
ඇල්ජේරියාව
ඇන්ඩෝරාව
ඇන්ටිගුවා සහ බර්බයුඩාව
ආර්ජෙන්ටිනාව
ආර්මේනියාව
ඕස්ට්‍රේලියාව
ඕස්ට්‍රියාව
අසර්බයිජානය
බාහාමාස් රාජ්‍යය
බහරේනය
බංග්ලාදේශය
බාර්බඩෝස්
බෙලරුසය
බෙල්ජියම
බෙලීස්
බෙනින්
භූතානය
බොලිවියාව
බොස්නියාව සහ
හර්ස්ගොවිනියාව
බොට්ස්වානාව
බ්‍රසීලය
බෲනායි දෙරුසලම්
බල්ගේරියාව
බකිනා ෆාසෝ
කැමරූනය
කැනඩාව
කේප්වඩ්
මධ්‍යම අප්‍රිකානු ජනරජය
චාඩ්
චිලී
චීනය
කොලොම්බියාව
කොමරෝස්
කොන්ගෝව
කොස්ඩ ිකා
Cote d'loire
ක්‍රොයේෂියාව
කියුබාව
සයිප්‍රසය
චෙස් ජනරජය
කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී
ජනතා ජනරජය
කොන්ගෝව
ඩෙන්මාර්කය
ජිබූටි
ඩොමිනිකාව
ඩොමිනිකන් ජනරජය
ඉක්වදෝරය
ඊජිප්තුව
එල් සැල්වදොරය
සමක ගිනියාව
එස්ටෝනියාව
ෆිජි
ෆින්ලන්තය
ප්‍රංශය
ගේබොන්
ගැම්බියාව
ජෝර්ජියාව
ජර්මනිය
ගානාව
ග්‍රීසිය
ග්‍රෙනාඩා
ගෝතමාලාව
ගිනියාව
ගිනිබිසව් රාජ්‍යය
ගුයානාව
හයිටි
හෝලි සී
හොංඩුරාස්
හංගේරියාව
අයිස්ලන්තය
ඉන්දියාව
ඉන්දුනීසියාව
අයර්ලන්තය
ඊශ්‍රායලය
ඉතාලිය
ජැමෙයිකාව
ජපානය
ජෝර්දානය

කසකස්තානය
කෙන්යාව
කිරිගිස්තානය
ලුතුවේනියාව
ලෙබනනය
ලෙසෙතෝ
ලිබේයාව
ලිබියානු ආරාබි ජමහිරියාව
ලෙච්ටෙන්ස්ටින්
ලිතුවේනියාව
ලුක්සැම්බර්ක්
මැඩගස්කරය
මලාවි
මලයාසියාව
මලි
මල්ඩා
මිඩානියා
මිටියුස්
මෙක්සිකෝව
මයික්‍රොනේසියා
මොනාකෝව
මොංගෝලියාව
මොරොක්කෝව
නම්බියාව
නේපාලය
නෙදර්ලන්තය
නවසීලන්තය
නිකරුගුආ
නයිගර්
නයිජීරියාව
නොර්වේ
ඕමානය
පකිස්තානය
පනමාව
පරගුඑයි
පේරු
පිලිපීනය
පෝලන්තය
පෘතුගාලය
කටාර්
කෝියානු ජනරජය
මොල්ඩෝවා ජනරජය
රුමේනියාව
රුසියානු සමූහාණ්ඩුව
රුවැන්ඩා
සානත් කිට්සාහන් නේවිස්
ශාන්ත ලුසියා
සාන්ත වින්සන්ට් සහ
ග්‍රැනඩයින්ස්
සෞදි ආරබිය
සමොවා
සෙනගාලය
සර්බියාව සහ
මොන්ටෙන්නේග්‍රෝව
සිංගප්පූරුව
ස්ලොවේකියාව
ස්ලොවේනියාව
දකුණු අප්‍රිකාව
ස්පාඤ්ඤය
ශ්‍රී ලංකාව
සූඩානය
සුරිනේම්
ස්වාසිලන්තය
ස්වීඩනය
ස්විට්සර්ලන්තය
සිරියානු අරාබි ජනරජය
ටජිකිස්තානය
තායිලන්තය
මැසිඩෝනියාවේ පැරණි
යුගොස්ලෝගියානු ජනරජය
ටොගෝව
ටොංගාව
ට්‍රිනිඩෑඩය සහ ටොබැගෝව
ටුනිපියාව
තුර්කිය
යුක්රේනය
එක්සත් අරාබි එමිල් රාජ්‍යය
එක්සත් රාජධානිය
ටැන්සානියානු එක්සත්
ජනරජය
ඇමෙරිකා එක්සත් ජනපදය
උරුගුඑයි
උස්බෙගිස්තානය
වෙනිසියුලාව
වියට්නාමය
සැම්බියාව
සිම්බාබ්වේ

(එකතුව 162)

නවතම තොරතුරු සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න: *www.wipo.int/treaties/en/ip/berne*

බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) විසින් නිකුත් කරනු ලැබ ඇති ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල පිළිබඳ සියළුම ප්‍රකාශන www.wipo.int/sme/en/ යන වෙබ් අඩවියෙන් ද සුළු හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසාය අංශයේ විද්‍යුත් සගරාව www.wipo.int/sme/en/documents/wipo_sme_newsletter.html යන වෙබ් අඩවියෙන් ද කිසිදු අය කිරීමකින් තොරව ලබා ගත හැකිය.

## වැඩි දුර විස්තර සඳහා


ලිපිනය :
බුද්ධිමය දේපල පිළිබඳ ලොක සංවිධානය
නොː 34, වෙමින් ඩෙස් කොලොම්බෙට්ස්
තැ.පෙ. 18
සී එච්-1211 ජිනීවා 20
ස්විට්සර්ලන්තය

දුරකථනː
+41 22 338 91 11

ෆැක්ස් :
+41 22 733 54 28

විද්‍යුත් තැපැලː
wipo.mail@wipo.int


## නිව්යෝක් හි පිහිටි සම්බන්ධීකරණය කිරීමේ කාර්යාලය


ලිපිනයː
2, යුනයිටඩ් නේෂන් ප්ලාසා
සුයිට් 2525
නිව්යෝක්, එන් වයි 10017
ඇමරිකා එක්සත් ජනපදය

දුරකථනː
+1 212 963 6813

ෆැක්ස් :
+1 212 963 4801

විද්‍යුත් තැපැලː
wipo@un.org


හෝ එහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය


ලිපිනයː
නොː 34, වෙමින් ඩෙස් කොලොම්බෙට්ස්
තැ.පෙ. 18
සී එච්-1211 ජිනීවා 20
ස්විට්සර්ලන්තය

ෆැක්ස්:
+41 22 338 87 60

විද්‍යුත් තැපැලː
sme@wipo.int

වෙබ් අඩවියː
www.wipo.int/sme


## සිංහල පරිවර්තනය පිළිබඳ වැඩිදුර තොරතුරු හෝ ඇණවුම් කිරීම සඳහා


SMED Sri Lanka
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය
නො. 53, වොක්පෝල් පටුමග
කොළඹ 02
ශ්‍රී ලංකාව

දුරකථනː
+94 11 230 4287-9

ෆැක්ස් :
+94 11 230 4291

විද්‍යුත් තැපැලː
projsmed@slt.lk



User Guide
WIPO Publication No.918 SK /SI (Sinhala)
ISBN 978-92-805-2084-2
ප්‍රථම මුද්‍රණය